©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

# 1 කොටස

කියාරා මැඩම් ... මැඩම්ගේ තැන්ද නැති වෙලා කියල කෝල් එකක් ආවා.. බොඩි එක තියලා තියෙන්නේ colombo වල මල්ශාලාවක කියල කීවා..

හ්ම්... හවසට යන්න වාහනයක් රෙඩි කරන්න... ආ නෙහාරා... අලුත් වාහනෙ රෙඩි කරන්න.. සාරාට කියන්න ඊයේ ආව ඇඳුම් වල සුදු ඇඳුමක් බලල තියන්න කියල...

මන් කියාරා... යාරා කොස්මැටික්ස් කියන්නෙ මගේ කම්පැනි එක... ලංකාවෙ ලාබාලතම ව්‍යාපාරිකයන් 5 දෙනා ඇතුලේ මන් ඉන්නවා...
මන් මේ තැනට එන්න ගොඩාක් මහන්සි උනා... සාර්ථක ව්‍යාපාරිකාවක් නිසාම මගේ වටේට හතුරෝ ගොඩාක් ඉන්නවා.. හැබැයි මන් මේ කියන්න යන්නෙ ඒ ගැන නම් නෙවෙ.. මගේම කියල ඉන්න හතුරෝ ගැන ....

************************

මගේ සුඛෝපභෝගී රථයේ නැගලා මන් ආවෙ කොලඹ ප්‍රධාන පෙලෙ මල් ශාලාවකට...

නැන්දා.. මගේ අහිංසක අම්මාගේ නපුරුම නපුරු අක්කා.. එයා තමා නැති වෙලා හිටියේ... එයාගෙ ලොකු දුව ටෙහාරා.. හෙවි මෙකප් එකකුත් දාගෙන නෙට් වලින් හදලා තියෙන විනිවිද පේන ඇඳුමක් ඇඳලා හිටියේ හරියට මගුල් ගෙදරක ඇවිල්ලා වගේ.. එයාගේ අම්මා නැතිවෙලා ඉද්දිත් එයා නිකන් ටිශූ කැල්ලක් අතේ තියන් ඇස් දෙක පිහ පිහ හිටියා.. එච්චරයි

ඔන්න දැන් තමා යුද්දේ පටන් ගන්නෙ.. ඇත්තටම කීවොත් මන් මෙහෙ ආවෙ මලගෙදරටම නෙවෙ.. මාව දැකලා ටෙහාරාගෙයි , එයාගෙ නංගිගෙයි මූනු ඇද වෙලා යනවා බලන්න...

මාව දැකපු ටෙහාරා ඉක්මනට මන් ගාවට ආවෙ ඇස් දෙක නලලේ තියන්..

" කියාරා.. මට කියන්න නම් එපා මේක chanel 22/23 ඩ්‍රෙස් එකක් කියල... "
ඇත්තටම ටෙහාරා ඇඳන් හිටියේ ලංකාව ඇතුලේ තිබ්බ ප්‍රසිද්ද සන්නාමයක ඇඳුමක්.. ඒ උනාට මන් ඇඳන් හිටියේ ලෝකේම ප්‍රසිද්ද ලේසියෙන් කෙනෙක්ට ගන්න බැරි සන්නාමයක ඇඳුමක්..

මන් කීවෙ.. ඔන්න ඕක තමාවෙන්නෙ..

" ඔෆ් කෝස් ටෙහාරා.. වෙන මොකක්ද?? මේ ඒ collection එකෙ එකක් තමා "

මන් එහෙම කියල මගේ හැන්ඩ් බෑග් එක එයාට හොදට පේන විදිහට තියාගෙන , එකෙ ඇතුලේ තිබ්බ මගේ ෆෝන් එක ගත්තෙ ඩ්‍රයිවර්ට කෝල් එකක් අරන් මල් වඩම ගේන්න කියන්න..

"එතකොට.. මේ.. මේ බෑග් එක... " ටෙහාරගෙ ඇස් උඩ ගිහින් ...

" ඇයි බෑග් එකට මොකද වෙලා තියෙන්නෙ.. "

" මේක hermes එකක්ද???"

" ඔ ගෝඩ් ටෙහාරා ... ඔයාට මොකද මෙ වෙලා තියෙන්නෙ... ඔයාට මෙවා දැක්කම brand එක අදුරගන්නවත් බැරිද ??? " මන් එහෙම නක්කලේට කියද්දි නම් ටෙහාරාට තරහ ගියා..

" නෑ මට පුලුවන්.. එ උනාට මගේ ඇදුම් ඇදපු ,අපේ ඉදුල් කාපු එකී මෙවගේ එවා පාවිච්චි කරද්දි , එවා ඇත්ත එවාද , high copy ද කියල කවුද දන්නෙ .. " ටෙහාරා එහෙම කිවෙ ටිකක් සද්දේට හිනා වෙලා..

හරිනම් ඒක ඇහුවමම මට මලපනින්න ඕනේ.. ඒ ඉස්සර .. දැන් මන් ගොඩක් වෙනස්...

" ඕ මට කරන්න පුළුවන් දේවල් ඔයා දන්නෙ නැ නේද??" එහෙම කියපු මන් ගත්තේ එකම එක කෝල් එකක් විතරයි..

" Excuse me miss ටෙහාරා .. we are extremly sorry .. මිස්ලට මේ බොඩිඑක දැන්ම මෙහෙන් අයින් කරගන්න වෙනවා... " එතනට ආපු මල්ශාලාවෙ වැඩ කරන කෙනෙක් ටෙහාරාට කිවේ මන් කට කොනෙන් හිනාවෙද්දි ..

" මොකක්?? තමුසෙලාට පිස්සුද ? අපි දවස් දෙකකට ඔනෙ කරන ගාන ගෙවලා තියෙන්නෙ.. එහෙම තියෙද්දි මමාගෙ බොඩි එක ගන්න කියන්නෙ.. " ටෙහාරා පරල වෙලා කෑගැහුවා..

ඒ සද්දෙට අනික් අයත් වට වෙද්දි මෙහෙ director කෙනෙක් එතනට ආවා..

" Really sorry miss ටෙහාරා.. , මේක ඉහලින් ආව ඕර්ඩර් එකක් , අපි මිස්ලාගෙ පෙමන්ට් එක මේ දැන්ම රිෆන්ඩ් කරන්නම් , ඒක නිසා දැන්ම මේ බොඩ් එකයි , මල් ටිකයි අයින් කරගන්න .. "

" මොනවද මනුස්සයො කියන්නේ.. කවුද ඉහලින් ඕර්ඩර් දෙන්න ඉන්න කෙනා.. තමුසේ දන්නවද අපි කාගේ කවුද කියල ආඅ... "
ටෙහාරා ඒ ගමන අර මනුස්සයගෙ කොලර් එකෙන් ඇදගෙන බෙරිහන් දෙනව...

ඒ උනාට එයාට වැඩි වෙලා නටන්න උනේ නෑ.. හැඩිදැඩි සිකියුරිටි ගාඩ්ලා 7,8 ක් විතර එක පාරටම ඇවිල්ලා , මලගෙදරට ඇවිල්ලා හිටිය ගෙස්ට්ලා ඔක්කොම අයින් කරලා.. පෙට්ටිය වහලා මල්වඩම් ටිකත් එක්කම මල්ශාලාවෙන් එලියට දැම්මා.. ඒ ටික වෙන්න විනාඩි 5ක් වත් ගියේ නෑ ඇත්තටම , අපි ඔක්කොම හිටියේ එලියේ..

තාම ටෙහාරගේ බෙරිහන් දීම ඉවර නෑ .. ඇවිල්ලා හිටපු අය මේ විකාර දිහා බලන් ඉන්න බැරිකමට ඉක්මනට එයාලගේ වාහන් වලට නැගලා ගියා...

ඒ අස්සෙ ටෙහාරගෙ නංගි , ජනොද්‍යා එහෙට මෙහෙට කෝල් කර කර මිනිය තියන්න තැනක් හොයනවා.. ඒ උනාට ඒකත් හරි යන්නෙ නැති පාටයි ..

බැරිම තැන මාමා කනත්තට කතා කරල මිනියෙ අවසන් කටයුතු කරන්න හැදුවත් කිසිම කනත්තකින් , ආදාහනාගාරයකින් හොද පිලිතුරක් හම්බෙලා නෑ..

දැන් මන් මෙතෙන ඉදලා වැඩක් නෑ... මන් කෝල් එකක් ගත්තේ ඩයිවර්ට... විනාඩියකින් විතර මගේ කකුල ගාව්ම මගේ වාහනේ නැවිත්තුවේ.. තක්කුමුක්කු වෙලා ඉන්න අර තුන්කට්ටුව ආයෙ පුදුම කරවලා...

වාහනේට නගින්න කලින් ටෙහාරා ලගට ගියපු මන් කිවේ මෙන්න මෙච්චරයි .
" දැක්කනෙ මට කරන්න පුලුවන් දේවල් "

එහෙම කියපු මන් වාහනේ නැගලා ආවා...

## 2 කොටස

අතීත කතාව....

" කියාරා... කියාරෝඕ......"

මන් උඩ ගියේ ඒ සද්දේට ...

ඒ තරම් හයියයි නැන්දගේ කටේ සද්දේ... නැන්ද කුකුලත් අතෙන් අරන් මොකද මෙහෙ...

" එනවා නැන්ද... "
" ආපෝ කියාරා දැන්ද නැගිට්ටෙ.. උ..බව ඔහොම කුනු කෙල පිටින් දැකලා අපේ දවසම මූසල වෙයි ඉතින් දැන්"

එයාලට නෙවේ මූසල මට කියල කියන්න තිබ්බානෙ මට... ඒවා හිතෙන්නෙ දැන් තමා ඒ දවස් වල හිටියේ අහිංසක කියාරානෙ..

" ඊයේ රෑ වෙනකන් නැගිටලා හිටියනෙ නැන්ද ඒකයි "
" යසයි, උබ බුදියන් ඉන්න වෙලෙ තරකද අපෙ දිහාට ඇවිල්ලා ටිකක් උදව් කරොත්... එහෙන් ඉදුල් එහෙම කන්න හොදයි උබලට උදව් කරන්න නාවට"

හිනා වෙවී එහෙම කියපු නැන්ද එයාගෙ වට්නා ලුන්ගිය එහෙට මෙහෙට කරල හදගත්තේ අපිට පෙන්න වෙන්න ඇති...

අපෙ අම්මා නම් කියන්නෙ , ඒ නැන්දගෙ හැටි කියල .. එයා ඔය නැන්ද කියන ඇනුම්පද ගනන් ගන්නෙ නැනෙ..

" ඒක නෙවෙ කියාරා රිසල්ට් ඇවිල්ලනෙ උබ දන්නවද ඒක ... කොහෙ දැනගන්නද උබල... කියපන්කො නම්බරේ මෙකෙන් බලාගන්න "
නැන්ද එයාගේ අලුත්ම ස්මාට්පොන් එක අරන් මගේ දිහාවට හැරුනා...

දෙය්යනෙ.. රිසල්ට් ඇවිල්ලද ?? කොහෙද ඉතින් ඒක දැනගන්න ටිවී එකකවත් ෆෝන් එකකවත් අපිට නැනෙ...

" කියපන් නම්බරේ.. උබ ඒකත් අමතක කරාද ? හ්.. හා.. ඔව් ඉතින් උබල ඉගෙනගෙන රට අල්ලන්නද ... උබ ෆෙල් ඇති මගේ හිතේ.. කමක් නෑ ඒක සුවර් කරගන්න එක හොදයිනේ.."

ඇයි ඇත්තටම ඕවාට හොද දෙකක් කියන්න තරම්වත් මට බැරි උනේ.. කියන හැම බලු කතාවක්ම මන් ඒදවස් වල අහන් හිටියෙ....

" අපේ ජනෝද්‍යා නම් උඩින්ම පාස් , එයා බයෝ කරන්න ඉන්නෙ.. කුසුමා නංගි දන්නවනෙ , අපෙ ජයේගෙ අක්කාගෙ පුතත් ඩොක්ටර් කෙනෙක්නෙ දැන්.." මන් index no එක හොයන්න කාමරේට එද්දි නැන්ද පුරසාරම් කියවනවා මන් අහගෙන...

" මෙන්න නැන්දේ නම්බරේ"

" මොනවා.... මේක වෙන්නෙ කොහොමද ? ආයේ හරියට බලලා නම්බරේ කියපන් කියාරෝ... උබේ ඇසුත් පොට්ට වෙලාද ඒ ගමන..."

මන් ආයේ නම්බරේ කිවා..

" ට්‍රිං.. ට්‍රි..." අම්මගේ පොඩි නොකියා පොන් එක රින්ග්ස් ගියා...

"හෙලෝ..... ඔව් ඉන්නවා..."

බබා.. මෙන්න සූපිපි දූව කතා කරනවා...

" ඔව් සූපූ කියන්න.... "
"......"
" ඔව් ඔව් ඒක තමා...."
"....."
" අනේ.. දෙය්යනේ.. උබ ඔය කියන්නෙ ඇත්තමද???
අනෙ සූපූ.. ඇත්තමද ??? "
"......"
අනේ හරි කෙල්ලේ... ඔව් මන් හෙට එන්නම්.. අනෙ තැන්ක් යූ කෙල්ලේ... උබටත් congratulations"...

" දෙය්යනේ මට 9As අනේ දෙය්යනේ..."

රිසල්ට් බලලා නැන්දගේ මූණ කලු උනේ ඇයි කියල මට හිතාගන්න පුලුවන්...

" උබ... මාරයිනේ කියාරෝම.. උබ ජනූ ට වඩා රිසල්ට් අරන්නෙ.. කපටි අම්මන්ඩි ඒ කාලේ ජනූ ජනූ ගගා ඇවිත් මගේ කෙල්ලගේ නොට් එහෙම අරන් එන්න ඇති... "
එහෙම කියපු නැන්ද ගස්සගෙන ගියේ මට තව තව බැනගෙන...

අනේ මන්ද පුදුම ඉරිසියාවක්නේ ඒක.. ඔය රිසල්ට් සිද්දෙයෙන් පස්සෙ නැන්දලා අපි එක්ක කතා කලේ නෑ..
ජනොදෘයි මමයි දෙන්නම කලේ බයෝ...
ඒ උනාට මට මෙඩිසින් යන්න තරම් රිසල්ට් උනේ නෑ...
ජනොදෘනම් යාපනෙ මෙඩිකල් ෆැකල්ටියට තෙරුනා..

ඒ වෙද්දි ටෙහාරා.. ජයවර්ධන පුරින් මැනෙජ්මන්ට් ඩිග්‍රියක් අරන් අවුට් වෙලා හිටියේ....
එයා ඩොක්ටර්ටත් එහා හිටියේ පුදුම ලොකු කමක්.. එයා කැම්පස් එකෙන්ම ලොකු සල්ලිකාරයෙක් හොයන් හිටියේ.. ලොකු වෙඩින් එකක් ගත්තා.. ඒත් අපිට කීවේ නෑ...

නැන්ද අපිත් එක්ක කතා නොකලට.. අපි ගැන හැම්දේම හෙව්වා.. එක එක කතා ගමේ මිනිස්සු එක්ක එකතුවෙලා මට කීවා.. සමහර කතා නිසා මට පාරේ යන්නත් තරම් ලැජ්ජා හිතුන ...

මන් තෙරුනේ.. රුහුණ කැම්පස් එකට.. එකෙ වැඩිය ලමයි කරන්නෙ නැති internationally පිලිගත්ත ඩිග්‍රි එකක් තමා මන් කරේ...

අපේ ගෙවල් වල ඉදන් මාතරට මාරම දුරයී.. ඒකටත් නැන්ද කියල තිබ්බා.. කැම්පස් කියල කොහේ හරි අගුපිලක රස්සාවක් කරනවා ඇති.. ඔහොම ඩිග්‍රියක් ගැන අහලවත් නෑ කියල...

මට ඔනේ උනේ.. නමට ඉස්සරහින් කොහොම හරි ඩොක්ටර් කියන එකදගන්න.......

## 3 කොටස

ටෙහාරා මනුස්සයගේ සල්ලි වලින් රගන්න ගත්තේ අදක ඊයේක ඉදලා නෙවෙ.. බදින්න කලින් ඉදන්ම... ලොකු ලොකු කාර් වලින් නැන්දලා දිහාට යද්දි එයා ඒ කාර් එක ස්ලොව් කරන් තමා අපේ ගේ හරියෙන් යන්නෙ..

මෙ අතරේ මන් මගේ පලවෙනි ඩිග්‍රි එක සම්පූර්ණ කරේ පලමු පන්තියේ සමාර්ථයක් එක්ක.. ඒ වෙද්දි අපෙ අම්මා කඩේට වැඩට යනව... තාත්තා සිකුරිටි කෙනෙක්...

මන් කැම්පස් යන කාලේ අනික් ළමයි වගෙ විච්චූර්ණ දේවල් වලට වියදම් කරේ නෑ .. කන්න බොන්න විතරයි මට ගෙදරින් දෙන සල්ලි ඇති උනේ...

මන් කැම්පස් ඉද්දි අපෙ මල්ලි ඒ ලෙවල් කරල ගෙදර හිටියේ එයා බාස්කට් බෝල් වලට මාරම දක්ෂයි...

ඕක තමා ඉතින් මගේ කතාව... දැන් මම විශ්වවිද්‍යාලයක ලෙක්චර් කෙනෙක් , ඒ වගේම මටම කියලා කොස්මැටික් ලයින් එකක් තියෙනවා...

යාරා කොස්මැටික්ස් මගේ ව්‍යාපාරය කියල නැන්දවත් එයාගෙ දුවල දෙන්නවත් දැනන් හිටියේ නෑ... මන් හිතන්නෙ තාම දන්නෙත් නෑ... අවුරුදු ගානකට පස්සෙ එයාලව මට හම්බුනේ අපේ නෑ කෙනෙක්ගේ වෙඩින් එක දවසෙදී.... ඒ මීට මාස 6 කට විතර කලින්...

පුංචිගේ පුතාගේ වෙඩින් එකට මන් ඇන්දේ LV ඩ්‍රෙස් එකක් swarovski diamond වලින් වර්ක් කරල තිබ්බ කරාබු දෙකකුයි , අත්පලදනාවකුයි විතරයි.. ලංකාවෙ ප්‍රසිද්ධම සැලොන් එකකින් තමා මගේ මෙකප් එක මන් දගත්තේ... නැන්දලා ඕකට එනවා කියල දැනගත්ත නිසාම තමා මන් එහෙම ලැස්ති උනේ... මන් තව දුරටත් උන් කියන එක අහන් ඉන්න කියාරා නෙවෙ කියල පෙන්නනත් මට ඕනේ උනා...

" අනෙ.. කියාරා අක්කි ... ඔයාගෙ ලස්සන බලන්නකො.." මනමාලි මන් දැක්ක ගමන් කෑගැහුවා.. ඒක ඇහුන ජනොද්‍යා එක පාරම කැරකිලා මන් දිහා බැලුවේ මාව අඳුරගන්න බැරි උන පාරට ...

" අනේ නංගි අද ඔයා තමා මෙතන ලස්සනම " මන් මනමාලිව හග් කරද්දි නැන්දත් එතනට ඇවිල්ලා ඉන්නවා මන් දැක්කා..

අපේ පවුලේ සිරිතක් තමා කාගේ හරි වෙඩින් එකක් තිබ්බම නෑදෑයො තෑගි දෙන්නෙ අන්තිමට , මනමාලි හරි මනමාලයා හරි අපි ඉස්සරහම ඒවා කඩලත් බලනවා.. ඒක නිකන් නත්තලට තෑගි දෙනවා වගේ වැඩක්...

ඉතින් මන් මනමාල ජෝඩුවට ගෙනාවෙ යතුරක්... ඇත්තටම කීවොත් මන් එයාලගෙ වෙඩින් ගිෆ්ට් එක විදිහට දෙන්නෙ ටොයොටා වර්ගයේ කාර් එකක්..

මුලින් තැග්ග මනමාලයගේ අතේ තිබ්බෙ ටෙහාරා.. ඒක ලංකාවේ සමාන්‍ය නිමි ඇඳුම් වෙලඳසැලක 20,000 වච්චරක්...

ඒක ටෙහාරගේ හැටියක් , තමන් කොච්චර හොඳට ඇන්ද පැලැන්ද උනත් අනික් අයට දෙයක් දෙන්නෙ ඇගෙන් ඇටයක් යනවා වගෙ..

ජනෝද්‍යා දුන්නෙ ගෑස් කුකර් එකක් ,.. දැන් මගේ නැග්ග දෙන වෙලාව... මන් කාර් එකෙ යතුර දාපු පුංචි පෙට්ටිය මල්ලිගෙ අතට දෙද්දි නැන්ද ටිකක් හය්යෙන් කෑස්සෙ මට නෝන්ඩියට වගේ... මල්ලි හිමීට ඒ බොක්ස් එක ඇරලා කෑගහගෙන නැගිට්ටෙ මාවත් බදාගෙන...

" අනෙ, අක්කෙ.. මෙච්චර ලොකු දෙයක්.. අනේ දෙය්යනෙ අක්කෙ ... "
එයාට කතා කරන්න වචනවත් එන්නෙ නෑ.. නංගිත් මාගේ අතක් බදාගෙන කඳුලු පිරිච්ච ඇස් දෙකෙක් බලන් ඉන්නවා...

පුංචිත් ලගට ඇවිල්ලා මාව බදාගෙන හිටියා.. මන් දන්නවා දැන් නැන්දගේ ඇස් වලට කටු අනිනවා වගේ කියලා... ඒයාගෙ කටට ඉතින් තැනක් නොතැනක් නැනෙ...

" ශිරානි... මොකද්ද මේ විගඩම.. අපෙ කෙල්ලොත් ලොකු ලොකු තෑගි දුන්නෙ.. උබලගේ මූනේ හිනා පොදක් තිබ්බද??? "

" අනෙ මේ නැන්දේ ඔයා කියන්නෙ කියාරා අක්කා මට ගිෆ්ට් එක විදිහට කාර් එකක් දුන්නම නිකන් බලන් ඉන්න කියලද ??? " මල්ලි එහෙම කියද්දි නැන්දගේ ඇස් උඩගියපු විදිහට මන් හිතුවේ එයාට පපුවේ අමාරුවක් ඇවිල්ලා ඇති කියලා...

**************************

මනාල ජෝඩුව පිටත් උනේ ඒ කාර් එකෙන්මයි . එයාලා රෙන්ට් එකට අරන් තිබ්බ කාර් එක මන් කලින්ම ප්ලෑන් කරල මාරු කරවල තිබ්බෙ..

ඉතින් දැන් හෝටලේ ඉතිරි උනේ නෑදැයො ටික විතරයි .. අපේ ලොකු මාමාට ඔනේ උනෙ , අපිවයි නැන්දලාවයි සාමදාන කරන්න.. මන් ඒකට ලොකු කැමැත්තක් නැති උනත් නැන්දලා ඒකට අකමැත්තක් පෙන්නෙනුවෙ නෑ.. ඒ මගේ සල්ලි නිසා කියල මන් දන්නවා...

මොකද මන් මොකද කරන්නෙ ,, මගේ අලගිය මුලගිය තැන් වල විස්තරත් නැන්දා අනික් අයගෙන් අහන් දැන්ගෙන තමා ඒ වෙද්දිත් හිටියේ..

ඊට මාස 3කට විතර පස්සෙ තමා හොදම සිද්දිය උනෙ....

# 4 කොටස

මාස 3කට කලින් මගේ කොලඹ තියෙන ශොප් එකට ටෙහාරයි නැන්දයි ආවා.. ඒ වෙලාවෙ මන් එහෙට ගිහින් හිටියේ මීටින් එකකට..

මගේ ශොප් එක තට්ටු 3ක ලොකු බිල්ඩින් එකක්, ලොකු පාරකින් එකක් එක්කම තමා එතන මට ඔනේ විදිහට හදලා ගත්තේ...

විදුලි සෝපාන වගේම, විදුලි පඩිපෙලවල් වලින් තමා ඒකෙ එහෙට මෙහාට යන්න තිබ්බේ.. ඒ තරම් මගේ ප්‍රදාන බිල්ඩින් එක ලොකුයි.. ඒකේ උඩම තට්ටුවේ තිබ්බෙ මගේ ඔෆිස් එක ..

මන් ආසම බිලියනර් කෙනෙක් උන කයිලි ජෙනර්ගේ ඔෆිස් එකේ තිම් එක ඉන්ස්පයර් කරන් තමා ඔෆිස් එක හැදුවේ.. කලු සුදු අලු කියන පාට විතරක් පාවිච්චි කරල තිබ්බ නිසාම මාරම පෙනුමක් ඇවිල්ලා තිබ්බා...

පහලම තට්ටුව යාරා කොස්මැටික්ස් වලටම වෙන් වෙලා තිබ්බා.. ඊට අමතරම යාරා බ්‍රෑන්ඩ් එකෙම විවිද පලදනා, ස්වර්ණාබරණ තිබ්බෙත් මේ තට්ටුවෙමයි..

ඒ වගේම පහලම තට්ටුවේ වෙන් උන කොටසක යාරා රෙස්ටොරන්ට් එකත් තිබ්බා.. දෙවනි තට්ටුවෙ තිබ්බෙ යාරා සැලොන් එක ...

යාරා කොස්මැටික් සාමාන්‍ය අයටත් දරාගන්න පුලුවන් මිල ගනන් වල තිබ්බිට සැලොන් එකයි රෙස්ටොරන්ට් එකයි අති සුඛොපභෝගී විදිහට තමා හදලා තිබ්බේ.. ඇත්තටම සමාන්‍ය කෙනෙක්ට දරාගන්න පුලුවන් මට්ටමේ මිලගනන් නෙවෙ ඒ දෙකෙ තිබ්බෙ ..

ඉතින් මන් මීටින් එක ඉවර වෙලා යද්දි මගේ කොස්මැටික් කලෙක්ශන් එකෙ අඩුපාඩු ගන්න මන් ශොප් එකට ආවා.. එතකකොටයි මන් නැන්දවයි ටෙහාරවයි දැක්කෙ..

ටෙහාරා මන් දැක්ක ගමන් ලගට ආවා..
" ආ කියාරා.. තමු..සෙත් පාවිච්චි කරන්නේ මෙවාද?? "
මන් යාරා ප්‍රිමියම් කලෙක්ශන් එක අතට ගද්දිම එයා ඇහුවා..

සාමාන්‍යෙන් ප්‍රිමියම් කලෙක්ශන් එක පැක් එකක් විදිහට තමා එන්නෙ.. එකෙ මිල 50000 උඩට තමා පටන් ගන්නෙ.. මන් මේ අතේ තියන් හිටිය ගොල්ඩ් කලෙක්ශන් එක ඇත්තටම හදන්නෙ කැරට් 22 රත්‍රන් පාවිච්චි කරල.. ඒක නිසා ඒක 100000 ක් විතර වෙනවා..

" ඔව් ඉතින් ඇයි ??? ඔයා ගොල්ඩ් එක නෙවෙද යූස් කරන්නෙ?? ? " මන් ඒක අහද්දි එයා කලබලෙන් මගේ අතෙ තිබ්බ පැක් එක ගත්තා..

" නෑ ඒක තමා පාවිච්චි කරන්නේ.. අපරාදේ යාරා කලෙක්ශන් එකෙ මීටවඩා ගාන වැඩි කරන්න තිබ්බෙ එතකොට හැමොටම ගන්න බැනෙ.. "
එහෙම කියපු ටෙහාරා ඒක එයාගේ කූඩෙට දගත්තා..

" ඒක නෙවෙ කියාරා.. ඔයා දන්නවද දන්නෙ නෑ මගේ හබී වර්ක් කරන්නෙත් මේ යාරා කම්පනි වෙන් එකෙමයි.. ඒක නිසා යාරා ප්‍රඩක්ට් නම් මට නතින් අනේ.."

අනේ ඉතින් මන් මොකො නොදන්නෙ ඒක ගැන.. එයාගේ හස්බන්ඩ් වැඩ කරන්නෙ මගෙ කම්පැනි එකෙ කියල නොදන්න කෙනෙක් මෙහෙ ඉන්න විදිහක් නෑ මොකද ඒ තරමටම ටෙහාරා ඒක පතුර පතුර යනව...

ඒක නෙවෙ කියාරා ඔයා අපිට ට්‍රීට් එකවත් දෙන්නෙ නැද්ද ?? යන්කො අපි මෙකෙ රෙස්ටොරන්ට් එකට "
නැන්දූ ඒ අස්සෙ බටර් ගානව...

යන් .. මන් එහෙම කියද්දි අර දෙන්නා මූනෙන් මූණ බලාගත්තා මන් දැක්කා.. එයාලා හිතන්න ඇති මන් බෑ කියයි කියල...

# 5 කොටස

රෙස්ටොරන් එකට ගිහින් මේ දෙන්නා වාඩි උනේ නිකන් හැමදම කන්න එන අය වගේ....

" එහෙනම් කියාරා අපි ඕර්ඩර් කරන්නද "
ටෙහාරා ඇහැව්වෙ මගේ හොඳට දත ගලවන්න බලාගෙන
" ඔෆ් කෝස් , ඕර්ඩර් කරන්න" මන් නොසැලකිල්ලෙන් කීවෙ ෆෝන් එක දිහා බලාගෙන....

අම්මයි දුවයි ජීවිතයට කටේවත් තියලා නැති ලක්සරි කෑම හොයනවා.... අද තමයි මේ දෙන්නා මගේ හැටි දැනගන්නේ...

එයාලා මාළු බිත්තර( caviar) වලින් හදපු කෑම එකකුයි.. අමු මාළු සලාදයකුයි ඕඩර් කරා.... එවාගේ ගාන ලක්ශ 2 පන්නනවා....

එවා කලින් කාලා නැති අයට කන්න ටිකක් අමාරුයී.. කමක් නෑ තියෙන පණ්ඩිත කමනේ...

කෑම ටික විනාඩි 10ක් විතර යද්දි ආවා... අම්මටයි දුවටයි ඕනෙ උනේ කනවටත් වඩා බිල ගැන දැනගන්න..

මේකේ බිල් එක කීයද කියලා දැනගන්න පුලුවන්ද ??? ටෙහාරා විනීතව ඇහුවත් වේටර් එයාගේ ඔලුවේ ඉදන් දෙපතුලට එනකන් බැලුවේ අමුතු විදිහට...

මොකද මේ රෙස්ටොරන්ට් එකට එන මිනිස්සු කවදාවත් ගාන අහ අහ කන අය නෙවෙ.. එයාලට වැදගත් කෑමෙ quality එක මිසක් ගාන නෙවෙ.. අඩුම තරමේ මේකේ වැඩ කරන වේටර්ලා වත් , මේ වගේ ගොන් වැඩ කරන්නේ නැහැ. මොකද මේකේ වැඩ කරන අය අන්තර්ජාතික පුහුණු ලබාගත්ත අය...

මන් ඔලුවෙන් වේටර් ට කීවෙ අහන් දේට උත්තර දෙන්න කියල
"ඩිශ් දෙකට 2.20 ලැක්ස් , සර්විස් චාර්ජ් එක 25000 ක් වෙනවා.. ටොටල් එක 2.45 ලැක්ස් වෙනව..."

ඒක අහපු පාර අම්මගෙයි දුවගේයි කට කනේ..

"පුළුවන්ද කියරා බිල් එක සෙටල් කරන්න.. ඔන්න අපිට නම් බැහැ මෙහ වළං හෝදන්න "
ඒකට උත්තරයක් නොදුන්න මම , වෙටර්ට මෙහෙම කිවා..
" Please send my regular dish " මගේ හැමදම මෙහෙ ආවොත් කන කෑම එක ඔර්ඩර් කරා..
ඒක දැක්කා විතරයි අම්මයි දුවයි පුදුම වෙලා බලන් ඉන්නවා

කොහොම හරි මට ජේනවා අර දෙන්නා.. අර කෑම එක ගිල ගන්න බැරුව දුක් විදිනවා ... මන් කිසි දෙයක් දැක්කේ නෑ වගේ මගේ කෑම එක කෑවා...

කොහොම හරි බිල අරගෙන එන්න පරක්කු නිසා.. මේ දෙන්නා වෙටර් කෙනෙක්ව හොයනවා බිල ගෙන්න ගන්න...

" හෙයි... අපිට අපේ කෑම වල බිල ගන්න පුළුවන්ද???"

" නෝ මැඩම්, ඔයාලට බිල් එකක් නැහැ .. මොකද අපිට කියාරා මැඩම්ගෙන් සල්ලි ගන්න බැනෙ...

ඇ .. ඒ මොකද ඒ.. ඒක මාර වැඩක් නේ.. "

"ඉතින් මිස් අපි කොහොමද රෙස්ටොරන්ට් චේන් එකෙ owner ගෙන් බිලක් සෙටල් කරන්නෙ.." එහෙම කියපු වෙටර් ඉක්මනට එතනින් ගියා..

හරිනේ දැන් අම්මටයි දූවටයි...

# 6 කොටස

" මොකාක්????" නැන්දු පපුව අල්ලන් ඉදන් හිටිය පුටුවෙම පැත්තකට ඇලඋනා..

ඒ අස්සෙ ටෙහාරා කලබල උනු පාරට අතේ තියන් හිටිය ගෑරොප්පුව කෑම එක උඩට වැටිලා කෑම එක එයාගෙ ඇගෙයි මෙසෙයි හැම තැනම ....

විනාඩි 5කට විතර පස්සෙ ටෙහාරා නම් සාමන්‍ය තත්වයට ආවා.. නැන්දනම් ඒත් නෑ තාම පපුව අල්ලන්.. ඒ විකාර බලන ගමන් මන් කාලා ඉවර වෙලා ටිශූ එකකින් කට එහෙම පිහිදගෙන මගේ ටැබ් එක අතට ගත්තේ වැඩක් පලක්වත් කරන්න..

"කියාරා.. මොනාද මෙ මනුස්සයා කියන්නෙ..."

"මොනවද??? " මන් නොසැලකිල්ලෙන් ඇහුවා.

" මේ රෙස්ටොරන්ට් එක ගැන " එයා ගොත ගගහා ඇහුවා...

මන් ඒකට උත්තර දෙන්න කලබල උනේ නෑ.. මොකද මන් දැක්ක මේ පැත්තට කලබලෙන් එන මනුස්සයෙක්ව...

" මැඩම්... " ඒ මනුස්සයා හති අරිනවා පුටුවට බර වෙලා.. ඒක දැක්ක කියාරා ඇස් දෙකත් ලොකු කරන් ඒ මනුස්සයා දිහා බලන් ඉන්නවා...

" මිස්ටර් දුනුරත්න.. මේ අයව දන්නවද?? " මන් ඇහුවේ මගේ ටැබ් එක පැත්තකින් තියන ගමන්..

දැනුයි ඒ මනුස්සයා මේ දෙන්නව දැක්කෙ.. ඒ පාර ඒ මනුස්සයත් ඇස් කටේ දගෙන මේ දෙන්නා දිහා මාරුවෙන් මාරුවට බලන් ඉදලා මගේ පැත්තට ආයේ හැරුනා..

" නෑ.. මැඩම් " ඔය මනුස්සයා ඕක කියනවා කියල මන් දැනගත්තා.. දැනුයි මෙතන නියම ෆිල්ම් එක පටන් ගන්නෙ...

" මොකක්... තමුසෙ මොනවද මේ කියන්නෙ මිනිහෝ... " ටෙහාරා බෙරිහන් දුන්න පාර ඇවිල්ලා ඉන්න ඔක්කොම මිනිස්සු මේ පැත්ත බැලුවා..

" මැඩම් ඇත්තටම මේ කවුද කියල මන් දන්නෙ නෑ.. ඇයි මැඩම් මට එන්න කියල තිබ්බේ" ටෙහාරගෙ කෑගැහිල්ල සතේකටවත් ගනන් ගන්නෙ නැතුව ඒ මනුස්සයා මගෙන් ඇහුවා..

" කියාරා.. මොකක්ද මෙකෙ තේරුම..." ඒ ගමන මාව කන්න හදනවා..

" මිස්ට දුනුරත්න, මේ ටෙහාරා කියන්නෙ ඔයා එයාගෙ හස්බන්ඩ් කියල.. අනික මෙයා ඔයා යාරා කම්පැනි එකේ වැඩ කරනවා කියන එක තැන තැන කියවනවා ඒවා කම්පැනි එකෙ රූල්ස් වලට විරුද්දයි කියල දන්නවනේ "

" මේකයි මැඩම්.. මන් ඇත්තම කීවොත් මන් මෙයාව දන්නවා.. ඒත් මෙයා මගේ ලීගල් වයිෆ් නෙවෙ.. " ....

හත්වලාමේ .. මෙච්චර දෙයක් මන් හිතුවේ නෑ.. දෙය්යනේ නැන්දූ....

## 7 කොටස

නැන්දට හාට් ඇටැක් එකක් ඇවිල්ලා වගේ.. එයා ඇස් දෙක ඇරගෙනම වගේ පුටුවෙ පැත්තටකට කඩන් වැටුනා... මන් එයාගෙ ලගට ගියාත් ටෙහාරා පැත්තවත් බැලුවෙ නෑ.. එයා අර මනුස්සයව කන්න වගේ බලන් හිටියා....

රෙස්ටොරන්ට් එකෙ මැනෙජර් ඇම්බුලන්ස් එකට කෝල් කරල තිබ්බා.. විනාඩි 15ක් විතර යද්දි නැන්දව හොස්පිටල් අරන් ගියා..

හැබැයි නැන්ද ගියේ තනියම.. මට යන්න උවමනාවක් තිබ්බෙ නෑ.. මන් පස්සෙන් ගිහින් පලි ගන්නෙ නෑ. ඒ උනාට මට අතීත සිද්දියක් මතක් උනා...

අපේ අම්මා අසනීප උනා.. සීනි වැඩි වෙලා .. අම්මව නැවත්තුවෙ රජයේ ඉස්ප්‍රිතාලේ , අපිට ඒ කාලෙ සල්ලි තිබ්බෙ නෑ ප්‍රයිවට් එවාට යන්න..

කොහොම හරි අම්මව ටිකට් කපද්දි නර්ස්ලා එහෙම කීවෙ සීනි අඩු වෙන්න තෙඹූ කොල දෙන්න කියල .. අපේ ඉඩම් කැල්ලෙ තෙබු තිබ්බෙ නැන්දලාගේ මායිමට වෙන්න..

කොහොම හරි ගමේ අයගෙන් නැන්ද ඒක දැනගෙන අපි අම්මට උයන්න තෙබු කොල හොයන්න යද්දි , වැල එයාලාගෙ පැත්තට ඇදලා කපලා දලා තිබ්බා.. ඉතින් එහෙම කරපු අයට පැන පැන උදව් කරන්න යන්න ඔනෙ නැනෙ...

කොහොම හරි මන් ටෙහාරවයි , කේශාන් දුනුරත්න වයි රෙස්ටොරන්ට් එකෙ මැනෙජර් රූම් එකට අරන් ගියේ මේ ප්‍රශ්නේ විසදගන්න..

" මොකක්ද දුනුරත්න මෙකෙ තෙරුම ඔයා කියන්නෙ ටෙහාරා කියන්නෙ ඔයාගෙ mistress ( අනියම් බිරිද) කියලද ? "

ඇත්තටම මත් මෙච්චර දෙයක් දැනන් හිටියේ නෑ. මත් හිතුවෙ කේශාන් ටෙහාරව බැදලා වෙන ගෑනු එක්ක යනවා කියල...

" මැඩම් ... ටෙහාරා කියන්නෙ මැඩම්ලගෙ රිලේටිව්ස්ලා කියල මත් දැනන් හිටියේ නෑ.. "

" කේශූ බබා ඔයා මේ මොනවද කීයන්නෙ... අනික මේ ගෑනීට මොකද මැඩම් මැඩම් ගගා දෙකට නැවෙන්නෙ.." දැක්කනෙ මෙච්චර හරියක් වෙලා තියෙද්දි මෙයාට මතක් වෙන දේවල් ..

" අනෙ.. මේ මගෙන් කු???ණු..හර...ප අහගන්නෙ නැතුව ඉන්නවද ?? යාරා කම්පැනි ඔනර්ට මැඩම් කියන්නෙ නැතුව උ..බ..ට මැඩම් කියන්නද කියන්නෙ"

හත්වලාමෙ නැන්දට වගේ මෙයාටත් හාට් ඇටෑක් එයිද?? ටෙහාරගෙත් ඇස් උඩ කියා කේශාන් කියපු කතාව අහලා..

" මෙහෙමයි ඔයාලගෙ ප්‍රයිවට් දේවල් මට අදාල නෑ.. මට වැඩක් තියෙන්නෙ මගේ කම්පැනි එකෙ මැටර්ස් ..

දුනුරත්න මට ස්ටෙට්මන්ට් එකක් දෙන්න මෙරෙජ් එක ගැන සර්ටිෆයි කරන්න "
එහෙම කියපු මන් යන්න නැගිට්ටා..

" ටෙහාරා do not underestimate me ever again " ( මාව අවතක්සේරු කරන්න එපා කවදාවත්ම )
ටෙහාරට එහෙම කියපු මන් දොරත් ඇරගෙන මේ දෙන්නව එලියට දාන්න කියල මැනෙජර්ටත් කියල ආවා..

අපෝ එද නම් මහ එපා කරපු දවසක්... එදයින් පස්සෙ ඒ අම්මයි දුවයි හම්බුනේ මලගෙදර දවසෙදි තමා..
නැන්දනම් ඉතින් නැතිවෙලා හිටියේ..

කොහොම හරි මට ආරංචි උනු විදිහට නැන්දව අන්තිමට ආදාහනය කරලා තිබ්බේ ගල්කිස්ස පැත්තේ පොඩි කන්නතක.. මට කරන්න දෙයක් නෑ..

කොහොම හරි එද සිද්දියෙන් පස්සෙ කෙශාන් ටෙහාරා එක්ක තිබ්බ ඔක්කොම සම්බන්දකම් නවත්තලා තිබ්බා..

දැන් ටෙහාරා අලුත් මනුස්සයෙක් අල්ලන් .. එ මනුස්සයගේ සල්ලි වලින් තමා දැන් රගන්නෙ.. මොකද ඒ මනුස්සයා sugar daddy කෙනෙක් ...

මාමට වඩා ඔනෙ නම් අවුරුදු 3ක් විතර බාල ඇත්තේ...

ඒ අස්සෙ ජනෝද්‍යා මාව හම්බෙන්න යාරා මෙන් බිල්ඩින් කම්පලෙක්ස් එකට ඇවිල්ලා හිටියා...

එයා ඇවිල්ලා මට ගහන්න වගේ තමා වාඩි උනේ..

## 8 කොටස

" මිස් කියාරා.. වීණාවී.. විජේනායක....." ජනොද්‍යා මගෙ නම කිවේ කෑල්ලෙන් කෑල්ල බර කරලා.. හැබැයි තනිකර නොන්ඩියට...

මං එවෙලෙ නම් හිටියේ දහසකුත් වැඩ තියාගෙන..
" ජනොද්‍යා ... සාමන්‍යයෙන් මාව හම්බෙන්න සතියකට කලින්වත් අපොයින්මන්ට් එකක් දන්න ඔනේ.. දැන් ඉතින් කියන්න ආව දේ කියන්න්කො " මන් එහෙම කීවෙ ටැබ් එක අතට ගන්න ගමන්...

" ත..මු..සේ ඇයි ඕ.යි අපෙන් මෙහෙම පලිගන්නෙ.. තමුන්ම දන්නවනෙ අම්මව ලෙඩ උනෙත් ත..මූ..සේ නිසා.. අක්කගේ පවුල කැඩුනෙත් ත..මුසෙ නිසා....

අම්මට පොඩි කන්නතක පු..ච්ච..ත්..න උනෙත් තමුසෙ නිසා කියල..." එයා කියාගෙන ගියේ හෙන හයියෙන්...

ඒකත් මගේ මේසෙට ගහන ගමන්...

" ප්ලීස් ස්ටොප් ජනොද්‍යා... මොකක්ද මේ විහිළුව.. මන් නිසා ඔවා උනා.. හ්.. මන් තමුන්ට එවා ගැන අමුතුවෙන් කියන්න ඔනේද ඔව උනේ මොනවා නිසාද කියල... "

" අනෙ මේ ගෑ..ණි..යේ .. බබා වෙන්න ලෑස්ති වෙන්න එපා.. උ..බේ කෙරුවාව මන් හොදට දන්නව.. උ..බ .. අපේ ඉදුල් ලෙව කෑව.. උ..බට මෙච්චර සල්ලි හම්බකරන්න පුලුවන් උනේ.. එක.. එකාට රෙ..ද්ද උස්සලා නෙවෙද??

උ..බ කීදෙනෙක් එක්ක බුදියෑවද... මෙච්චර දෙයක් කරගන්න... " ඔන්න ඔන්න ඉතින් මගේ තරහ අවුස්සගන්න තමා ලෑස්ති වෙන්නෙ..

" ඕ ජනොද්‍යා.. ඔයාට එවිඩන්ස් තියෙනවද ආ මන් මිනිස්සුත් එක්ක ඉන්නවා කියන්න... හ්ම්ම්ම්... හැබැයි .. මන් ලග නම් ඇති තරම් එවිඩන්ස් තියෙනවා ඔයාලා ගැන මොකද කියන්නෙ ආඅා"

" හ්.. ත්..මුසේ හෙන ලොකු කමින් නේද ඉන්නේ.. ආඅ.. බලනවකෝ මන් තමුසෙට කරන දේ.. කියාරා..

මේ ලංකාව.. ලංකාව ඇතුලේ ඔනේ දෙයක් කරන්න මේ ඩොක්ටර්ලට පුලුවන්.. බලාගන්නවකො තමු..සෙට වෙන දේ..."

එහෙම කියපු ජනොද්‍යා මටත් ගස්සගෙන යන්න ගියා.. එයා වෙහාරා වගේ නෙවෙ ටිකක් මොලේ තියෙනවා.. එයා කිසිම දෙයක් නොකර ඉදී කියල මන් හිතන්නෙ නෑ..

" හෙලෝ.. මට විනාඩි දහයක් යද්දි මෙ කෙනාගෙ හැම ඩීටේල් එකක්ම ඔනේ.. ක්‍රප්ශන් තියෙනවනම් එවිඩන්ස් එක්ක.. " මන් මගේ පුද්ගලික ලේඛම්ට කීවා...

කොහොම හරි එද දවස එහෙම්ම ගෙවිලා ගියා...
මට හෙට පැරිස් යන්න තියෙනවා බිස්නස් ටුවර් එකකට...
ඉතින් මගේම කියල රෙන්ට් අවුට් කරන ප්‍රයිවට් ජෙට් එකක් මට තියෙනවා.. ඒක නිසා පිටරට ගමන් හරිම ලේසී...

ඒ යන ගමන් අම්මලාවත් බලලා එන්න ඔනේ... ඔයාලට මන් කීවෙ නැනෙ.. අපේ අම්මයි මල්ලියි තාත්තයි මේ දවස් වල ඉන්නේ ඉතාලියේ .. ඒ මල්ලිගේ බාස්කට් බෝල් මැච්වලට ගිහින්.. අපෙ මල්ලි දැන් ඉන්ටනැශනල් ප්ලේයර් කෙනෙක්..

අම්මයි තාත්තයි දෙන්නම මාව මෙහෙ දලා යන්න කුරු කුරු ගෑවට එයාලටත් හොද ටුවර් එකක් වෙයි කියලමයි

මං ඒ දෙන්නව මල්ලි එක්කම පිටත් කරේ...

මත් ආපහු එන්නෙ සති දෙකකින් නිසා.. මේ ස්ටුඩන්ට්ලට අසයින්මන්ට් , රිසර්ච් වර්ක් ටිකක් මේල් කරා..

අද වැඩ ඉවර වෙලා ගෙදර යද්දි රෑ 12ත් වෙලා.. හෙට උදේ ගියපුවාම ඇති. ඒක නිසා මත් වොශ් එකක් දාගෙන ටිකක් හොදට නිදාගත්තා...

මට කොලඹ ගෙවල් දෙකක් තියෙනවා එකක් අපාර්ට්මන්ට් එකක් අනික කොලඹ කියල හිතන්නවත් බැරි නිස්කලංක පරිසරයක තිබ්බ මහල් 4ක ගෙදර..

අපි 4 දෙනාම ගෙදර ඉන්නවනම් මත් ඉන්නෙ ඒ ගෙදර.. මත් විතරක් නම් ඉන්නෙ එක්කො බිස්නස් මිටින් කැම්පස් වැඩ හින්ද රෑ වෙනවනම් මත් අපාර්ට්මන්ට් එකට යනවා...

මේක ශැංගිලා එකෙ පෙන්ට්හවුස් එකක්.. මාරම luxuary, comfortable එ වගේම නිදහස් තැනක්.. එ වගේම ඉන්ටීරියර් ඩිසයිනින් නම් නෙක්ස්ට් ලෙවල්.. ඒ වගෙම තමා ඉතින් ගානත්... සාමාන්‍යයෙන් ලංකාවෙ සල්ලිකාරයන්ගෙනුත් උඩින්ම ඉන්න අයට තමා මේ වගේ ගානක් දරාගන්න පුලුවන් වෙන්නෙත් ...

ඉතින් උදේම නැගිටපු මන් Gucci සන්නාමයේ වටිනා ඇදුමකට , sawarosky diamond වලින් වර්ක් කරල තියෙන මගේම ඇනවුමකට හදපු අත් ඔරලෝසුවයි.. Aldo brand එකෙ හීල්ස් වගේ ඒ බ්‍රෑන්ඩ් එකෙම අත් බෑගයත් දගත්තා..

පස්සෙ මං එයාපෝර්ට් ගියේ මගේ ජෙට් එකෙ වැඩ ටික කරගන්න ..

ඉතින් ඔන්න මන් පැරිස් , ඉතාලි ටුවර් එකක් යන්නයි යන්නෙ.. බලමු අපි ගිහින් ආවම ජනොද්‍යා මට මොනා කරල තියෙයිද කියල...

## 9 කොටස

මන් පැරිස් වල Paris- orly airport එකේ මගේ ප්‍රයිවට් ජෙට් එක පාර්ක් කරල මුලින් ගියෙමන් මුල් දවස් 3 නතර වෙන හොටෙල් එකට...

පැරිස් කීවාම හැමෝටම මතක් වෙන්නෙ අයිෆල් ටවර් එකනෙ.. ඉතින් මන් ඒ කිට්ටුවෙන්ම හොටෙල් එකක් බුක් කරා මෙහෙ එන්න කලින්ම...

ඇත්තටම මන් මෙහෙට ආවෙ , වැඩ දෙකකට එකක් තමා Paris fashion week එක බලන්න

එ වගේම මෙහෙ ලොකු හොටෙල් එකක තියෙන බියුටි ඇන්ඩ් කොස්මැටික් සයන්ස් ගැන සමුලුවකට සහබාගි වෙන්න..

මේ සමුලුවනම් මට හීනයක් වගේ දෙයක්.. මොකද ඒකට සහබාගි වෙන එකත් ලෙසී නෑ.. සාමාන්‍යෙන් ඒකට ඒකෙ 2 වෙනි දවසේ ඉදන් නම් ඕනේ කෙනෙක්ට සහබාගි වෙන්න පුලුවන්..

ඒ උනාට opening ceremony එකට යන්න පුලුවන් invitation ලැබුන අයට තමා... ඉතින් මටත් පලවෙනි වතාවට invitation එකක් ලැබුනා...

ඉතින් මන් මගේ හොටෙල් එක වුනු Brach Paris හොටෙල් එකට ආවා... ඒක ඇත්තටම අයිෆල් ටවර් එකට ගොඩක් ලගින් තියෙන්නෙ... හොටෙල් එකෙ කොමන් ඩයිනින් එරීයා එකට ඒක හරිම ලස්සනට පේනවා...

ටිකක් දිග ගමනක් ආව නිසා මන් මුලින් කලේ හොද වොශ් එකක් දාගෙන ටිකක් විවේක ගත්ත එක..

පැයකට විතර පස්සෙ මට නැගිට්ටුනෙ මට ආපු කෝල් එකකට.. කෝල් එක ආවෙ මගේ සෙකට්‍රි කෙනෙක්ගෙන්...

" ඔව් කියන්න"
"........"
මොනවද?? ඕකත් මට කියන්න දෙයක්ද???
" ........"
" අය්යො ලමයො.. පොඩි දෙයක්වත් කරගන්න බැනෙ.. මාව දන්න මිඩියා චිෆ්ට.."
" ......"

" හෙලෝ.. චානක... ඔය රිලීස් කරල තියෙනවා කියන, විඩියෝ එක ඔයාලා දැනටමත් අයින් කරලනෙ තියෙන්නෙ.. මට ඩවුට් එකක් තියෙනවා ඕක කරපු කෙනා ගැන.. මන් ඒක රෙහාන්ට කියන්නම්.. එයාගෙන් මන් කන්ෆම් කර ගත්තම ඔයා කරන්න ඔනේ.. අපි ලග අර තියෙන විඩියෝ වලින් එකක් සොශල් මිඩියා දන එක.. ඕකේ "

මගේ මීඩියා බාරව ඉන්න චානක දිසානායකට එහෙම කියපු මන් එහෙම්ම කෝල් එක ගත්තේ මගෙ සිකියුරිටි බාරව ඉන්න රෙහාන් වැලිගමට...

" රෙහාන්... ජනොද්‍යා තමා මේක කරන්න ඇත්තේ.. ටෙහාරා එක්ක එකතු වෙලා.. එයාගෙ අර අලුත් මනුස්සයගේ පවර් එකෙන්..

දන්නවනෙ වෙන්න ඔනේ දේ.. ඔයා චානකට කෝල් එකක් දෙන්න ඒක හොයාගන්න ගමන්... "

කෝල් එක කට් කරපු මන් රූම් එකෙ මිනිබාර් එකට ගිහින් මන් ආසම promengranate wine එකක් ගත්තා.. ඒක හදලා තියෙන්නෙ දෙළුම් වලින් ඒක නිසා අමුතුම රහක් තියෙන්නෙ ඒකෙ.. එකෙන් විදුරුවක් දාගත්තු මන් තනියම හිනාවුනේ අර දෙන්නට...

වෙලා තියෙන්නෙ මේකයි ටෙහාරාගෙ sugar daddy ට තියෙනවා ගොසිප් චැනල් එකක් ඒකට අර දෙන්නා එකතු වෙලා අහක ඉන්න කෙල්ලෙකුත් දාලා මගේ අතීතේ ගැන ප්‍රොගෑම් එකක් කරල..

මන් ඒ කාලේ එයාලා ඇදලා පරන උනු ඇදුම්කෑලි ඇදන් ඉන්න ෆොටෝ ඉදන් එයාලා දාලා තිබ්බා.. ඒකේ කෑලි කෑලි අහුලන් සොශල් මිඩියා වල ගොසිප් හොයන උන්.. ෆෙස්බුක් යූ ටියුබ් වල සෙයා කරල..

හැබැයි මට බය වෙන්න දෙයක් නෑ.. මොකද මන් කිසිම වෙලාවක මගේ අතීතේ ගැන හංගලා නෑ.. මන් ඔනේම තැනක මගේ අතීතේ ගැන කියනවා..

ඉතින් ඕනේම කෙනෙක්ට ඒ වගේ අතීතයක් තියෙන්න පුලුවන් මොකද හැමෝම රිදී හැදි කටේ ගහන් ඉපදෙන්නෙ නැනෙ.. ඒ උනාට කෙනෙක් දියුනු උනාම එයාව බිමට ඇදලා දන්න එයාගේ අතීතේ පාවිච්චි කරන එක මහ කැත වැඩක්..

ඒක නිසාම ඒකට රිටත් එකක් අක්කටයි නංගිටයි දෙන්නම ඕනේ.. මොකද අනුන්ගේ පොල් පරාල හෙව්ව්වට එයාලාගෙ ඇහේ තියෙන්න පොල් කෙන්ද එයාලට පෙනිලා නෑ.. හැබැයි මේ කියාරට ඒවා පේනවා...

ඒත් එක්කම මට කෝල් එකක් ආවා..
"......"
" ඔකෙ.. ගුඩ් වර්ක් ... " මන් කීවෙ එච්චරයි...

## 10 කොටස

කොහොම හරි පහුවදා මන් හවස ගියේ Fashion week එකෙ දෙවනි දවසට ... autumn / Winter ශෝ එකට තමා මන් ගියේ.. මේ fashion show එක අවුරුද්දකට දෙපාරක් තියෙනවා.. ඒ Spring/ Summer හා Autumn/ Winter විදිහට...

පැරීසියේ විවිධ තැන්වල මේ fashion show ඒ සතිය පුරාවට දකින්න පුලුවන්.. තමන්ට කැමති එකක් බලන්න යන්න පුලුවන් ... සමහර එවාට නම් invitation ඔනේ..

ප්‍රසිද්ද සන්නාම උන LV , Gucci , Chanel, Dior කට්ටියගේ fashion shows තියෙන්නෙ නම් ඓතිහාසික ස්තාන වුනු Carrousel de louvre හරි Grand palais වල ...

ඉතින් අද මන් ගියේ grand palasis වලට ... හොලිවුඩ්, බොලිවුඩ් වල අතිශය ජන්ප්‍රිය නලු නිලියො, ව්‍යාපාර අයිති අය වගේම දේශපාලනය කරන අය පවා එහෙට ඇවිල්ලා හිටියා ....

ඉතින් මන් උසස් සන්නාමයකට අයත් සුදු දණහිසට ඉහලින් තියෙන , one shoulder මිනි ගවුමක් තමා එකක් තමා ඇදන් ගියේ....

ඉතින් අද දවසම fashion shows බලලා , ඒ ඒ සන්නාම වල අවුට්ලට්වල ගිහින් මන් ආවෙව් පැරිස්වල ජනප්‍රියම අවන්හල් වලින් එකක් උන Alain Ducasse au Plaza Athénée වලට.. එක එහෙ සුපිරිම වයින් තියෙන රෙස්ටොරන්ට් එකක් හැටියත් ප්‍රසිද්දයි...

ඉතින් ගොඩක් අය කරන්නෙ කොහේ ගියත් ලංකාවෙ හුරුවට කෑම හොයන එකනෙ.. මත් එහෙම කරන්නෙ නෑ.. ලංකාවෙ කෑම කවදත් අපිට කන්න පුලුවන් නිසා මන් මොන රටට ගියත් ඒ රටට ආවේනික කෑම තමා කන්නෙ..

ඉතින් මන් මේ රෙස්ටොරන්ට් එකෙදිත් කන්න ඕඩර් කරේ Pot - Au - Feu කියන සාම්ප්‍රදායික ප්‍රංශ ආහාරය.. මස් ඉස්ටූ හා එළවලු වලින් සමන්විත ආහාරයක් ඒක..

හවස් වෙලා අයිෆල් ටවර් එක ලගටම වෙලා ඉර බහින දිහා බලන් ඉන්නවා තරම් දෙයක් ඇත්තටම නෑ.. winter season එකට ලග නිසා මෙහෙ දැන් ඉක්මනට ඉර බහිනවා...ඉතින් තිත්ත කෝපි එකක් බිබි මන් ඉර බහිනවා බලන් හිටියා..

" හෙලෝ... "

" එහෙමද ??? මගේ පර්සනල් නම්බර් එක දෙන්න එපා.. මන් ආවම හම්බෙන්නම් කියන්න.. සති දෙකකින් පස්සෙ... අනික අර දාපු විඩියෝ එක සති දෙකම ට්‍රෙන්ඩින් තියෙන්න ඔනේ... "

" හරි එහෙම කරන්න... අනික කේස් එකකුත් ෆයිල් කරන්න මත් එන්න ලං වෙලා එතකොට මට කෙලින්ම කෝට් එකට යන්න පුලුවන්නෙ.. "

" ගුඩ්.. ඔව් හරි... "

මගේ පුද්ගලික ලේකම් කතා කරේ ලංකාවෙ විස්තර ටික මට කියන්න...

මන් එලියට දැම්මෙ , ජනොද්‍යාගේ career ethics වලට පටහැනිව එයා කරපු දෙයක් ගැන... එයා අදක ඊයේක ඉදන් නෙවෙ ඒ වැඩෙ කරන්නෙ.. ඩොක්ටර් කියන ලේබලය අලවන් එයා කරන්නෙ හරිම නින්දිත වැඩක් .. ඒ තමා රජයේ රෝහල් වල ඉපදෙන චූට්ම චූටි කිරිසප්පයෝ විකුණන වැඩේ..

ඔයාලා බලනවා ඇති මන් ඒක දැනගෙන මෙහෙම කරේ ඇයි කියල.. නෑ.. මන් ඒක දැනන් නිකන් හිටියේ නැ...

# 11 කොටස

ජනොද්‍යා කරන්නෙ මෙන්න මේකයි.. ගැබ්ණි කාලය ටිකක් අමාරු උනු, ඩිලිවරි එක අමාරු වෙයි කියල හිතෙන අම්මලා හිමීට තෝරගන්නවා.. පස්සෙ බබාලා ඕනේ කරන අය ටිකකුත් හොයාගන්නවා.. පස්සෙ බබා ලැබුනම බබා නැති උනා කියල බබාව විකුනනව..

ගොඩක්ම මේ දේ කරන්නෙ දුප්පත්, නූගත් , ළමයි ගොඩාක් ඉන්න වගේ අම්මලට.. එයාලා මේවා ගැන හොයන්නෙ නැනෙ.. එක පාරක් මේක අහුවෙන්න ගිහින් නූලෙන් බේරුනෙ..

මත් මේක දැනගත්තෙ ඇත්තටම ආපහු මෙයාලා මාත් එක්ක කතා කරන්න මාසෙකට කලින් වගේ.. ඒ කිවේ මාස 7- 8 කට උඩදි වගේ... ඒ කිසිම ළමයෙක් විකුන්න මත් ඉඩ තිබ්බෙ නැ..

මගේ කන්ටැක්ස් පාවිච්චි කරල මත් ඒ ළමයින්ව ඒ අම්මලාටම දුන්නා.. ඒ බබාලට කැමති නැති අම්මල හිටිය නිසා එයාලව නිත්‍යානුකූලව හදගන්නත් දුන්නා...

ඔයාලා දන්නවනේ ලංකාවෙ නීතිය.. මත් අමුතුවෙන් කියන්න ඔනෙ නැනෙ.. කොච්චර සාක්ශි තිබ්බත් සල්ලි තිබ්බම ඔනේ දෙයක් කරන්න පුලුවන් කියල...

ඉතින් ජනොද්‍යට බේරෙන්න බැරි වෙනකන් සාක්ශි හොයන එක තමා මන් මෙච්චර කාලෙකට කරේ...

ඊට අමතරව යූනිසෙෆ් එකත් එක්කත් එකතු වෙලා මන් කරන්න ඔනේ ටික කරා.. සතියකට කලින් තමා අපි ඔක්කොම දේවල් හොයාගත්තේ.. ඉතින් දැන් එවා එලියට දන වෙලාව...

ජනොද්‍යා රජයේ රෝහලක වැඩ කරන හින්ද..

පලවෙනි විඩියෝ එක දපු ගමන් එයාලගේ සංගමයෙන් එයාව කවර් කරනවා කියල මන් දන්නවා.. ඉතින් ඒකට තම අනික් විඩියෝ සාක්ශි තියෙන්නෙ...

කොහොමත් ඕවා ගැන හිතනවට වඩා මට වැඩ තියෙනවා... දෙවනි දවසෙත් , තුන්වෙනි දවසෙත් මන් ෆැශන් ශෝ එක බලන්න, එවගෙන් සංවිදානය කරල තියෙන පාර්ටිස්, ඩිනර් වලට එහෙම සම්බන්ද වෙලා හිටියේ...

කොහොම හරි මෙ වැඩේ ඉවර කරල මන් , හොටෙල් එකෙන් චෙක් අවුට් උනේ කලින් කීව සමුලුවට සහබාගි වෙන්න ...

ඒක තිබ්බ හොටෙල් එකෙම අපිට නවාතැන් පහසුකම් ලැස්ති කරල තිබ්බෙ.. Hotel de Peninsula එකෙ තමා මේක තියෙන්නෙ..

හොටෙල් එකෙ ලස්සනම රූම් එකක් තමා මට හම්බෙලා තිබ්බෙ.. එකෙන් පේන වීව් එක දැක්කම මහන්සිය කොහෙන් ගියාද මන්ද...

ඉතින් හෙට ලේසි පහසු කට්ටිය නෙවෙනෙ එන්නෙ.. ඉතින් ඒකට සුපිරි විදිහට ඇද පැළඳගෙන යන්න ඔනෙ.. ඒකමයි මන් මේකට එන්න කලින් ෆැශන් ශෝ එක බලන්න ගියේ.. ඒකෙදි මට හිතට අල්ලපු ඇදුම් කීහිපයක් මන් මිලදී අරන් තිබ්බෙ...

## 12 කොටස

බියුටි ඇන්ඩ් කොස්මැටික් සයන්ස් සමුලුව තියෙන්නෙ උදේ.. ඒකෙන් පස්සෙ හවස පාර්ටි එකක් තියෙනවා..

මන් කලින් කීවනෙ මට මේකට ඉන්විටේශන් හම්බුනා කියල.. මේකට ඉන්වයිට් කරන්නෙ ලොකෙන්ම 650 කට විතරයි... ඒ එයාලගේ අවශ්‍යතා සම්පූර්ණ කරල තිබ්බොත් තමා...

සාමාන්‍යෙන් තමන්ගෙම කියල කොස්මැටික් බ්‍රැන්ඩ් එකක්

ලියාපදිංචි කරල තිබීම, හා අවුරුදු 3ක් වෙලදපොලේ තිබීම... ඒක බාවිතයට සුදුසු කියලා ලොකේ ප්‍රදන පෙලෙ පිලිගත්ත සහතිකයක් තිබීම ( ගොඩක් වෙලාවට American හරි Uk හරි ) ,
ඒ ප්‍රඩක්ට් වලට සෘනාත්මක ප්‍රතිචාර අඩු වීම හා ධනාත්මක ප්‍රතිචාර වැඩි පුර තිබීම.., කිසිම අවස්තාවක එම නිශ්පාදන නිසා මරණයක් සිදු නොවී තිබීම... ,
එ වගේම ඒ දේවල් සලකලා තමා එයාලා ඉන්විටේශන් එවන්නෙ.. ඉතින් මන් කීවේ මෙකෙන් ඉන්විටේශන් එකක් එනවා කියන්නෙ ඇත්තටම මම වාසනාවන්තයි...

උදේම මගේ ලංකාවෙ තිබුන වැඩ මාර්ගගත ක්‍රමයට ඉවර කරල , කැම්පස් එකෙ අන්තිම ලමයින්ට කරන්න තිබ්බ ලෙක්චර් එකකුත් කරල මන් සමුලුවට යන්න ලැස්ති උනා...

ඒකට මන් තෝරගත්තේ ඔෆිස් සූට් එකක්.. ප්‍රසිද්ද සන්නාමයකට අයිති ඒ කිට් එකට මන් ඒ සන්නාමයෙන්ම හැන්ඩ් බෑග් එකකුත් ලැස්ති කරගත්තා.. උදේ වරුවෙ තිබ්බ නිසා ශේඩ්ස් ( Sunglass ) දෙකකුත් දාගෙන මන් හොටෙල් එකෙ ප්‍රදන conference room එකට ගියා...

මන් යද්දිත් සෑහෙන පිරිසක් එතන හිටියා... පොටො අරන් තමා ඇතුලට යන්න තිබ්බෙ .. මාත් පෝටො අරන් ඉන්විටේශන් එකත් අරගෙන ඇතුලට ආවා.. ඒ යද්දි වතුර බෝතලක් වගේම නැවුම් පලතුරු අපිට දුන්නා...

ඉතින් ලෝකයේ ප්‍රදාන පෙලෙ මහාචාර්යවරු, කතිකාචාර්යවරු, කම්පැනි වල අයිතිකරුවො , ව්‍යවසායකයන් ගොඩක් අය මෙකෙ හිටියා..

මේ පාර සමුලුවෙ ප්‍රධානත්වය අරන් තිබ්බෙ Dior company එක නිසාම ඇවිල්ල හිටිය හැමෝටම එයාලා එයාලගෙ මිනි advent calender එකක් දුන්නා... ( එක ගිෆ්ට් බොක්ස් එකක් ,මාසෙ දින වලට හරි ,අවුරුද්දේ මාස වලට එහෙමත් නැත්තනම් නිකන් අංක වලට එක එක ගිෆ්ට් එකෙ තියෙනවා හංගලා.. ඉතින් මෙකෙ Dior සන්නාමයේ සුවද විලවුන් , තොල් ආලේපන , විවිද ආලේපන වර්ග තියෙනවා..)

ඒක නිකන් සර්ප්‍රයිස් එකක් වගේ අපි දන්නෙ නැනෙ ඒ ඒ වෙන් කරල තියෙන කොටස් වල මොන වගේ දෙයක්ද තියෙන්නෙ කියල ...

ඉතින් මේ සමුලුව උදේ 10 ඉදන් හවස 4 වෙනකන් තිබ්බා.. දවල් ආහාරයත් අපිට ලබා දුන්නා...

කොහොම හරි සමුලුව ඉවර වෙලා නිදහසක් නම් තිබ්බෙ නෑ.. කලින් කීවා වගේ හවස තියෙන පාර්ට් එකට ලැස්ති වෙන්න ඔනේනෙ...

පාර්ටි එකට යන්න කලින් මන් සැලොන් එකකට ගිහින් මට අවශය මේකප් එකකුයි හෙයා ස්ටයිල් එකකුඉ දගෙන එහෙම්ම පාර්ටි එකට ආවා...

මේ පාර්ටිය නම් තනිකර පිස්සුවක්... ඒක වෙනම ලෝකයක් වගේ... එකෙදි ලොකේ ප්‍රසිද්ද චරිත මට මුනගැහුනා.. මේ වගේ පාර්ටි වලදි හැමෝම තමන් බිස්නස් කාරයො කියන මූඩ් එකෙන් මිදිලා හැමෝම එක්ක හොදට විනෝද උනේ හරියට පාසල් යන ලමයි වගේ...

ඉතින් පාර්ටි එක ඉවර වෙද්දි මන් හිතන්නෙ පාන්දර 5ට විතර ඇති.. මාත් පමණට වඩා වයින් බීලා හිටියේ.. ඉවර උනු ගමන් එහෙම්ම් කාමරේට ගිහින් වොශ් දලා නිදගත්තා.. දෙය්යනෙ නැගිට්ද්දි රෑ 8යි.....

## 13 කොටස

ඒ වෙලාවට හරි නැගිටපු එක ලොකු දෙයක්.. කොහොම හරි හොටෙල් එකට කත කරලා සැහැල්ලු රාත්‍රී ආහරයක් මන් ගෙන්න ගත්තා... ඒකත් කාලා මගේ වැඩ කටයුතු කරේ ආයේ මට නින්ද යන්නෙ නැති නිසා...

හෙට දවල්ට මන් ඉතාලි වලට යන්න ඕනේ.. මාසෙකින් විතර තමා අම්මලාව දකින්නෙත් ...

එයාලට තෑගි ගන්න ඕනෙ නිසා රෑ 11ට විතර මන් ශොපින් ගියා.. මෙහෙ රෑදවල් කියල නෑ හැමවෙලේම කායඹහුලයි...

ඉතින් පැරිස් වල තියෙන අති සුඛෝපභෝගී වෙළඳසැල්වලට ගිහින් අම්මට හෑන්ඩ් බෑග් එකක් , තාත්තට සුවඳ විලවුන් කිහිපයක්. මල්ලිට අලුත් සපත්තු දෙකකුත් අරගත්තා..

කොහොම හරි පාන්දර 4 ට විතර තමා මන් හොටෙල් එකට ආවෙ.. මගේ පාවිච්චියට ගත්ත කාර් එක ඒ කම්පැනි එකට බාර දීලා මන් කුලී රතයකින් තමා ආවේ...

කොහොම හරි උදේ 11ට විතර මන් පැරිස් වල එයාපෝර්ට් එකට ගියේ මගේ ජෙට් එකට යන්න.. අම්මලා ඉන්නෙ මිලාන් වල නිසා Milan - Linate එයාපෝර්ට් එකට තමා මන් ගියේ...

මන් ආසම මල් පොකුරකුත් අරන් අම්මයි තාත්තයි එයාපෝර්ට් එකට ඇවිල්ලා හිටියේ සීතල ගැනවත් හිතන්නෙ නැතුව...

" අම්මා...." මන් අම්මව බදාගත්තේ හරිම සතුටෙන්... ඒ ගමන්ම තාත්තවත් බදාගත්තේ එයාලව දැක්කෙ මාසෙකින් නිසා..

මල්ලිගේ පාවිච්චියට අරන් තිබ්බ ස්පෝර්ට් වර්ගයේ කාර් එකෙන් තමා අම්මලා ඇවිල්ලා තිබ්බෙ.. මල්ලිට ප්‍රැක්ටිස් නිසා එයාපොර්ට් එකට ඇවිල්ලා තිබ්බෙ නෑ.

අම්මට ප්‍රශ්න ගොඩයි.. මන් කෙට්ටු වෙලාලු, ඇදිලා ගිහින්ලු , කොන්ඩෙට අලුතෙන් දාපු කලර් එක ලස්සනයිලු, ඒකට මන් පොඩි කෙල්ලක් වගේලු... ඔවා තමා ඉතින් එයා එක දිගට කියන්නෙ.. මන් දන්නවා දැන් එයා ගෙදර පුරවලා ඇති මන් කන්න කැමති කෑම වලින්....

අම්මලා මේ මාස 3 ඉන්න මන් කුලියට ගෙයක් අරන් දීලා තිබ්බෙ.. අපි ගෙදර ඇතුලට ගිය ගමන් මන් කරේ වොශ් එකක් දාගන්න එක ..

වොශ් එකක් දාලා එද්දි මන් කීවා වගේම අම්මා කෑම මේසෙ පුරවල තිබ්බා...

බත් උයල , අල කිරට හදලා , චිකන් ඩෙවිල් හදලා බටු බැදලා සම්බෝල තමා තිබ්බේ.. මේවා තමා මගේ ෆෙවරිට්ම ......

දැන් ඉතින් අම්මා එක්ක ඩයට් කරල ඉවරයි.. මේ සතියම වර්ක් අවුට් වත් කරන්න බැරි උනේ මං ගොඩක් කාය්ඛහුල නිසා..

කාලා ඉවර වෙලා මන් අම්මල ට ගෙනාව තෑගිත් දුන්නා.. මල්ලිගේ ප්‍රැක්ටිස් ඉවරවෙන්නෙ හවස නිසා එයාව එක්කන් එන එක මන් බාර ගත්තා...

ඉතින් මේ සතිය ගෙදරම ඉන්න මගේ කිසි බලපොරොත්තුවක් නෑ.. මෙහෙට එද්දිම මන් මේ සතියේ යන්න ඔනේ තැන් එහෙම ප්ලෑන් කරල ආවේ.. ඒකටම හරියන ජීප් එකකුත් මන් කුලියට අරන් තමා තිබ්බේ.....

## 14 කොටස

ඉතින් මන් මල්ලිව ගන්න ගිහින් අපි දෙන්නා පොඩ්ඩක් ඇවිදින්න ගියා.. ඉතාලි ගිහින් පිසා කෑවෙ නැත්තනම් වැඩක් නැනෙ... ඒක නිසා අපි ලංකාවෙ දකින්න හම්බෙන්නෙ නැති පිසා වර්ගයක් ඔර්ඩර් කරා...

මල්ලිත් එක්ක මන් නැන්දගෙ මල ගෙදර ගැනයි ජනොද්‍යාගෙ වැඩ ටික ගැනයි කතා කරා මන්.. අම්මට ඕවා කියන්න බැනෙ.. සහෝදරකම් ඉස්සරහට දාගෙන දුවගෙන යයි... එයා තරහ මරහ හිතේ තියාගන්න කෙනෙක් නෙවෙ.. ඒ උනාට මන් එහෙම නෙවෙ...

මගේ අම්මට තාත්තට මල්ලිට මට කරපු දේවල් මන් කවදාවත් අමතක කරන්නෙ නෑ.. ඒවගේ රිටන් එක මන් ගන්නවමයි...

කොහොම හරි ලංකාව දැන් ඇවිලිලා ඇති.. මන් කීවා වගේම ජනොද්‍යාගෙ පලවෙනි විඩියො එක එලියට දැම්මට පස්සෙ එයාලගෙ සංගමේ එයාව කවර් කරේ එවා එලියට දාපු අයට විරුද්දව නඩු මාර්ගයට යනවා කියලා...

ඒ උනාට දෙවනි විඩියෝ එක එලියට දැම්මෙ ලංකාවෙ යූනිසෙෆ් එකට අනුබද්ද ආයතනයකින්..

ඒක නිසා අර සංගමයට කරන්න කිසිම දෙයක් තිබ්බෙ නෑ.. එයාලා ජනොද්‍යාගෙ ලයිසන් එක කැන්සල් කරනවා කිවා ඒත් ටෙහාරාගෙ මනුස්සයාගෙ පවර් එක නිසා ඕක වෙන්නෙ නෑ කියල මන් දන්නව...

මන් ආපහු ලංකාවට යනකන් ඒ සිද්දිය ගැන මිනිස්සු කතා කරන්න ඔනේ නිසා අපේ මිඩියා වල අය ඒකට සෑහෙන මහන්සි උනා... ඉතින් මට ලංකාවට යනකන් නිදහසේ ඉන්න පුලුවන් ...

ඉතින් අද රෑ කට්ටියට මන් මගේ ප්ලෑන් එක කීවා.. අම්මා නම් කුනු කුනු ගෑවෙ මන් ආව ගමන් ගෙදර ඉන්නෙ නැති එකට ඒ උනාට අපි හතර දෙනා ට්‍රිප් එකක් යන්නෙ ලොකු කාලෙකින්නෙ...

උදේම අපි ලෑස්ති උනෙ Alassio beach එකට ..ඒක රෝමෙට ලගින් තමා තියෙන්නෙ , හයික් යන්නත් මේ තැන ප්‍රසිද්දයි ඉතින් හයික් වලට ගැලපෙන බූට්ස් දගෙන තමා අපි ආවෙ.. ඒ වගේම බිච් එකෙ අදින්න සැහැල්ලු ඇදුම් අපි අරන් ආවේ....

ඉතින් ඒ ලස්සන පැත්ත ගැන නම් කියන්න වචන නෑ... ඉතින් අපි හතර දෙනා සෑහෙන්න සතුටු උනා... අම්මට ඔනේ මයි කීව නිසා ගෙදරින් කෑම හදන් ආවෙ...

හවස් වරුවේ අපි නූතන කලා ආකෘති තියෙන මියුසියම් එකකට එහෙම නැත්තනම් කලාගාරයකට ආවා.. එකෙ නම Museo Della Permenente එකෙ තිබ්බෙ නම් ටිකක් විකාර චිත්‍ර ..

ඒ උනාට එවාගේ අමුතු කලාවක් තිබ්බා .. මේක තිබ්බෙ නම් මිලානො වල....

රෑ කෑම ගන්න නම් අපි Corso como කියන වීදියට ආවා.. මේ වීදීයෙ ඇඳුම් පැලඳුම් කඩවල් වැහිවහලා තිබ්බේ.. ඊට අමතරව සුපිරි පන්තියේ නොවුනට ඒවා එක්ක තරග කරන්න පුලුවන් රසක් තියෙන කඩවල් ගොඩක් තිබ්බා.. ඉතින් ඒ කඩවල් වලින් මල්ලි කැමතිම කඩේකට අපි ගිහින් කෑවා...

කාලා ඉවර වෙලා ඒ විදීයේ දිගටම අපි ඇවිදලා .. ආස හිතුන දේවල් අරගෙන අපි නවාතැන් ගන්න හෝටලේට ගියා.. ගොඩාක් රෑ වෙනකන් හිටියේ නැත්තේ සීතල නිසා...

ඉතින් හෙටත් ඇවිදින්න යන්න තියෙන නිසා අපි කලින්ම නිදගන්න ලෑස්ති උනේ.. ඒ උනාට මට නිදගන්න හම්බුනේ නෑ...

# 15 කොටස

කොහොම හරි ඇවිදින්න පුලිවන් ගොඩාක් තැන් වල අපි ඒ සතිය ඇවිද්දා... ඒ සතියේ කාපු කෑම කොච්චරද කියනවනම් මගේ බර කිලෝ 2කින් වැඩි වෙලත් තිබ්බා..

කෑවා වගේ නෙවෙ දැන් බර අඩු කරගන්න ගියාම...
කොහොම හරි ඊයේ මන් ආපහු ලංකාවට ආවා... අම්මට නම් තව කාලයක් මාව එහෙ තියාගන්න ඕනෙ උනා.. ඒ උනාට එයාලා ඊලග මාසෙ මෙහෙ එන නිසා මන් ආවා...

අද ඉදන් නම් කරන්න සෑහෙන වැඩ තියෙනවා.. මන් කීවා වගේම ජනොද්‍යලගේ සංගමය හිමිට අර සිද්දිය යට ගහන ගමන් හිටියෙ.. එයාලා සල්ලි ඉස්සරහ හැසිරෙන්නෙ කිසිම දෙයක් උනෙ නෑ වගෙ...

ඒක නිසා මන් එන්න කලින්ම අපි නඩුවක් දැම්මා ..
එකක් නෙවෙ.. ඒ අම්මිලා මානව හිමිකම් ගැනත් , අපි ජනොද්‍යගේ විනය විරෝදි , සාපරාදී ක්‍රියාව ගැනත් නඩුව දැම්මා...

අද වෙනකන් ජනොද්‍යා දන්නෙ නෑ මේක පිටිපස්සෙ ඉන්නෙ මන් කියල... කොහොම හරි නඩුව තිබ්බෙ ජනොද්‍යායි , රජයයි අතර...

අපි රජයේ පාර්ශවයට අවශ්‍ය කරන ඔක්කොම සාක්ශි දීලා තිබ්බේ...

මන් උසාවිය ඇතුලට ගියේ නෑ.. එලියට වෙලා කාර් එක ඇතුලේ හිටියෙ.. මොකද එතන මීඩියා වලින් වට වෙලා .. ඒ අස්සෙ මාවත් නෝට් උනොත් එයාලාගෙ ප්‍රශ්න වලට උත්තර දෙන්න වෙනවා..

මන් සමාන්‍යෙන් මිඩියා ඉස්සරහට එනවා සෑහෙන අඩුයි... ලොකු උත්සව වලදී වගේ පොදුවෙ කතා කරාට , මිඩියා වෙනුවෙන්ම වොයිස් කට් මන් දෙන්නෙ නෑ. ඒදේවල් වලට තමා මගේ මිඩියා යුනිට් එක ඉන්නේ..

මගේ ලොයර් යටතේ ඉන්න ලොයර් කෙනෙක් ඉක්මනට ඇවිල්ලා කාර් එකෙන් වාඩිඋනා...

" මැඩම් , වැඩේ ගොඩක් දුරට සාර්තකයි... අර කෙනා මාර විදිහට බය වෙලා හිටියේ සාක්ශි ටික දැකලා... එයාලට හිතාගන්න බෑ එවා කොහෙන් ආව සාක්ශිද කියල... කොහොම හරි ඊලග නඩු වාරයේදි මෙයාගෙ ලයිසන් එක කැන්සල් වෙයි..."

" ගුඩ්.. ඒක ඉවර උන ගමන් අපෙ අනෙක් කේස් එක ෆයිල් කරන්න.. " මන් එහෙම කියද්දිම ඒ ලොයර් එලියට ගියා... අපිත් එහෙම්ම් ආවා...

ඒ අස්සෙ මන් ඔෆිස් එකට එද්දි මගේ PA( private assistant) කීවා මට විසිටර් කෙනෙක් ඉන්නවා කියල... මන් කැමරා වලින් බලද්දි ඒ ඇවිල්ලා හිටියෙ......

ටෙහාරාගෙ සුගර් ඩැඩි... මනුස්සයගේ නම නිහාල් ඩි සූසා.. මිනිහා කරන්නෙ කොස්ට්යූම් බිස්නස් එකක්.. එයා එක්ක මන් ගනුදෙනු කරල තියෙනවා...

" එන්න කියන්න.... "

එහෙම කියපු මන් මගේ කායාීල කාමරේ සෝෆා එකෙ වාඩි උනා...

" නයිස් ටූ මීට් යූ මැඩම් කියාරා..." එහෙම කියල ඒ මනුස්සයා මට අතක් දික් කරා...

" මී ටූ මිස්ටර් සූසා.. මොකද මේ හදිස්සියේ ඔෆිස් එකටම ඇවිල්ලා"

ඒ අත දිහා බලන්නෙ නැතුව මන් ඇහුවෙ මගේ ටැබ් එකත් පැත්තකින් තියෙලා..

" ඇයි අපිට අපේ බිස්නස් පාර්ට්නස්ලා හම්බෙන්න බැරිද ඉතින් එහෙම"

" Of course පුලුවන්.. බිස්නස් පාර්ට්නර් කෙනෙක් නිසා තමයි ඇපොයින්මන්ට් එකක් නැතුව මීට් වෙන්න පුලුවන් උනෙ.. "

" ඒකනෙ කියන්නෙ .. මොකද කියන්නෙ අපි කොෆි එකක් බොන ගමන් කතා කරමු " මේ මනුස්සයා බලන්නකො මගෙ ඔෆිස් එකට ඇවිල්ලා මටම කියනවා කෝෆි බොන්න...

" I am so sorry මිස්ටර් සූසා.. මට ලොකු වෙලාවක් නම් නෑ . ඔනෙ නම් මන් ඔයාට කොෆි එකක් එවන්නම් ඔයා බිලා යන්න.. "

එහෙම කිවා විතරයි මනුස්සයගේ මූන දෙක උනා.. ඒත් එයා ඉක්මනට ඒ පෙනුම වෙනස් කරගත්තා...

මේකයි කියාරා.....

# 16 කොටස

මේ මනුස්සයා නම් පහුබහින පාටක් නෑ... මන් මගේ ටැබ් එක පැත්තකින් තියලා කකුලක් උඩුන් කකුලකුත් දාගෙන එ මනුස්සයගේ පැත්ත හැරුනා....

" කියාරා... ඔයාගේ අක්කා මං ලග ඉන්නෙ කියල ඔයා දන්නවනෙ... ඉතින් අක්කට මන් පට්ටම සැපක් දෙනවා... ඉතින් මන් කියන්න ආවෙ මට තියෙන සල්ලි වලට ගෑනු දෙන්නෙක් මට වැඩි නෑ... මන් කියන එක ඔයාට තෙරෙනවනෙ...." ජරා විදිහට උගේ රැවුල අත ගාන ගමන් එහෙම කිවා...

දැන් කලබල වෙලා බෑ... මෙයා බය නැතුව ඔහොම දෙයක් කරන්නෙ මොනව හරි මට විරුද්දව පාවිච්චි කරන්න දෙයක් තියෙන නිසා...

" හ්ම් .. ඉතින් " මන් සාමාන්‍ය විදිහට ඇහුවා...

" I wanna a one night with you .... " ( මට රැයක් ඔයත් එක්ක ඉන්න ඔනේ..) කිසිම හිරිකිතයක් නැතුව ඒ මිනිහා කියල දැම්මා...

ඕවා මට නුපුරුදු දේවල් නෙවෙ.. මොනවා හරි වැඩක් කරගන්න , උදව්වක් ඉල්ලගන්න යද්දි හැම මිනිහම කතා කරන්නෙ බුදියන්න තමා... මං මේ ඉන්න තැනට එන්න මට ගොඩක්ම අමාරු උනෙත් ඒකමයි...

එහෙම දේවල් බලාපොරොත්තු නොවී මට උදව් කරපු මිනිස්සු හිටියේ අතේ ඇඟිලි ගානටත් අඩුවෙන්... ඒ මිනිස්සුන්ට අදටත් මං සලකනවා..

" if i refuse it ??" ( මන් ඒක ප්‍රතික්ශේප කලොත්)

" then this will be public ...." (එතකොට මේක ප්‍රසිද්ධ වෙයි...)

එහෙම කියපු මේ මනුස්සයා මට පෙන්නුවෙ මගේ විඩියෝ එකක්.. ඇත්තටම මන් ඒ විඩියෝ එක ගැන දැනුවත්ව හිටියේ... මොකද මගේ ජීවිතේ මන් ගොඩක්ම ආදරේ කරපු කෙනෙක් එක්ක හිටිය විඩියෝ එකක් තමා ඒ...

ඒක විඩියෝ කරේ අපි දෙන්නගෙම කැමැත්තෙන්... අපි දෙන්නගෙ සම්බන්දය ඉවර වෙලා ගොඩක් කල්... ඒ ගෙදරින් මට කැමති නොවුන නිසා අපි වෙන් උනා... කැමති නොවෙන්න හේතුව තමා මට සල්ලි තිබ්බෙ නැති එක... එයාලගෙ අම්මලාට ඔනෙ උනේ ලොකු දෑවද්දක් එක්ක ලේලියක්...

ඉතින් ඒ කාලෙ මට තිබ්බෙ ඩිග්‍රිය විතරයි... ඉතින් ඒ ආදරණීය මනුස්සයගෙ තිබ්බ එකම වැරැද්ද උනේ.. ඒ වෙලාවෙ මගේ පැත්තෙන් හිටගන්න බැරි උන එක.... ඉතින් අපි වෙන් උනා...

මට දැනගන්න ඕනේ උනේ මේ මනුස්සයට කොහෙන්ද ඒ විඩියෝ එක කියල... මෙයා ඒක කියන්නෙ නෑ කියල මන් හොදටම දන්නවා...

" මොකද කියන්නෙ බෙබී... ඩීල් එකට කැමතිද"

" ඉතින් මට මොනවද ඔකෙන් ලැබෙන්නෙ මිස්ටර් සූසා.. මගේ මිඩියා යූනිට් එකට ඕක ඩවුන් කරන එක මහලොකු දෙයක් නෙවෙනෙ... අනික මන් දැන් ඉන්න සොසයිටි එකෙ සෙක්ස් කියන්නෙ මැජික් එකක් නෙවෙ"

එහෙම කියපු මන් ටිකකට කලින් ගෙනල්ලා දුන්න කෝපි එක තොල ගෑවා..

" ඔයාගෙ සොසයිටි එකට මැජික් නොවුනට , ඔයාගෙ ස්ටූඩන්ට්ලට මැජික් එකක් වෙයිනෙ... තරුණ කොල්ලො ඔවාට කැමතිනේ... මේක ඉන්ටනෙට් එකට ලීක් නොකර මන් ස්ටූඩන්ට් කෙනෙක්ට දුන්නොත්????? " කට කොනෙන් හිනා වෙන ගමන් ඌ කීවා...

දෙවියනේ... එතකොට නම් වැඩෙ කෙලවෙනවා... මන් දැන් මොකද කරන්නෙ....

## 17 කොටස

ඇත්තටම සෙක්ස් කියන්නෙ මැජික් එකක් නෙවෙ.. ඒ උනාට ලංකාවට එහෙම නෑ... විශේෂයෙන් තමන්ගේ ලෙක්චරර් ගේ ලීක් උන විඩියො එකක් රස කර කර බලන්න ලමයින්ට පුලුවන්..

පස්සෙ එයාලා මන් දිහා බලන විදිහ සම්පූර්නයෙන් වෙනස් වෙනවා... ලෙක්චරර් කෙනෙක් විදිහට ගෞරවණීය විදිහට මන් දිහා බලපු එයාලා... ග$&& වක් විදහට මන් දිහා බලයි... මට කොච්චර සල්ලි තිබ්බත් වැඩක් නෑ එතකොට.....

මොකක්ද මං මේකට කරන්නෙ....

මට තීරණයක් ගන්න පැය 24ක් දිලා සූසා ගියා... විඩියො එකෙ කොපිස් එයාගෙ කම්පැනි එකෙ ලගම අය ගාවත් තියෙනවා කිවා පෙන් වල දලා...

ඒක නිසා මට කිසිම දෙයක් එයාට විරුද්දව කරන්න එපා කියල තමා තර්ජනය කරල ගියෙ...

මන් කලබල වෙලා කිසිම දෙයක් කරන්න බැ... කලබල වෙන්න බෑ කිවාට ඇත්තටම මන් කලබල වෙලා ඉන්නෙ...

මන් මුලින්ම මගේ PA ලගෙන් මන් ගොඩක්ම කිට්ටු රශිකාට එන්න කියල ඔක්කොම විස්තරේ කිවා.. ඒවා පිට යයි කියල මට බයක් නෑ.. මොකද මන් යටතේ ඉන්න අය මගේ නිතී වලට යටත්ව ඉන්න නිසා...

පස්සෙ මගේ ගාඩ් එකෙ මිඩියා එකෙ හෙඩ්වයි එකෙ වැඩ කරන කොල්ලො ටිකකුයිඑක්ක මිටින් එකක් ලැස්ති කරන්න කියල රශිකාට කිවා...

මන් මුලින්ම කරන්න ඔනේ දේ මන් කරා.. ඒ තමා කාලයක් ආදරේ කරපු කෙනාට කෝල් එකක් ගත්ත එක...

" මෙ මං "

" මට හම්බෙන්න ඔනේ මෙ දැන්ම...."

" ඔව් ... ඔව්... .... හරි "

මිඩියා යුනිට් එකත් එක්ක මිටින් එකක් ගත්තේ විඩියෝ එකෙ අනෙක් කොපිස් වලට මොකද කරන්නෙ දැනගන්න...

කොහොම හරි අපි පොඩි ප්ලෑන් එකක් ගැහුවා...

පස්සෙ මිටින් එක ඉවර වෙලා මන් කෙලින්ම ගියේ රටේ ප්‍රධාන පෙලෙ අවන්හලටකට...

" ගොඩ කාලෙකින්..." එයා මාව පිලිගත්තා මල් පොකුරක් දිලා... මගේ හිතේ තියෙන කලබලේට ඒකෙන්ම අනික් පැත්තට දෙකක් අනින්න හිතුනේ මට...

මන් ගස්සගෙන වාඩි උනා...

" මොකද මෙ.. මොකක්ද ප්‍රශ්නේ ??? " එයා කලබල වෙලා...

" මෙ.. මන් ආවෙ දෙයක් දැනගන්න.. හැබැයි මේ දේ ඔයා දැනුවත්ව වෙලා තිබ්බොත් මන් නරක ගැනි කියල කියන්න එපා... "

" වීනස්... මොනවද මේ කියන්නේ...." හැමෝටම කියාරා උන මන් එයාට වීනස්... වීණාවි කියන කැල්ල නිසයි එයා එහෙම කතා කරන්නෙ...

" අපි දෙන්නගෙ විඩියො එකක් පෙන්නලා මිනිහෙක් මාව බ්ලැක් මේල් කරනව... " මන් සුසුමක් හෙලලා කීවා...

" මොන විඩියො එකක්ද? "

" අපි පලවෙනි පාර හොටෙල් එකකට ගියපු දවසේ එක... දැන් අවුරුදු කීයක් වෙනවද ඒකට ... කොහොමද ඒක වෙන මනුස්සයෙක් අතට ගියේ...." මන් ටිකක් සැරෙන් ඇහුවෙ....

" වීනස් ...මොනාද මේ කියන්නෙ.. මන් ලග ඒ විඩියෝස් දැන් නෑ... මන් මැරි කරන්න කලින් ඒ ඔක්කොම ඩිලිට් කරලා ෆොන් රිසෙට් කරා..." එයා විශ්වාසයෙන් මගෙ ඇස් දෙක දිහා බලලම කීවා...

එයා අම්මලගේ කීමට විවාහ වෙලා දැන් අවුරුදු දෙකක්... අපි අතරේ දැන් කිසිම සම්බන්දයක් නෑ... ඒ කාලෙන් පස්සෙ අපි හම්බුන දෙවනි පාර මේ...

මෙයාව සැක කරන්න කිසිම හේතුවක් නෑ මට...
මේ විඩියො එක තිබ්බෙ එයා ලගයි මන් ලගයි විතරයි...
කොහොමද ඒක ලීක් උනේ.....

මන් කල්පනා කරේ ඒක ගැන...

" Oh my god " .......

# 18 කොටස

එතකොට මට එක පාර මතක් උනේ ඒ කාලෙ හිටිය මගේ අවස්තාවදී යාලුවෙක්ව...

මන් කැම්පස් එකෙ මුල් කාලෙදියි අරයා එක්ක යාලු උනෙ.. ඉතින් ඒ කාලෙදි මන් මගේ හැම දෙයක්ම කිවේ ඒ යාලුවට...

මන් කැම්පස් ආවම අපි හිටියේ එකට මගේ හොදම යාලුවා එයා වෙන්න ලොකු කාලයක් ගියේ නැ...

මට ඉතින් ඒ කාලෙ ලොකුවට වියදම් කරන්න සල්ලි තිබ්බෙ නෑ. එයා ටිකක් පෝසත් කෙනෙක් .. එයා සමහර වෙලාවට මට උදව් කරලත් තියෙනවා.. ඊට වඩා කරපු දුශ්ටකම් නම් වැඩි... ඒ කාලෙ මට එවා තෙරුනේ නැ...

එයා ගොඩක්ම මාව ආශ්‍රය කලේ මට හොදට ඉගෙන ගන්න පුලුවන් නිසා... එයාගෙ වැඩෙ හැමදාම කාගෙ අඩුපාඩුවක් හොයන් දවසම ඒක කියවන එක... මන් ඒ කාලෙ ඒවට උල්පන්දම් දුන්නා.. පස්සෙයි මට හිතුනේ එයා මන් ගැනත් එහෙම අනික් අය එක්ක කියවනවා ඇති කියල...

ඉතින් ඒ කාලෙ මගෙ ෆොන් පාස්වර්ඩ් එහෙම එයා දන්නවා... දවසක් මගේ ෆොන් එකෙන් එයා නොට් වගයක් එයාගෙ වට්සැප් වලට දාගත්තා.. එ වෙලාවෙ එතන යවල, ඩිලිට් කරපු දෙයකුත් තිබ්බා .... මන් එයාගෙන් ඒක අහපුවම එයා කිවෙ වැරදිලා ආව ෆොටො එකක් කියල...

මට ඒක එද ගානක් ගියේම නැ... අපි ඩිග්‍රිය අරන් ඉවර උනාම මන් මෙ බිස්නස් එක පටන් ගත්තම එයා මට අනන් මනම් කිවා.. මේක හරියන්නෙ නැ කිවා... මට බිස්නස් කරන්න බැ කිවා.. එයා බය උනා මන් එයාලට වඩා පෝසත් වෙයි කියල...

ඒ දවස් වල අපේ යාලුකම ටික ටික පලුදු උනා... මගේ ප්‍රේම සම්බන්ධයත් ඊට කාලෙකට පස්සෙ නැවතුනා...

මට හිතාගන්න බැ ඇයි එයා මේ විඩියො එක මෙච්චර කල් හංගන් හිටියේ කියල...

මට හොදටම සුවර් මගේ පැත්තෙන් ඔය වැරැද්ද ඇරෙන්න වෙන කිසිම දෙයක් උනෙ නැ කියල... කොච්චරද කියනවනම් ඒ කාලෙ ඉදන්ම ඒ විඩියො එක තියෙන ෆෝන් එක තියෙන්නෙ ආරාක්ශිත තැනක , මට විතරක්ම ලං වෙන්න පුලුවන් තැනක...

" මන් ඔයාව විස්වාස කරනවා... ඒ උනාට ඒ විස්වාසය කැඩිලා තිබ්බොත් වෙන දේ ඔයාට හිතාගන්න බැරි වෙයි...."

" වීනස්... එහෙම දෙයක් වෙන්නෙ නෑ.. "

" හ්ම් ... කොහොමද සැපසනීප එහෙම... අම්මලාට එහෙම කොහොමද ???"

" හොදින් ඉන්නවා.. ඔයා එක්ක හිටිය තරම් හොදින් නෙවෙ.. අම්මලා ඔයා ගැන මතක් කරනවා දැන්.. අපරාදේ ඒ කාලෙ විරුද්ද උනේ කියල..."

" හ්... ඒ දැන් මට සල්ලි තියෙන නිසානෙ.. මන් ඒ කාලෙ හිටිය විදිහටම හිටියනම් කියයි ඔහොම ... සල්ලි නිසා මිනිස්සු වෙනස් වෙන තරම්...."

එහෙම කියපු මන් නැගිටලා ආවා... ඒ එද්දිමයි මන් දැක්කෙ කවුරු හරි මගෙ ෆොටො එකක් ගහගෙන අනිත් පැත්ත හැරෙනව... මගේ වෙලාවට මන් මගේ බොඩි ගාඩ්ව ඩිරෙක්ට් කනෙක්ට් කරගන්න පුලුවන් බ්ලූටූත් උපකරණයක් කනේ රදවන් හිටියෙ...

මන් විදනයක් දුන්න ගමන් රෙස්ටොර්ටන්ට් එක ඇතුලේ හිටපු බොඩිගාඩ් එහෙම් නැගිටලා ෆොටො එක ගහපු මිනිහට සැක නොහිතෙන විදිහට ඒ පැත්තට ගියා...

දෙර ලග හිටිය බොඩි ගාඩුත් හිමීට මගේ පැත්තට ආවා...

කොහොම හරි ඒ මනුස්සයව අල්ලගෙන සෙනග නැති පාලු තැනකට එක්කන් ගියා.. මන් එතනට යද්දීත් එ මනුස්සයා සැහෙන ගුටි කාල....

" කාගෙ උවමනාවකටද කියල දැනගත්තද ??? " මන් ඇහුවෙ බොඩිගාඩ්ගෙන්...

" අපො ඔව් මැඩම් දෙකයි ඇන්නෙ.. ඔක්කොම කීවා.. සූසාගෙයි ටෙහාරගෙයි වැඩක්.... "

" හ්... සූසාට හරි හමන් මිනිහෙක්වත් ගන්න බැරි තරම් බංකොලොත් වෙලා නේද... ඒකනේ මාව බ්ලැක් මේල් කරන්නෙ... "

මන් ඒ මිනිහා ලගට කිට්ටු උනා...

" සූසා දුන්නා වගේ 4 ගුණයක් මන් ගෙවනව... මට ඔන වැඩෙ කරපන් " .......

# 19 කොටස

" මූ..ව රිලිස් කරලා , කරන්න ඔනෙ වැඩෙ කියන්න.. " එහෙම කියපු මන් එතනින් ආවා...

මිඩියා ටීම් එකෙ ඉන්නවා දක්ශ හැකර්ලා කිහිප දෙනෙක්... එයාලාගෙ වැඩ වලට සූසා ලග ඉන්න මිනිහෙක් ඔනේ.. ඒක නිසාමයි මන් අර මිනිහව සල්ලි වලට ගත්තෙ...

කොහොමත් තව පැය 12ක් වගේ තමා ඉතුරුවෙලා තිබ්බෙ...

මන් ආපහු සැරයක් මගේ මිඩියා ටීම් එකත් එක්ක මිටින් එකකුත් අරන්, කරන්න ඕනෙ වැඩ ටික කතා කරගත්ත...

" හෙලෝ .. ඇමතිතුමා... "

" ඇමතිතුමාගෙන් මට උදව්වක් ඔනේ..."

" සූසාව දන්නවනෙ... මිනිහගේ එක්ස්පොර්ට් , ඉම්පොර්ට් ලයිසන් එක කැන්සල් කරන්න ඔනෙ.. "

" ඇමතිතුමාගේ ජන්ද වියදම් මන් බලාගන්නම්.."

" බොහොම ස්තූතියි... ඇමතිතුමා..."

මන් කතා කරේ රජයේ ප්‍රබල ඇමති කෙනෙක්ට...
මාත් එක්ක ඩීල් දාලා සූසා කරේ එසෙ මෙසෙ වැරද්දක් නෙවෙ...

ඊලගට මන් කෝල් කලේ ආදායම් බදු දෙපාර්තමේන්තුවෙ ප්‍රධානියට..

" සූසාගෙ කම්පැනි එක වටලන්න.. අවශ්‍ය ඩීටෙල් ඇමති තුමාට යවල තියෙන්නෙ... "

මන් කීවෙ එච්චරයි...

සූසාගේ මනුස්සයා අපිට ඔනේ කරන දේවල් වල විස්තර එව්වා.. උගේ කම්පැනිඑකෙ VIP රූම් වල CCTV චෙක් කරද්දී තමා මගේ විඩියො එක එයාගෙ අතට ගියේ කොහොමද කියල මන් දැනගත්තෙ...

ඊටපස්සෙ ඌ එවගේ කොපිස් කාටද දුන්නෙ කියලත් අපි ඒවා මාර්ගයෙන් හොයාගත්තා.. ඒ ඔක්කොම ඒ කම්පැනි එකෙ ඩෙක්ස්ටොප් වල සෙව් කරල තිබ්ලා තියෙන්නෙ..

ඒ කම්පැනි එකෙ මේන් සිස්ටම් එක හැක් කරන එක ලොකුවට අමාරු උනෙ නැත්තේ.. අපි අපේ තව කෙනෙක්ව මේ කම්පැනි එකට දලා තිබ්බ නිසා.. රිකවර් කරන්න අමාරු වයිරස් බග් එකක් ඒවාට දපු අපි ඒ වැඩෙ ඉවර කරා...

ඊලගට මන් කතා කරේ රටේ ප්‍රබලම කාන්තා ව උන ජනාධිපති ආයිෂාවට ...

"මැඩම්... කොහොමද ඉතින්... !
" ඔව් මැඩම්... උද්දවක් ඉල්ලගන්න කතා කරේ..."

" මන් දන්නවා මැඩම් ඒක... මැඩම් මට නොකරන උදව් තියෙනවද ..."

"ඔව් මැඩම් මන් විස්තර මැඩම්ගෙ සෙකට්‍රිට එව්වා.. "

" අනෙ තැන්කු මැඩම් .. ඔව් මැඩම් ..."

මේ ඔක්කොම වැඩ ඉවර වෙද්දි ඉතුරු වෙලා තිබ්බෙ පැය දෙකක් වගෙ...

මන් සූසාට කතා කරා...

" I accept your deal ..." ( මන් ඔයාගේ ඩීල් එක බාරගන්නවා..

"Meet you at shanella pub , sharp at 9 morning "

එහෙම කියපු මන් ඌ කියපු ජරා කතාවකුත් අහන් ෆෝන් එක කට් කරා...

## 20 කොටස

මන් උදේ 8 . 45 වෙද්දිම ඒ pub එකට ගාවට ගිහින් මගේ වාහනේට වෙලා හිටියා...

ඔක්කොම මගේ පැත්තට වාසි වෙන්න විසඳුනාට , මොකක් හරි අඩුපාඩුවක් උනා කියල මට දැනුනා...

මොකක් වෙන්න ඇතිද ????

" මැඩම් ... මිඩියා වලින් ඉන්නවා... " මගේ කල්පනා කීරීම නැවතුනේ මගෙ බොඩිගාඩ් ගේ කටහඬින්...

" මොකක්ද?"

" ගොසිප් චැනල් කිහිපයකින්ම ඇවිල්ලා පබ් එක ඇතුලේ නොමල් විදිහට ඉන්නවා.. සුවර් එකටම සූසාගෙ වැඩක් වෙන්න ඇති මැඩම්"

මන් සූසාට කෝල් එකක් ගත්තා...

" සූසා.. පබ් එකෙ මිඩියා වලින් ඉන්නවා.. එයාලාව දැන්ම යැව්වෙ නැත්තනම් මන් එන්නෙ නෑ.. "

" මාව බ්ලැක්මේල් කරනවා කියලා තමුසෙ කියන හැම දේටම ඔලුව වනයි කියල හිතන්න එපා.. මාව නරක ගැනි නොකර ඔය මිඩියා කාරයන්ට යන්න කියනවා.. "

... හ්ම්... තාම මගේ හිතේ ඒ අමුතු ගතිය තියෙනවා...

" මිඩියා හෙඩ්ට මාව දාන්න..." මන් බොඩිගාඩ්ට කීවා...

" ටෙහෙරාගෙ ෆොන් එක හැක් කරන්න පුලිවන්ද ?? "

" එහෙමද... ටෙහාරා ඉන්න තැන බලාගන්න පුලුවන්නෙ නේද ?? "

" බලල කියන්න්කො ... මන් ඉතුරු ටික කියන්නම්.. "

ෆොන් එක ලග නැතුව හැක් කරන එක කරන්න බෑ.. ඒක නිසයි මන් ටෙහාරා ඉන්න තැන හොයන්න කිවේ..

ටෙහාරගෙයි , ජනොද්‍යගෙයි ෆොන් වලට මන් ට්‍රැකර් එකක් දලා තිබ්බෙ...ඒ නැන්ද මැරෙන්නත් කලින් ඉදලම ...

" මැම් , ටෙහාරාගෙ ලොකෙශන් පෙන්නනෙ ශොපින් මෝල් එකක් කිට්ටුව... "

" එකෙ සිකුරිටි එකක් තියෙනවනෙ.. එතන ෆොන් තියන්න ඔනෙනෙ ඇතුලට යන ටිකට ... එතන ක්‍රවුඩ් එකක් හදන්න... මිඩියා එකෙ කෙනාට යන වෙලාව එතනින් අරන් දෙන්න... "

සාමනේ‍යන් ලොකු ශොපින් මෝල් වලට යද්දි , සෙකුරිටි එකෙන් කියනවානෙ පොන් , වෙන ඉලෙක්ට්ක් උපාංග තියෙනවනම් වෙනම තියල , සෙකුරිටි බීම් එක හරහා යන්න කියල.. එතනින් ටෙහාරගෙ ෆොන් එක හැක් කරන්න තමා අපි හැදුවෙ...

මට ලොකු විශ්වාසයක් නෑ.. සූසා ඒ විඩියෝ එක ටෙහාරට දීලා ඇති කියල... මොකද එහෙනම් මේ වෙද්දි වෙන්න ඔනෙ දෙවල් ටික වෙලා ඉවරයි...

ඔයාලා බලනවා ඇති මන් සූසට අච්චර ගින්නක් පත්තු කරල තියෙද්දී ඌ ගානක් නැතුව ඉන්නෙ ඇයි කියල.. ඇත්තටම ඒ ඔක්කොම මන් කරේ උදේ 9- 10 ත් වගේ අතර පත්තු වෙන්න...

මුලින් ගත්තොත් ලයිසන් එක.. ඊයේ රෑ ඒකට ඇමතිතුමා ඔර්ඩර් එක දුන්නට.. ඔක්කොම ප්‍රොසෙස් වෙලා එද්දි උදේ වෙනව.. මන් හරි නම් 9.30 ට විතර තමා සූසට ඒක ආරංචි වෙන්නෙ..

පස්සෙ එයාගෙ සිස්ටම් හැක් කිරීම , එයාගෙ කම්පැනි එකෙ වැඩ පටන් ගන්නෙ 9ට... අපි දාපු බග් එක වැඩ කරන්නෙ කම්පැනි ප්‍රයිවට් මැටර් ගැන සර්ච් කරොත්...

ඒ කියන්නෙ දැන් ලයිසන් එක කැන්සල් උනා කියල සූසා දැනගත්ත ගමන්.. කම්පැනි එකෙ මොකක් හරි වැරද්දක් උනාද බලන්න එහෙ කම්පියුටර් වලට ලොග් උනාම එක පාරම සිස්ටම් ඩවුන් වෙනව... එතකොට සූසව රත් වෙනවා...

ඒ අස්සෙ උදේම ඉන්කම් ටැක්ස් එකෙන් කම්පැනි එක ඇතුලට පැන්නම ඌ තවත් කන්ෆියුස් වෙනවා... සාමන්‍යෙන් ඉන්කම් ටැක්ස් එකෙන් ලොකු වැඩක් නොවුනට , ඇමති කෙනෙක් මාර්ගයෙන් අපි වැඩෙ කරපු නිසා.. ටිකක් ලොකු ඉෆෙක්ට් එකක් වෙන්න පුලුවන්..

මන් ජනාධිපති ආයෑවට අරන් ඉල්ලපු උදව්ව තමා .. මන් අර කියපු මගේ කලින් යාලුවා එක්ක එකතුවෙලා සූසා කරන ස්පා එක වටලන්න කියන එක ...
ස්පා කීවට පොඩි කෙල්ලො දාගෙන කරන මහා පරිමාණ ග..ණි..ක.. නිවාසයක් ඒක...

සූසට වැඩිම ආදායමක් එන්නෙ ඇත්ත්ටම ඒකෙන්.. ඒක ෆස්ට් ලේඩිගේ කමාන්ඩ් එකකින් වැටලුවා කියන්නෙ බේරෙන එක බොරු...

මේ ලංකාව ඇතුලේ අපි වැරදි කරන කෙනෙක්ට විරුද්ද වෙනවනම් , ඌව නීතියට අල්ලලා දෙන්නඹනෙ නම් , අපිට ලොකු කන්ට්‍රැක්ස් ඔනෙ වෙනව... නැත්තනම් ඒක හරියන වැඩක් නෙවෙ...

සූසාගේ කාර් එක පබ් එකට හරවනවා මට පේනව.. වෙලාව 9.15 යි .... සූසා බැහැලා යනවා මන් දැක්කා.. මිඩියා අය ගිහින්හිටිය නිසා මාත් බැහැලා ඇතුලට ගියා....

## 21 කොටස

සූසා අරගෙන තිබ්බේ VVIP එරියා එකක්... ඇත්තටම එතන ලස්සනයි.. ඒත් ඒ ලස්සන බලන්න මට වෙලවක් තිබ්බෙ නෑ..

මන් ඇදන් ගියේ ප්‍රසිද්ද සන්නමයක ජම්ප් සූට් එකක්...

" එන්න බබා... " සූසා එයගේ ලග පුටුව අතින් පෙන්නලා මට කතා කරා..

" නො තැන්ක්ස්... කලින්ම කිවානෙ මට ඔනේ විදිහටයි වැඩ වෙන්නෙ කියල " මත් කීවේ වෙන පුටුවකින් වාඩි වෙන ගමන් ...

" ඔකේ බෙබි... ඔයා පට්ට කෙල්ලක්නෙ ..අනික් උන් නම් මත් වචනයක් කීව ගමන් ඇදේ.. I like your attitude ...."

මට සුවර් එකක් නෑ එත් මත් හිතනවා විඩියො එක තියෙන්නෙ මෙයාගෙ පොන් එකෙ විතරමයි කියල .. අනික් කෝපිස් ටික අපි විනාශ කරානෙ...

ඒත් ඒක දැනගන්න නම් ටික වෙලාවක් ඉන්නනොනෙ.. ඉන්කම් ටැක්ස් එකෙන් පනින්නෙ මුගේ කම්පැනි එකට විතරක් නෙවෙනෙ.. ගෙදරටත් යනව... ඒ යද්දි අපේ කට්ටියකුත් ගෙදරට ගිහින් , එහෙ තියන ඩිවයිස් ඇතුලෙ විඩියො එක තියෙනවද බලලා ඒක විනාස කරයි....

"මොනවද බොන්නෙ " මගේ කල්පනාව බිදුනේ සූසාගෙ කටහඩට...

මගේ වෙලාව එනකන් නෝර්මල් විදිහට ඉන්න ඔනෙ.. ඒක නිසාම මන් කැප්චිනො එකකුයි පෙස්ට්‍රි වගේකුයි ඕර්ඩර් කරා... කැපචිනො එක නම් මේකගෙ ඔළුවෙ ගහන්න හිතෙන තරම් ජරා කතා මූ මට කීවා.. මන් ඒවා ඇහුනේ නෑ වගේ කකා බිබී හිටියා...

වෙලාව 9.35යි .. තව නම් පරක්කු කරන්න බෑ.. මෙකා කාමරේට යන්නමයි කතාව... කොහොම හරි මන් නැගිට්ටා.. එතකොටම මූට කෝල් එකක් ආවා.. ඒත් මෙකා ආන්සර් කරේ නෑ...

සූසා කාමරේට ගිහින් කමිසේ ගැලෙව්වා ... එතකොටම ආයෙ කෝල් එකක්.. ඒ පාර නම් උට තරහ ගිහින් කෝල් එක ආන්සර් කරා...

" මොනවද අයිසේ කරන්නෙ.. කෝල් ගන්න එපා කියල මන් කීවා නේද " සූසා මහ හයියෙන් කෑගහනවා...

එහා පැත්තෙන් කීව එකකට මූ හොදටම කලබල උනා...

" මොකක්... එහෙම වෙන්නෙ කොහොමද මනුස්සයෝ... කීපාරක් චෙක් කරාද ...ඕර්ඩර් එකක්වත් ඇපෘෂ උනේ නැද්ද ??? "

සූසා කලබල වෙවී කාමරේ එහෙට මෙහෙට ඇවිදිනව.. මන් සොෆා එකෙ වාඩිවෙලා එයා දිහා බලන් ඉන්නව...

" ඉන්නවකො.. ඉන්නවකෝ මන් මිනිස්ටර්ට කෝල් එකක් අරන් බලන්නම්... "

එහෙම කියපු සූසා කෝල් එක කට් කරල ඇමති තුමාට කෝල් එකක් ගන්න හැදුවා.. ඒ උනාට ඒ කෝල් එකට ප්‍රතිචාරයක් නෑ වගෙ... තුන් හතර පාරක් කෝල් කරත් ෆොන් එක ආන්සර් කරේනෑ ඒ පැත්තෙන්...

" මොන හු"/$-#? .. යකො මේ සූසාගෙ කෝල් එකක් ආන්සර් කරන්නෙ නැත්තෙ මුන් "

ඔන්න ආයෙම සූසට කෝල් එකක්..

" මොනවද ??? මොනවද ආයෙ කියන්නෙ දැන් .. කම්පියුටර් වැඩ නෑ.. වැඩ නෑ කියන්නෙ මොකක්ද මිනිහො... "

ඒ අස්සෙ සූසාගෙ අනික් ෆොන් එකටත් කෝල් එකක්.. මුටදැන් මන් ඉන්නවා කියලවත් මතක නෑ..

"හෙලෝ ... yes Zusa... speaking ???"

" මොනව... එහෙම කොහොමද අයිසෙ කරන්නෙ.. තමුසෙලට ඔච්චර ජරාව මන් දෙනවා.. දැන් මොකක්ද මේ කියන්නෙ.. "

" කාගෙ ඕර්ඩර් එකක්??? .. එහෙම වෙන්නෙ කොහොමද ඔයී.. ඔහොම ඉන්නවා මන් කෝල් එකක් දිලා බලන්නම් එතකන් කිසිම දෙයක් අල්ලන්න එපා.. "

මන් හිතන්නෙ ඒ ඉන්කම් ටැක්ස් එකෙන්... ඇමතිතුමාට කෝල් කරාට වැඩක් නෑ දැන් එයාලා ෆොන් ආන්සර් කරන්නෙ නෑ... මාත් මරු ෆිල්ම් එක මෙතනට වෙලා බලන්නෙ...

ඒ අස්සෙ සූසාගේ කෝල් කොච්චරද කියනවනම් ෆොන් එකෙ බැටරි බහින්න ඔන්න මෙන්න...

" බේබි... මට පැයක් දෙන්න මෙවා විසදගන්න... එතනක් ඔයා ඔනේ දෙයක් කරන්න..."

## 22 කොටස

" බේබි.. ඔයා ලග පවර් බැන්ක් එකක් තියෙනවද... ??"

ඔන්න නියම වෙලාව සූසා මගෙන් ඇහුවෙ මන් බලාපොරොත්තුවෙන්ම හිටිය දෙයක්...

"බෑග් එකටම කනෙක්ට් කරල තියෙන චාර්ජර් එකක් තියෙන්නෙ.. "

" මේක චාර්ජ් වෙන්න දන්න... " එක ෆෝන් එකක් මට දීලා සූසා අනෙක් එක අරගෙන එහෙම මෙහෙට කලබලෙන් ඇවිද්දා...

" හෙලෝ.... " මන් හිතන්නෙ මන් බලාපොරොත්තු උන අනෙක් කෝල් එක තමා දැන් ආවෙ...

ඒ කතා කරේ ටෙහාරා.....

" මොනවද කියන්නෙ.. ඉන්කම් ටැක්ස්... කලබල නැතුව කියපන්.. හරියට..."

ඒ අස්සෙ සූසා දත්මිටිකනවත් ඇහෙනවා මට..

" තෝ මෝඩ ගෑනී.. ඔක්කොම දිගඇරපන් එලදෙන වගේ... "

" බය උනා.. මොනවද වේ#%#*# බය වෙන්න උනෙ.. මන් අද තෝ....ව කෑලි කරනවා.. "

හත්වලාමෙ ටෙහාරා කුනු බැනුම් අහනවා..

ඒ අතර තුරේ මන් මට ඕනේ වැඩෙ කරන්න ගත්තා...

මත් සූසාගෙ ෆොන් එක මගේ බැග් එක ඇතුලේ තිබ්බ ටැබ් එකට කනෙක්ට් කරා.. එහෙම කරේ මගේ විඩියෝ එක ඒකෙ තියෙනවද බලන්න...

මගේ මීඩියා ටෙක්නිකල් ටීම් එකෙ දෙන්නෙක් මට කලින් මේ පබ් එකට ආවා.. එයාලා ඉන්නෙ එහා පැත්තේ VVIP කොටසේ... එ
යාලාත් මගේ ටැබ් එකට කනෙක්ට් වෙලා ඉන්නෙ.. එයාලා ෆොන් එකෙ ඩෙටා, මෙමරි ඔක්කොම චෙක් කරනව..
ඒකට ලොකු වෙලාවක් යන්නෙ නෑ...

ඔය ඔක්කොම වෙනකන් මත් මගේ පාඩුවෙ ෆොන් එක බල බල හිටියා...

හිතුවා වගේම එකෙත් විඩියෝ එක තිබ්ලා කියල මැසෙජ් එකක් මට ආවෙ මේ ෆොන් එක චෙක් කරපු කෙනාගෙන්...
එකත් ඩිලිට් කරල , හිස්ට්‍රි ක්ලියර් කරල වැඩේ ඉවර වෙන්න විනාඩි 10 ක් විතර ගියා...

දැන් ඉතුරු .. සූසාගෙ අතේ තියෙන ඇන්රොයිඩ් ෆෝන් එක විතරයි...
උගෙ කාර් එකෙ තිබ්බ ටැබ් , පෙන් ඩයිව් ඔක්කොම මේ වෙද්දි අපේ අතේ තිබ්බෙ..

මට දැන් මැසේජ් එක ආවෙ CID හෙඩ් , තව කීපදෙනෙක් එක්ක සූසාව අල්ලන්න එනවා කියල...

අවසාන තුරුම්පුවට වෙලාව හරි...

" හෙලෝ... ඒ ගමන මොකාද මේ..." ටෙහාරට බැනලා ඉවර වෙලා හති අරෙන්නත් කලින් ආයේ සූසාට කෝල් එකක් ආවා...

" මොනවද ගැනියෙ.. කියන්නෙ.. සූසාගේ ස්පා එකට බලපෑම් කරන්න තරම් ජගතෙක් ඉන්නවද මේ රටේ... "

" ඈ.. ෆස්ට් ලෙඩිගේ ස්කොඩ් එකක්??? ..එහෙම කොහොමද යකෝ වෙන්නෙ... "

" සූසා... " මන් කතා කරා

" බේබි ටිකක් ඉන්න..." ඔය ඉතින් කරන්න බැනෙ...

" මාත් එක්ක හැප්පෙද්දි ඔවා හිතුවේ නැ නේද මිස්ටර් සූසා... " මන් කකුලක් උඩ කකුලක් දාගෙනම අත් දෙකත් බැදගන්න ගමන් ඇහුවා...

" මොනවද තමුන් කියන්නෙ.. " සූසා කන්ෆියුස් වෙලා... ෆෝන් එකත් කනේ තියන් ඌ මගේ පැත්තට හැරුනා..

" ලංකාවෙ පවර්ෆුල්ම බිස්නස් ලෙඩි කෙනෙක් එක්ක හැපෙද්දි ඔවා ඔහොම වෙනවා... තමුන්ට ඔවා කලින් හිතන්න තිබ්බනෙ.. " මන් සමච්චලේට කීවේ කට කොනෙන් හිනා වෙන ගමන්...

සූසාට අසූ හාරදහට කේන්ති ගිහින්...

## 23 කොටස

" තමුසෙ හිතන්නෙ මගේ ඔෆිස් ෆොන් එක චාර්ජ් කරන්න කරන්න දුන්නම, ඒකට තමුන් කිසිදෙයක් නොකර ඉදී කියල මන් හිතුවා කියලද "

සූසා නක්කලේට මට කීවෙ, ඒකගේ ෆොන් එක මට දුන්න එක ගැන හිතලා...

" මන් ඔයාව Underrestimate කරෙ නෑ කියාරා.. ඔයා ඔයා ගැන ඕවර් හිතලා වගේ... ඕකේ විඩියෝ එක තියෙනවා තමා.... ඒත් මගේ පයිවිට් ඩෙටේල් කිසි දෙයක් නෑ.. "

අයේ ඉතින් උජාරුවට කියවනවා... ඒක උගේ ඔෆිස් ෆොන් එක කියල මන් දැනගෙන ගොඩක් වෙලා...

" සුස...සූසා.. මේක ඔයාගෙ ඔෆිස් ෆොන් එක කියල මන් දන්නවා.. ඔයා මේක හිතලා හරි නොහිතලා හරි මට දෙන්න ඇති... ඒ උනාට මන් මේ දේවල් කලේ ෆෝන් එක මට හම්බෙන්න කලින් ඉදලමයි..."

එහෙම කියද්දි සූසා නැගිටලා උගේ අතේ තිබ්බ ෆොන් එක උඩට උස්සලා මට පෙන්නුවා...

" උ..බ නම් හොදටම නටනවා වැඩි කියාරා... මට උ..බ එක්ක බු.දි..යන්න ඔනෙ නෑ.. මන් කරන්නම් මට ඔනේ දේ... "

එහෙම කියපු ඌ විඩියෝ එක සෙයා කරන්න ලැස්ති උනා..

ඒ උනාට එක පාරටම අතට පාරක් වැදිලා ෆොන් එක විසි උනේ දෙර ලගට.. සූසා ඇසූත් ලොකු කරන් අත , අනෙක් අතින් අල්ලන් හිටියා...

ඒ පාර ගැහුවෙ වෙන කවුරුත් නෙවෙ මන්... මේ කියාරා.. ජම්ප් සූට් එක ඇදන් ඒක කරන එක මහ දෙයක් නෙවෙ...

"උබ... උ..බ... " එහෙම් කියන් ඌ.. මගේ පැත්තට පනින්න හදලා ෆොන් එක ගන්න ආයෙම දෙර දිහාවට පැන්නා...

ඒ උනාට උට ෆොන් එක ගන්ම හම්බුනේ නෑ... එහා පැත්තෙ රූම් එකෙ හිටපු මගේ කට්ටිය වගේම , සූසාව ඇරෙස්ට් කරන්න ආව පොලිස් කට්ටියත් දෙරකඩ හිටියා...

සූසාගෙ ෆොන් එක තිබ්බෙ මගේ ටෙක්නිකල් ටීම් එකෙ කෙනෙක්ගේ අතේ...

" මිස්ටර් සූසා ... ඔයාට අපිත් එක්ක යන්න වෙනව... " CID ඔෆිසර් එහෙම කිවම... සූසා එයාව සතේකට ගනන් ගත්තේ නෑ...

ඌ ෆොන් එක උදුරන්න ලෑස්ති උනෙත් නෑ... එක පාරටම ඌ කනේ රදවන් හිටිය බ්ලූටූත් උපකරනයට තට්ටුවක් දලා

" අරක දැන්ම රිලිස් කරන්න.. " කියල අණ දුන්නා...

ඒ උනාට තප්පරයක්වත් ගතවෙන්න කලින් , ඒ විධානය ලැබුන කෙනා සූසාගෙ ඉස්සරහට ආවා.. ඒ ආවෙත් දෙන්නක්ගෙ උදව්වෙන්...

ඒක දැකපු පාර නම් සූසගෙ මූණ දෙක උනා...

sinhalaebooks.com

ඒක දැකලා මට නම් ඇත්තටම හිනා ගියා...

" අය්යෝ සූසා.. මන් කලින් කීවනෙ... මන් ගැන සුලුවට හිතන්න එපා... මට කරන්න පුලුවන් ඒවා ඔයා දන්නෙ නෑ... "

මට උත්තරයක් දෙන්න සූසා මගේ දිහාවට හැරෙද්දිම CID ඔෆිසර් ආයේම සූසව එක්කන් යන්න ඔනේ කියල කීවා...

" මන් එන්නෙ නෑ මිනිහො... තො..පි කවුද..?? මේ සූසා ගැන දන්නෙ නැතුවද මාව පොලිසියට එක්ක යන්න ආවෙ.."

" මන් ෆයිනෑන්ස් මිනිස්ටර්ගේ රිලේශන් කෙනෙක්.. එහෙම කෙනෙක්වද තොපි ඇරෙස්ට් කරන්න හදන්නෙ.."

සූසා ගිරිය කඩාගෙන කෑගහලා මගේ අතේ තිබ්බ එයාගෙ අනෙක් ෆොන් එක උදුරලා ගත්තෙ මට හිතන්නවත් වෙලාවක් ඉතිරි නොකර....

කාටද මන්ද කෝල් එකක් අරන් ෆොන් එක කනේ ගහගත්තා..

" ඕයි මල්ලි... මොකද මෙ වෙන්නෙ.. මෙ පොලිස්කාරයට

දෙකක් කියල ට්‍රාන්සර් එකක් දීපන්.. " සූසා එහා පැත්තේ කෙනාට කිවා.. ඊට පස්සෙ ෆෝන් එක පොලිස් ඔෆිසර්ට දික් කරා...

" කියන්න ඇමතිතුමා..." පොලිස් ඔෆිසර් යටහත් පහත් විදිහට කතා කරා...

" ඔව් .. ඇමතිතුමා... හරී.. මන් එහෙම කරන්නම්... " එහෙම කියපු ඔහු ගරුසරු ඇතිව ෆෝන් එක ආපහු සූසාගෙ අතට දුන්නා...

වැඩේ හරි වගෙ...

## 24 කොටස

" සර්, අපිට සමාවෙන්න.. අපි දන්නෙ නැතුවයි මෙහෙම ආවෙ.. " එහෙම කියපු පොලිස් ඔෆිසර්ස්ලා යන්න හැදුවා...

" ඇමතිගේ කීම අහල තමුසෙලාට යන්න හොදයි නේද එහෙනම්... මන් බලාගන්නම් තමුන්ලා ගැන මේ කියාරා ගැන දන්නෙ නැතුව තමා ඔය..."

" මැඩම් මෙ.. නිකන් බොරුවට කෑගහන්න එපා.. අපිට ඔනෙ නම් මෙ සර් වෙනුවට මැඩම්ව එක්ක යන්නත් පුලුවන්.. "

එහෙම කියල ඒ කෙනාට හැරෙන්නවත් හම්බුනෙ නෑ. විශේෂ බලකා ස්කොඩ් එකක් එතනට ආවා.. ඒක ෆස්ට් ලෙඩිගෙ ස්කොඩ් එක කියල අඳුරගන්න මහ වෙලාවක් ගියේ නෑ මට...

එහෙ බලලා මෙහෙ බලන ටිකට , සූසා පොලිස් කාර් එකක් ඇතුලේ අර CID ඔෆිසර්ලා දෙන්නත් ඒ කාර් එක අස්සෙමයි.. එයාලා යන්න හදද්දිමයි ටෙහාරාගෙන් කෝල් එකක් අවෙ සූසගෙ ෆොන් එකට...

මන් ඒක ආන්සර් කලා.. එහා පැත්තෙන් ටෙහාරා පරල වෙලා කෑගැහනවා ඇහෙන්වා...

"ටෙහාරා.... " මන් වචනයයි කීවෙ.. එයාගෙ සද්දෙ නැවතිලා ආයෙ පටන් ගත්තා ටිකකින් කියවන්න...

මන් එයාගෙ මේ මනුස්සයවත් අල්ලගත්තලු.. අරකද මේකද කියල කෑගහනවා...

" ටෙහාරා.. තමුන්ගෙ මිනිහා එක්ක එකතු වෙලා කරන්න හදපුවා මන් දන්නෙ නෑ කියල හිතන්න එපා... ඒවට

වන්දිගෙවන්න ලෑස්ති වෙලා ඉන්නව..."

එහෙම කියපු මන් කෝල් එක කට් කරල සූසගෙ ෆොන් දෙකම අර විශේෂ බලකාවෙ අයගෙ අතට දුන්නා...

" මැඩම්ට තැන්ක් කලා කියන්න මං, හෙට අනිද්දම මැඩම්ව හම්බෙන්න එන්නම් මන් ... " එහෙම කියපු මන් එයාලාට හැන්ඩ් ශෙක් කරා...

සූසාගෙ මූණ දෙක වෙලා... දැන් ඉතින් සූසා ඉවරයි...

ඒ වාහන ටික පිටත් වෙලා ගියාට පස්සෙ මගේ බොඩි ගාඩ් මන් ලගට ඇවිල්ලා දෙයක් කීවා...

" යමු "

අපි ගියේ ටිකක් වෙනස් තැනකට .. ඒක ඇවිල්ලා අත ඇරලා දාපු සයිට් එකක්... දූවිලි විමානෙ...
මන් එතනට යද්දි එතන පුටුවක වාඩි වෙලා හිටියේ මන් බලාපොරොත්තුවෙන් හිටපු කෙනා....

වෙන කවුරුත් නෙවෙ.. මගේ විඩියො ලීක් කරපු යාලුවා කියල හිතන් හිටපු කෙනා..

එයා මාව දැක්කා විතරයි , බය වෙලා නැගිට්ටා.. පස්සෙ මූණ මාව දැකලා පුදුම උනා වගේ පෙනුමකට හදාගත්තා..

කටුස්සෙක් වගේ හරියට...

" කියාර... ගොඩ කාලෙකින් අපිව මතක් වෙලා තියෙන්නෙ මෙ.. "

මන් මුකුත් කිවේ නෑ.. ඒ පාර එයා මන් ලගට ඇවිල්ලා හග් කරන්නයි හැදුවෙ... ඒ ආවට එයාට ලගට එන්න හම්බුනේ නැ.. මන් අත දිගඇරලා දුන්න කම්මුල් පාරට එයා ආපහු වැටුනෙ පුටුවටමයි...

" කියාරා...." කම්මුල අල්ලන් එයා බෙරිහන් දුන්නා..

" ඔව් කියාරා තමා... ඇයි තාම කියාරගෙ හැටි දන්නෙ නැද්ද...? ඒ දන්නෙ නැතුවද එක එකා එක්ක ඩීල දන්නෙ " මන් ඇහුවෙ පුදුම කෙන්තියකින්...

" මන්.. මන්.. මුකුත්...කලේ නැ.. මොනවද ..මේ කියන්නෙ .." එයා ඒ ගමන ගොත ගහනවා...

" අහිංසා... හ්..නමට විතරක් අහිංසා... "
එහෙම කියපු මන් එකිට ගහගෙන ගහගෙන ගියේ ඇත්තටම මගේ හිතේ තිබ්බ තරහට... මට මෙච්චර කල් කරපු දෙවල් වල තරහට...

# 25 කොටස

" උ..බට මන් මොනවද නොකලේ අහිංසා... මට සල්ලි තිබ්බෙ නෑ තමා... ඒ උනාට මන් උ..බට ඉගෙනගන්න තැන ඉදලම උදව් කරා... උ..බ ඩිග්‍රිය ගත්තෙත් මන් නිසා නෙවෙද???.... එච්චර කරපු මටද මේ කොහෙවත් යන එකෙක් එක්ක එකතු වෙලා මෙහෙම කරෙ..."

මන් ඇහුවෙ වැටිලා හිටිය අහිංසව ඇදුමෙන් අල්ලලා උස්සන ගමන්.... මන් ගහපු පාරට අහිංසගෙ තොල පැලිලා ලේ ගල ගල.තිබ්බෙ..

" අනෙ... කියාරා... මට සමාවෙන්න...."

" සමාවෙන්න... හ්... ..ඔහොම කියන උබ මගේ විඩියෝ එක ලීක් උනානම් එහෙමත් ඔහොම් කියනවද... "

මන් ආපහු අහිංසව පුටුවට තල්ලු කලා...

" දවසකට හරි මගෙ යාලුවා නිසා උ.බට මන් මෙච්චර කල් කිසි දෙයක් කරේ නෑ.. දැන් බලන් හිටපන්.. මොකද වෙන්නෙ කියල..."

එහෙම කියපු මන් එතන තිබ්බ ටිශූ බොක්ස් එකෙන්

එකක් අරන් මගෙ අත් දෙක පිහිදගත්තා...

" මෙකිව පොලිසියට අහුවෙන්න බෑ.. කොහෙට හරි ගිහින් දපන්... අනික පොඩි කෙල්ලන්ව විකුනලා ඒ සල්ලි වලින්නෙ මෙකි සැප ගත්තෙ .. ඒවට හරියන්න තැනකට ගිහින් දන්න..."

මන් එහෙම්ම ඒ බිල්ඩින් එකෙන් එලියට ආවා.. මට දැන් සමාන්‍යෙන් කේන්ති යනවා ගොඩක් අඩුයි... මොකද මට තියෙන සමාජ තත්වෙත් එක්ක එහෙම කේන්ති අරන් බැරි නිසා.. ඒ උනාට අහිංසා දැක්කම මට ඇත්තටම කේන්ති ගියා..

" සූසගෙ ගෙදරට යමු... "

ඩ්‍රයිවර්ට එහෙම කියපු මන් සීට් එකට හේත්තු වෙලා ඇස් දෙක පියාගත්තා... මේ දවස් ටික හරිම බරයි.. වෙහෙසයි... මේ දේවල් ඉවරයක් කරන් නිදහසේ ඉන්න ඔනේ ටිකක්...

මන් සූසාගෙ ගෙදරට යද්දි , එහෙට ගිහින් හිටිය පොලිසියෙ , ඉන්කම් ටැක්ස් එකෙ අයයි මිඩියා අයයි ඔක්කොම ගිහින් හිටියේ.. ගෙදර ඉන්නවා ඇත්තෙ ටෙහාරයි සර්වන්ට්ලයි විතයි්...

දොර ඇරල තිබ්බ නිසා මන් ගේ ඇතුලටම ගියා.. ටෙහාරා කඩන් බිදන් උඩ තට්ටුවෙ ඉදන් ඇවිල්ලා මට ගහන්න අතක් උස්සද්දිම මන් ඒ අත අල්ලගත්තා...

" මේ කියාරාට ගහන්න... " එහෙම කියපු මන් අත අබරලා අතැරියා....

" කියාරා උබට නම් හොදක් වෙන්නෙ නෑ... එක පාරක් මගෙ පවුල කැඩුවා දැන් ආයෙම... උබ ඇයි මෙච්චර මට වද දෙන්නෙ... "
ටෙහරා පිස්සෙක් වගේ කියවනව...

මෙයා හැසිරෙන්නෙ තිකන් මැරිලා ඉපදිලා වගෙ... මට ඇත්තටම මෙහෙම සල්ලි තියෙන නිසා මෙයාලට විරුද්දව වැඩ කරන්න පුලුවන් උනාට..

හදිස්සියෙවත් මන් සල්ලි ලොකුවට නැති කෙනෙක් උනානම් එහෙම මං මැරුණ තැන් වල ගසුත් පැල වෙලා එහෙනම්....

" ටෙහාරා... මොකද මේ මැරිලා ඉපදිලා වගේ කතා කරන්නෙ.. මට කරපුවා මතක නැද්ද???"
මන් එහෙම්ම වාඩි උනේ සෝෆා එකක ...

ටෙහාරා... මගෙත් එක්ක හැප්පුනානම් ඒකෙ වගකීම ගන්න දැන් ඉතින්... ඉස්සර කියාරා නෙවෙ දැන් ඉන්නෙ.. ඒක නිසා පරිස්සම් වෙන්න...

මන් නැගිට්ටෙ යන්න.. එතකොටම මහ හයියෙන් කෑගහගෙන ටිකක් විතර මහත ගෑනු කෙනෙක් ආවා...

" ටෙහාරා කියන්නෙ කවුද මෙතනින්..." අපි දෙන්නා දිහාම බලන ගමන් එයා ඇහුවා.. එතකොටම මන් ටෙහාරා දිහාවට හැරුනා..

එත් එක්කම ඒ ගෑනු කෙනා ටෙහාරාගෙ කොන්ඩෙන් ඇදන් පිට මැද්දට ගහ ගෙන ගහගෙන ගියේ මට හිතා ගන්නවත් කාලයක් නැතුව...

කොන්ඩෙන් ඇද්ද විදිහට මන් හිතුවෙ ටෙහාරගෙ කෙස් ගස් ටිකම එ ගෑනු කෙනාගෙ අතට ආවා කියල...

"තෝ... ප..ට්..ට බැ..$%$, ව.ල් වෙ$*#-# , අනුන්ගෙ මිනිස්සුත් එක්ක බු$##*# වේ #&#-#=#... "

හත්වලාමේ ඒ ගෑනු කෙනා කියන එවා ඇත්ත්ටම අහන් ඉන්නත් අමාරුයි .. ඒතරම් කුනුහරප එයා කියන්නෙ...

මන් හිතන්නෙ මේ සූසාගෙ නිත්‍යානුකූල බිරිද... සූසාගෙ සිද්දිය මිඩියා වල පෙන්නද්දි ටෙහාරට තමා සූසාගෙ වයිෆ්

විදිහට පෙන්නුවෙ.. ඒක දැකලා වෙන්න ඇති මේ ගෑනු කෙනා ආවෙ..

" පර$*#-# , බැහැපිය ගෙදරින් දෙට්ට... " එහෙම කියපු ගෑනු කෙනා කොන්ඩෙන්ම ඇදගෙන ඇවිත් ටෙහාරව ගෙදරින් එළියට තල්ලු කරා.. ටෙහාරා පඩිපේළි තුනකින් විතර වැටිලා රොල් වෙලා ගිහින් ගල් අල්ලලා තියෙන මිදුලට වැටුනා...

මාත් එ වෙලෙම එළියට ආවෙ අහක යන කුනු මට මොකටද කියල...

## 26 කොටස

සතියක් ඔය විදිහට ගෙවුනා... ජනොද්‍යාගෙ ලයිසන් එක කැන්සල් උනා.. ඒ උනෙත් ජාත්‍යන්තර බලපෑම නිසා...

ටෙහාරා අපි ඒ කාලෙ හිටිය ගමෙ එයල්ලගෙ ගෙදරට ගියා... සූසා නම් අන්ත හිගන්නෙක් වෙලා හිටියේ.. එයාට ට්‍රැවල් බෑන් එකකුත් දලා තිබ්බෙ...

අහිංසා මුඩුක්කුවකට ජීවත් වෙන්නෙ දැන්.....

අපෙ අම්මලත් ඔය අතරේ ලංකාවට ආවා.. එයාලා ආව සතුටට මත් ඩිනර් අවුට් එකක් ප්ලෑන් කරා...

" ලස්සන නයිට් වීව් එකක් තියෙන සෙවන් ස්ටාර් හොටෙල් එකක් බුක් කරන්න.. රූෆ් ටොප් එක තියෙනවනම් තවත් හොදයි..." මත් මගේ PA ට කීවා...

මේ සති දෙක තුනේම කැම්පස් එක පැත්තට නොගිය නිසා මත් අද කැම්පස් එකෙ ලෙක්චර් එකක් කරන්න යනව..

උසස් සන්නාමයක සුදු පාට අත් දිග බ්ල්වුස් එකට, අලු පැහැ දිගු ඔෆිස් කලිසමක් ඇදලා බෙල්ට් එකකුත් දලා, උස අඩි තියෙන සෙරෙප්පු දෙකකුත් දලා ... තමා මත් කැම්පස් එකට ගියෙ...

" Good Morning ... ගොඩක් දවසකින් තමා මත් ෆිසිකලි ලෙක්චර් එකකට ආවෙ .. ඉතින් ... මත් කැමති ඔයාලට පොඩි ටෙස්ට් එකක් තියන්න.. Are you ready guys??? "

මත් හිනා වෙලා එහෙම අහද්දි ලමයින්ගෙ මූණු දෙක උනා.. අපි කැම්පස් යද්දිත් කැමති නැනෙ ඔය ප්‍රශ්න පත්‍ර වලට...

" මේක ලොකු දෙයක් නෙවෙ ළමයි.. just to know your level ( ඔයාලගෙ මට්ටම දැනගන්න ) ...

මගේ විශය ධාරාව තමා International law in marine Environment ( මුහුදු පරිසරයට / සාගරයට අදාල ජාත්‍යන්තර නීති) .. ඉතින් ඒකට අදාල පරීක්ෂණය තියලා.. පැයක විතර ලෙක්චර් එකෙකුත් කරල මන් ගියේ විවේක කාමරයට....

" ආ.. කියාරා මිස්.. ගොඩ දවසකින් .. මොකො මෙ පැත්ත මතක් වෙලා.. " මගෙත් එක්ක තරගෙකින් ඉන්න ලෙක්චරර් කෙනෙක් මගෙන් ඇහුවා..

" Paris ගියා නේද ඩියර් ඔයා.. " ඒ ඇවිල්ල මගෙත් එක්ක ගොඩක් හිතවත් ලෙක්චර් කෙනෙක්..

" ඔව්" මන් කීවෙ එච්චරයි... මන් වැඩිය කියවන්න කැමති නෑ ඇත්තටම.. එහෙම්ම මන් පෙරලගත්තේ අලුතෙන් ම IMO ( International Maritime Organization ) එකෙන් නිකුත් කරපු සගරාවක්...

" එයාගෙ හෙන ලොකුකම... මොනවා තියෙනවා කියලද... පොත්තෙ සුද විතරයි.."

අර ගෑනි කුටු කුටු ගානවා මට ඇහෙනව...
කොහේ ගියත් මේ වගේ හොත්තුවක් ඉන්නවමනෙ...

මට වැඩක් නෑ ඇත්තටම ඔය ගෑනු එක්ක පැටලෙන්න
පැටලෙන්න.. අපේ තත්වෙයි නැති වෙන්නෙ..

" Excuse me mam.. "

" ආ .. එන්න එන්න.. " ඒ මාව හම්බෙන්න එනවා
කියල කලින් වෙලාවක් වෙන් කරගත්ත ළමයෙක්...

" වාඩිවෙන්න.. කියන්නකො මොකකද ඔයාගෙ රිසර්ච්
අයිඩියා එක... "

" මැම්.. මත් හිතුවෙ marine pollutant (සාගර දූශක
) පාවිච්චි කරල , ඒ කියන්නෙ එව Recycle ( ප්‍රතිචක්‍රී
කරණය ) ටි ශර්ට් වගේ ඇඳුමක් හදන එක ගැන.. "

" Good , එතකොට pollutant වර්ගේ මොකක්ද ඔයා
පාවිච්චි කරන්න හිතන් ඉන්නෙ.. "

" මැම්.. මත් හිතන් ඉන්නෙ නම් One time Use
plastic ගන්න.. "

" අදහස නම් ගොඩක් හොදයි..ඒ උනාට මාස 6කින් ඕක කරන්න පුලුවන්ද කියල බලන්න ඔනෙ.. මාත් ඒක ගැන හොයල බලන්න.. ඔයත් බලන්න පුතෙ.. "

**********************************

අද ගෙදර යද්දි හවස් වෙලා... මන් මගේ අපාර්ට්මන්ට් එකට යන්නෙ නැතුව බම්බලපිටියේ තියෙන ගෙදරට ගියා..

ඒ ගෙදර මන් විශේෂයෙන්ම හැදුවෙ පරිසර හිතකාමි විදිහට .. ටවුන් එකක් කිට්ටුව කියල හිතන්නවත් බැරි විදිහට...

මන් කාර් එක නවත්තදිම මල්ලි එළියට ආවා...

" අක්කා.. මේ.. ඩිනර් අවුට් යන්න ඇදුමක් නැ හලෝ.." ඔන්න මගේ දත ගලවන්න යන්නෙ...

" ඉතින්.. මට කියන්නෙ.. " මන් බොරුවට කීවා..

" අනෙ අක්කා.. කාඩ් එක දෙනවකො.. " ඒ ගමන ඇගේ වෙලිලා කෙදිරි ගානවා..

" අපෝ ආ..ආ... මේ කාර් එක එහෙම ගන්න එපා.. වෙන එකක් ගන්න... " එහෙම කියල මන් ඇතුලට ගියා..

මට කාර් 3 ක් තියෙනවා ඒට අමතරව මල්ලිට මන් අරන් දුන්න එකයි ඒට අමතරව ඔෆ් රෝඩ් එකකුයි තියෙනවා..

මන් ආසම කාර් එක තමා මල්ලිට ගන්න එපා කිවෙ.. Bugatti Divo තමා මන් ආසම කාර් එක .. ඒ කාර් එක නම් පිස්සුවක්..

ඒට අමතරව Lamborghini Aventador එකක් තියෙනවා.. මල්ලිට දීලා තියෙන්නෙ Ferarri වර්ගයේ කාර් එකක්..

අද ඇත්තටම විශේෂ දවසක්... මගේ හිතේ ඉන්න කෙනෙක් අම්මලාට අඳුන්වලා දෙන්නයි යන්නෙ...

## 27 කොටස

මන් අද ඇන්දේ මට ගිෆ්ට් හම්බුන ඇදුමක් ඒක දුන්නෙ දැන් මගේ ජීවිතේ ඉන්න වටිනම කෙනෙක්...

ඒක Swaroski crystals වලින් හැඩ උන තද නිල් දිගු ගවුමකින්... නිකන් ඩිනර් අවුට් එකකට ඒක ටිකක් වැඩී ඒ උනාට මේක මට විශේශයිනෙ..

ඉතින් මන් Swaroski Silver - Blue කරාබු දෙකකුත් දාගෙන .. මන් ලග තියෙන ලෝකේ වටිනම ඒ කියන්න USD 1 million වාගෙ උන, Shumukh කියන සන්නාමයේ පර්ෆියුම් එකෙන් ටිකකුත් කන දෙපැත්තට ඉහ ගත්තා...

මන් ඒක නිතරම පාවිච්චි කරන්නෙ නෑ...

ඉතින් ගෙදර අය ලෑස්ති උනාට පස්සෙ අපි පහලට ආවා...

" අක්ක.. මොකක් හරි හොරයක් තියෙනවා තමුසෙ..ගෙ... මොකද මෙච්චර ලස්සනට ඩ්‍රෙස් කරල " මල්ලිට තේරිලා වගේ.

" අනෙ.. මේ පාඩුවෙ යමුද ලෑස්ති උනානම්.." මන් ඒකට උත්තර නොදීම කාර් එකෙ යතුර මල්ලි අතට දුන්නා...

අම්මයි මායි පිටිපස්සට නැග්ගා..

" යාරා... නැන්දු නැති වෙලා කියන්නෙ ඇත්තද ??? "

හත්වලාමෙ අම්මට ඒක කියන්න මට අමතක උනා නෙද??

" ඔව් නේද මන් අම්මට කියන්න හිටියේ මන් දැනගත්තෙත් ලගදි.. අම්මට කවුද කීවෙ.."

" චුටි අක්කා කතා කරල කීවෙ.. මොකක්ද කරදරේකුත් උනා කියන්නෙ මල් ශාලාවෙදි..."

" ආ එහෙමද... ?? "

" අර කෙල්ලො දෙන්නා කොහොම ඉන්නවද මන්ද ...අපි වෙලාවක බලන්න යමුද "

ඔන්න දැක්කනෙ අපෙ අම්මගෙ කරුණාව ... මනෙ දෙන්නට කරපුවා අම්මා දන්නවනම් ලොකු දේශනාවක් අහන්න වෙන්නෙ . .

" බලමුකො අම්මා.. මට නම් ඔනේත් නෑ එයාලාව බලන්න.. " මන් එහෙම කියල නිකන් හිටිය...

අපි හොටෙල් එකට ආවා.. රූෆ් ටොප් එකෙ ලස්සනම ලස්සන තැනක් තමා වෙන් කරව ගත්තෙ...

අපේ අයට කන්න කැමති කෑම ඔර්ඩර් කරන්න කියල මන් ෆෝන් එක අතට ගත්තා... මන් බලාපොරොත්තු උන මැසෙජ් එක ඇවිල්ලා...

" හ්ම්.. අම්මා .. අද ඩිනර් එකට මගෙ ලගම යාලුවෙක් එනවා.. තව ටිකකින් එයා එයි..."
මන් හිමීට කීවා..

" ඒක හොදයිනේ ඉතින් " තාත්තා එහෙම කියල හිනා උනා..

එයා එනවා මට පෙනවා.. මොනවද මන්ද අතේ තියන් එනව..

" හායි... යාරා... " එහෙම් කියපු එයා මට පොඩි හග් එකක් දිලා අතේ තිබ්බ මන් ආසම වර්ගේ මල් පොකුරක් මට දුන්නා ....

" හෙලො අන්කල්.. හෙලෝ ආන්ටි..." අම්මටයි තාත්ත්ටයි කතා කරපු එයා මල්ලි දිහාවට හැරුනා..

" හායි මොඩි මෑන්...." මල්ලි හිනා උනා..

" අම්මා.. මේ ඉන්නෙ නිහාන් .. නිහාන් සිංහවංශ .. අර සිංහවංශ මොටර් කම්පැනි චේන් එකෙ ඩිරෙකර්... " මන් එයාව අම්මලට හඳුන්වලා දුන්නා..

අම්මලට් එයත් එක්ක හොදට කතා බහ කරා.. මල්ලිගෙ හිතට නම් එයාව හොදට අල්ලලා ගිහින්...

අපි දෙන්නා දැන අඳුරගෙන දැන් අවුරුදු 4ක් .. ආදර සම්බන්දය පටන් අරන් නම් අවුරුදු 2ක් විතර වෙනව... ඇත්තටම හැම දේකටම මගේ හයියට හිටියේ මෙයා තමා ඉතින්...

සූසලා ටෙහාරලා.. එතකොට මට එක එක එවා කරපු කියපු අය ඉස්සරහ මන් හයියට හිටියේ මෙයා නිසාමයි...

මගේ හිතේ තියෙන ඕනෙම දෙයක් මට එයාට කියන්න පුලුවන්.. මට අඩන්න, හිනාවෙන්න , ඔනේම දෙයක් එයා ලගදි කරන්න පුලුවන්..

කියාරා කියන දරදඩු ව්‍යවසායිකාව කියන චරිතයෙන් මිදිලා , යාරා කියන සැහැල්ලු අවුරුදු 29ක කෙල්ල වෙන්න පුලුවන් මට ගෙදරදී, එයා ලගදී විතරමයි...

" බේබි ... you look so stunning today " එයා කීවෙ මගේ අතකින් අල්ලන්..

කට්ටිය කාලා ඉවර වෙනකන් අපි දෙන්නා රූෆ්ටොප් එකෙ වීව් පොයින්ට් එකට ආවා..

" මේ ඇඳුම නම් හරිම ලස්සනයි නිහාන්... ඔයාගෙ චොයිස් එක ගැන ඉතින් අමුතුවෙන් කතා කරන්න දෙයක් නැනෙ.. "

" යා.. මගේ චොයිසස් කොහොමත් හොදයිනේ.. නැත්නම් මට ඔයාව හම්බෙනවද " නහය මිරිකන ගමන් නිහාන් කීවා..

" බේබි ඔයාලගෙ අම්මලගෙ අකමැත්තක් නැ වගේ නේද???"

" එයාලා මගේ තීරණ වලට මුකුත් කියන්නෙ නැ.. මොකද මන් වැරදි දෙයක් කරන්නෙ නැනෙ.." මන් ඇහැක් ගහන ගමන් කීවා..

" එහෙනම් දැන් ලේලිට නැන්දම්මා හම්බෙන්නයි තියෙන්නෙ... " ඒකට නම් මට බය හිතුනා...

ඩිනර් එක ඉවර කරලා අපි හොටෙල් එකෙ පහලට ආවා.. අපේ ගෙදර අය කාර් එකට නැග්ගත් මන් ටිකක් නතර උනා..

" බේබි එහෙනම් ගෙදර ගිහින් ටෙක්ස්ට් කරන්න.. මන් අර දවස ගැන ඔයාට කලින් ඉන්ෆෝම් කරන්නම්"

අපි ගෙදර එනකන්ම තුන්දෙනා කියෙව්වෙ නිහාන් ගැන.. එයාට මාර හැකියාවක් තියෙන්නෙ මිනිස්සු අල්ලගන්න..

## 28 කොටස

නැන්දම්මා හම්බෙන්න කලින් මන් හිතුවා ඔයාලට අපේ ආදර සම්බන්ධය පටන් ගත්ත හැටි කියන්න...

මන් කීවනෙ මට කැම්පස් කාලෙ අෆෙයා එකක් තිබ්බා කියල... ඉතින් එයාගෙ ගෙදරින් අකමැති නිසා අපි ඒක නැවත්තුවා....

ඇත්තටම මන් එයාවම ඔනේ කියන තැන් හිටියේ නෑ... මාව ප්‍රතික්ශේප උන තැනක මොකටද මන් ඉන්නෙ.. අනික සල්ලි වල අඩුපාඩුව මිසක් මට කිසිම අඩුපාඩුවක් තිබ්බෙ නෑ...

පලමු පෙල සමාර්තයක් එක්ක ඩිග්‍රිය ගත්ත මට සල්ලි හම්බ කරන්න බැරි කමක් තිබ්බෙ නෑ..

ඒ උනාට ඒ අම්මලට ඔක්කොටොම වඩා ලොකු උනේ සල්ලි , දැවද්ද... ඒක නිසාම මන් ඒක එහෙමම නැවතෙන්න ඉඩ ඇරියා....

කැම්පස් අවුට් වෙලත් අවුරුදු 1.5 ට පස්සෙ තමා අපි හම්බුනෙ... නිහාන් ගේ යාලුවෙක් ගේ කම්පැනි එකකට තමා මන් ඉන්ටර්න් ගියේ.. එ තැන හම්බුනේ මගෙ සුපර්වයිසර් , එහෙම නැත්නම් මගේ ලෙක්චරර් නිසා

ඒක නිසාම එකෙ අයිතිකාර කෙනා ඉක්මනින්ම මගේ යාලුවෙක් උනා... දවසක් එයාගෙ නංගිගේ බර්ත් ඩේ පාර්ටි එකට මට එන්න කිවා..

ඒ කාලෙ මට ලොකුවට සල්ලි නැතෙ.. ඒක නිසා උසස් සන්නාම වල එවා අදින්න පලදින්න පුලුවන් කමක් තිබ්බෙ නෑ... ඒ උනාට මන් මන්ම ඩිසයින් කරපු දම් පාට දිග ගවුමක් ඇදන් ගියෙ...

" හෙයි කියාරා... තැන්ක්ස් ආවට... " දේශාන් මාව පිලිගත්තා...

" ඉට්ස් ඔකෙ දේශ් ... කෝ අපේ බර්ත් ඩේ ගර්ල්..."

මත් අතේ තිබ්බ තෑග්ගත් අරන් බර්ත් ඩෙ ගර්ල් ලගට ගියා...

" හැපි බර්ත්ඩෙ ඒන්ජල්" නංගිගේ කම්මුල් දෙකම ඉබලා මත් එයාට විශ් කරා...

" තැන්ක් යූ අක්කි..."

මට ඇත්ත්ටම ටිකක් කම්මැලි මේ පාර්ටි එක.. මොකද මත් අදුරන්නෙ දේශාන්වයි එයාගෙ පවුලේ අයවයි විතරනෙ..

පාර්ටි එකට දේශන්ගෙ යාලුවොයි , එයාගෙ නංගිගේ යාලුවොයි ගොඩ දෙනෙක් ඇවිල්ලා තිබ්බා.. ඒ උනාට මත් එයාලා එක්ක වැඩිය මූව් උනේ නෑ...

" කියාරා... මෙහෙ එන්න... " දේශාන් මාව එක්කන් ගියේ එයාගේ යාලුවෝ ඉන්න තැනකට ... එතන 5, 6 ක් වගේ හිටියා...

" ගයිස්.. මේ ඉන්නෙ කියාරා.. අපෙ කම්පැනි එකෙ අලුතෙන් ආව ඉන්ටර්න්.. ඩොක්ටර් සපුතන්ත්‍රිගෙ රෙකමන්ඩෙශන් එකක්... " දේශාන් මාව එතන හිටපු අයට අදුනවලා දුන්නා..

මන් සාමන්‍යෙන් අඳුරන්නෙ නැති අය එක්ක කතා කරනවා සෑහෙන අඩුයි.. විශේෂයෙන් පිරිමි අය එක්ක...

" වාව් එහෙමද සර් ලෙසියෙන් කෙනෙක්ව රෙකමන්ඩ් කරන්නෙ නැනෙ.. " එතන් හිටිය ගෑනු ලමයෙක් කීවා.. එයා දිහා මන් බලද්දි තමා මන් මුලින්ම නිහාන්ව දැක්කෙ...

එයා මන් දිහා බලන් හිටියා... මන් ලාවට හිනා වෙලා බිම බලාගත්තා.. එයා හිනාවුනාද නැද්ද දන්නෙත් නෑ...

කොහොම හරි පාර්ටි එක ඉවර වෙන්න යද්දි මන් එතන හිටිය අයත් එක්ක ටිකක් ෆිට්වෙලා හිටියෙ.. ගොඩක්ම ගෑනු ලමයි ටික එක්ක.. එක කොල්ලෙක් නම් හොදට මාත් එක්ක කතා කරපු නිසා මන් කතා කරා...

නිහාන් මාත් එක්ක වචනයවත් කතා කරේ නෑ... මන් කතා කරන්න ගියෙත් නෑ...

කොහොම හරි පාර්ටි එක ඉවර වෙද්දි පාන්දර 3ට විතර ඇති.. ගොඩක් කොල්ලො නම් ටිකක් වෙරි වෙලා හිටියේ..

මට යන්න විදිහක් තිබ්බෙ නෑ ඇත්තටම , මොකද මන් මෙච්චර පරක්කු වෙයි කියල හිතුවෙ නෑ..
ඒ උනාට වෙලාවට දේශාන් කලින්ම කට්ටියව ට්‍රාන්ස්පෝර්ට් කරන්න වාහනයක් ලෑස්ති කරල තිබ්බෙ...

තමන්ගේ බොයිෆ්‍රෙන්ඩ් එක්ක ආව කෙල්ලන්ටත් ඒකේ තමා යන්න උනෙ.. මොකද එයාලා බීලා නිස...

කොහොම හරි ඩ්‍රයිවින් සීට් එකට දේශාන් නැග්ගම ඒකට එහා පැත්තේ එකට නැග්ගෙ නිහාන්...

අපි ඉතින් දේශාන්ගෙ ගෙදර අයගෙන් සමුඅරන් ඒ වාහනේට නැග්ගා...

ඇත්තටම දැන් කතාව නිහාන්ව ස්පෙශල් කරල කීවට මට ඒ කාලේ ලොකුවට එයාව ස්පෙශල් උනේ නෑ..

නිහාන් කියන්නෙ මට නම් හරිම ලස්සන කෙනෙක්.. කම්මුල් පුරාවට පේන නොපෙනන ගානට හදලා තිබ්බ රැවුල එක්කම නවීන මොස්තරේකට කපලා තිබ්බ කොන්ඩෙට එයා තවත් ලස්සනයි... එයාට තිබ්බෙ මෙන්ටෙන් කරන් යන බොඩි එකක්...

අදටත් මට ජිම් එකට යන එක , ඩයට් කරන එක මට මතක් කරන්නෙ එයා තමා ඉතින්...

## 29 කොටස

ඉතින් මාව බස්සන වෙලාව වෙද්දි මායි තව ගෑනු ලමයෙකුයි තමා ඉතුරු වෙලා හිටියෙ...

" කියාරා... මට කියන්න බැරි උනානෙ ඔයාට මෙ ඉන්නෙ නිහාන්... සිංහවංශ ග්‍රූප් එක මෙයාගේ.." දේශාන් කියද්දී තමයි ඇත්තටම මන් එයාගෙ නම දැනගත්තෙ...

" ආ... Nice to me you Mr Nihan... " වෙන මොනවා කියන්නද මන්... මන් ඉතින් එහෙම කීවා...

එයා ඔලුව වනලා යන්තම් හිනා උනා විතරයි.. හත්වලාමේ ලොකුකම...

" ඔයාගේ ඉන්ටර්න් ඉවරවෙලා මුගෙ කම්පැනි එකට ජොයින් වෙන්නත් පුලුවන් මූ වෙකන්සි එකක් තිබ්බොත් කියයි.. "

මන් ඉතින් කියන්න දෙයක් නැති කමට හිනා උනා... දේශාන්ගෙ කම්පැනි එකෙ මන් වැඩ කරන්නෙ ලොකු පඩියකට නෙවෙ , ඉන්ටර්න් නිසා මාස 6ක් තමා වැඩ කරන්නෙ... ඒකෙ වෙකන්සි නැති උනොත් මාස 6 න් පස්සෙ මන් අයින් වෙන්න ඔනෙ...

එහෙම කියව කියව එද්දි අපේ ගෙදර ලගටම ඇවිල්ල තිබ්බා.. ගෙදර කීවට මගේ බොඩිම

" තැන්ක් යූ දෙශාන්... මන් යනවා එහෙනම්... යන්නම් කෙල්ල... Mr. නිහාන් මන් යන්නම් " හැමෝටම එහෙම කියල මන් බැහැලා ආවා..

ඉතින් ඊට පස්සෙ මාසයක් යනකන්ම නිහාන්ව මට හම්බුනේ නෑ... මට එයාව හිටපු ගමන් මතක් උනා ඒ හැඩ රුව තියෙන වෙන අයව දැක්කම...

" කියාරා... දේශාන් සර් කතා කරා... " මගේත් එක්ක වැඩ කරන කෙනෙක් කීවා...

මන් දේශාන්ගෙ ඔෆිස් රූම් එකට ගියා.. ඒ යද්දි එයාගෙ ගර්ලුත් ඇවිල්ලා හිටියෙ... එයා නම් මාත් එක්ක ලොකුවට සෙට් වෙලා හිටියේ නෑ...

" ආ කියාරා එන්න... වාඩි වෙන්නකො "

" මන් ඔයාට කිවා මතකද සිංහවංශ ගෲප් එක ගැන...
" මොකො මට අමතක ... හොදට මතකයි...

" ඔව් .. දේශ්.. ඔයාගෙ අර යාලුවෙක්ගෙනෙ... "

" ඔව් ඔව් .. නිහාන්ගේ... එයාලගෙ කම්පැනි එකෙ

වර්ක්ශොප් එකක් තියෙනවා... මට හිතුනා ඔයාව ඒකට යැව්වොත් හොඳයි කියල... "

" ආ.. ඔයා මට ඒම දෙයක් කීවෙ නැනෙ දේශ්" දේශාන්ගෙ ගර්ල් කෙදිරිගානවා ඒ ගමන...

" ඉතින් ඔයා නෙවෙනෙ බබා ඒකට යන්නෙ... ඒක නිසා ඉතින් කිවෙ නෑ.. මේක ඔෆිස් මැටර් එකක්නෙ. " දේශාන් එහෙම කීවමනම් එයා කට පියන් හිටියා....

" මන් ඉන්ටර්න් කෙනෙක්නෙ දේශ්.. එහෙම කමක් නැද්ද?" මන් ඇහුවෙ සාමන්‍යෙන් ඕවට යන්නෙ පර්මනන්ට් අය නිසා...

" ඒක නිසාමයි මන් ඔයාව යවන්නෙ කියාරා.. ඔයාට ඉන්ටර්න් එකෙන් පස්සෙ වෙන තැනකට යන්න උනොත් කියල තමා ඒකට ලැස්තිවෙන්නත් එක්ක ඒකට යවන්නෙ... මේකෙ ඔක්කොම විස්තර තියේනව.. ඔයාට මේල් එකකුත් එවයි ඒ කම්පැනි එකෙන්... "

එහෙම කියල දේශ් මගේ අතට ෆයිල් එකක් දුන්නා...

ටිකකින් සිංහවංශ ගෲප් එකෙන් මට මේල් එකකුත් ඇවිල්ලා තිබ්බා... ඒකෙ හැටියට දවස් 3ක වර්ක්ශොප් එකක් ඒක.. සිංහවංශ ග්‍රෑප් එක විතරක් නෙවෙ..

රටේ පිලිගත්ත තව කම්පැනි ගොඩකුත් ඒකට එනව..

එයාලගෙම හොටෙල් වල අපිට ඉන්න ලෑස්ති කරල තිබ්බෙ.. සාගරය සම්බන්ද වැඩ කරන NGOs කිහිපයක්ම එදාට එන කම්පැනි අතරේ තිබ්බ නිසාම මන් හිතා ගත්තා ඒකට යන්නම ඔනේ කියලා...

සමහර විට නිහාන්වත් හම්බවෙයි...

ඉතින් මන් හවස බෝඩිමට ගිහින් අවශ්‍ය දේවල් සූදානම් කරගත්තා.. හෙට මට නිවාඩුවක් දුන්නා ඒකට ලෑස්ති වෙන්නම...

ඒ අතරේ මට කෝල් එකක් ආවා නොදන්න නම්බර් එකකින්.. මන් ටිකක් හිතලා පස්සෙ ආන්සර් කරා

" මිස් කියාරා... " ඒක ගැඹුරු කටහඩක්...

" Yes , speaking "

" I am Nihan.. මාව මතක ඇති කියල මන් හිතනවා.. "

හත්වලාමෙ.. නිහාන්.. මගේ පපුවත් ගැහෙනවා..

" ආ..ඔව්..දේශ් ගේ යාලුවා ??"
ඒකට එයාට හිනාවක් ගියා මන් හිතන්නෙ..

" ඔව් .. බට් දැන් නම් කතා කරේ සිංහවංශ ගෲප් එකෙ ඩිරෙක්ට විදිහට..."

ආ.. ඔව්නෙ... මන් හිතන්නෙ අනිද්ද වර්ක් ශොප් එක ගැන කියන්න වෙන්න ඇති...

" ඔ සොරි මිස්ටර් නිහාන්.."

" Its okey , මන් අනිද්දට දේශාන්ව මීට් වෙන්න එනව.. ඔයාට පුලුවන් මාත් එක්කම යන්න "

හැ.. මෙකා බලන්නකො.. එහෙමත් කියනවද...

" any problem miss kiyara??? " මන් මුකුත් කීවෙ නැති නිසා එයා ඇහුවා...

"Oh no .. of course not" මන් පැටලි පැටලි කීවා...

" okey see you " එහෙම කියල එයා කෝල් එක කට් කරා...

මන් එයාගෙ පර්සනැලිටි එකට වශී උනා....

# 30 කොටස

කොහොම හරි මගේ හිතෙත් මොනව හරි තියෙනවා වගේ මටම දැනෙනවා.. ඒ කියන්නෙ මන් නිහාන්ට කැමතිද.... අම්මො එයා බිස්නස්මන් කෙනෙක්.. එතකොට ඒ කාලෙ මන් නිකන්ම නිකම් ඉන්ටර්න් කෙනෙක්...

එදා උදේම මන් ඔෆිස් ගියේ සාරි එකක් ඇදලා.. මොකද ඒක තමා පලවෙනි දවසෙ ඩ්‍රෙස් කෝඩ් එක...

ඒ කාලෙ මගේ කොන්ඩෙ පිට මැද හරියට තිබ්බේ ඒක යටින් කර්ල් කොන්ඩයක්.. මන් ඉතින් රෝසයි දම් පාටයි මික්ස් උන සාරියක් ඇදලා , කොන්ඩෙ පෝනි ටෙල් එකක් දැම්මා...

ඔෆිස් ගිහින් පැයකින් විතර දේශ් මට කෝල් එකක් අරන් කිවෙ , නිහාන් කා පාර්ක් එකෙ ඉන්නවා, මට එයාත් එක්ක යන්න කියලා...

මන් ඉතින් වොශ් රූම් ගිහින් මූනට පොඩි ටච් එකකුත් දුගෙම කා පාර්ක් එකට ගියා... එයා ඇවිල්ලා හිටියෙ සෙඩාන් එකක...

මාව දැක්ක ගමන් එයා කා එකෙන් බැහැලා මට වාඩි වෙන්න දොර ඇරියා.. හැබැයි කිසිම කතාවක් නැතුව...

" Good Morning Mr. Nihan" මන්ම කීවා ඉතින්...

" Morning " දෙය්යනෙ මෙයාගෙ ඝනකම...

එතනින් පස්සෙ මන් මුකුත් කියන්න ගියේ නෑ.. අපිට හොටෙල් එකට චෙක් ඉන් වෙන්න තිබ්බෙ උදේ 10 .30 ට...

" Can we get our breakfast ???" මන් වෙන කල්පනාවක හිටියේ.. එතකොටමයි එයා ඔහොම ඇහුවෙ..

" ආ.. යා ශුවර්.. " හත්වලාමෙ මන් උදේට කාලා නේද ආවෙ.. ඒක මතක් උනෙත් නෑ මට ...

එයා කාර් එක නැවත්තුවෙ ටිකක් ලොකු , සුඛෝපබෝගී අවන්හලක... ඒ වෙද්දි නම් මට ඒවට ගිහින් කන්න බොන්න ලොකු පුරුද්දක් තිබ්බෙ නෑ...

එයා බහින්නත් මට දෙර ඇරියා... wow I am impressed...

මන් පොඩි බනිස් එකක් එක්ක කැපචිනො එකක් ඔර්ඩර් කරා. නිහාන් නම් එලවලු සැලඩ් එකක් එක්ක ජූස් එකක් ඔර්ඩර් කරේ ..

කෑම එනකම් කරන්න දේකුත් නෑ.. මොකද ඩයිනින් ටේබල් එකක ෆෝන් එක ඔබනවා කියන්නෙ එච්චර හොද දෙයක් නෙවේ...

" You look so beautiful " එයා එක පාරටම කීවා..

" ඕ තැන්ක් යූ " ඇත්තටම මට ටිකක් ලැජ්ජත් හිතුනා...
" වර්ක් ශොප් එක ඉවර වෙලා අපි ටිකක් මිට් වෙමු...
just like for a coffee date ???"

හත්වලාමෙ.. මෙහෙමත් ෆොර්වර්ඩ් කෙනෙක්.. මට කියාගන්න දෙයක් නැති උනා.. කොෆි ඩෙට් එකක්... ඒක හොද අදහසක් හැබැයි...

" ආ... මත් ඒකට හිතලා උත්තරයක් දෙන්නද??"

මත් ඉතින් එහෙම කිවා , කැමති කියල පැන පැන දෙන්න ඔනෙ නැනෙ...

"සුවර්... " එයා කිවා...

ඊට පස්සෙ අපි දෙන්නා අතර ලොකු කතාවක් උනේ නෑ.. කොහොම හරි අපි හොටෙල් එකට ගියා.. එයා එතනදිත් මට දෙර ඇරලා දෙද්දි මත් එයාට තැන්ක් කරල ඇතුලට ගියා...

ඉතින් මට එහෙදි ගොඩක් අය අඳුරගන්න ලැබුනා... ගොඩක් චාන්සස් ලැබුන.. ඇත්තටම කීවොත් මන් අද ඉන්න තැනට එන්නත් එතනින් ගොඩක් හොද රුකුලක් හම්බුන...

කොහොම හරි ඒ දවස් 3ම මට නිහාන්ව ලොකුවට හම්බුනේ නෑ. දැක්කත් යන්තම් හිනාවක් දනවා මිසක් ලොකුවට එයා කතා කරන්නෙ නැනෙ..

3 වෙනි දවසෙ රෑ තිබ්බ පාර්ටි එකෙන් පස්සෙ වර්ක්ශොප් එකෙන් පස්සෙ ඒකෙ වැඩ ඉවර උනා.. හැමොම රෑ තම තමන්ගෙ බඩු මුට්ටු පැක් කරගත්තා.. මට නම් එදා රෑ නින්දගියෙත් නෑ... රෑ 11ට විතර නිහාන්ගෙන් කෝල් එකක් ආවා...

" මොකක්ද ඔයාගෙ උත්තරේ ?? "

ඇ.. මොනවද මෙයා මෙ අහන්නෙ.. හත්වලාමෙ.. දැන් තමා මතක් උනෙ.. හිතල බලලා උත්තරයක් දෙන්නම් කීවට මට උත්තරයක් දෙන්න බැරි උනානෙ.. මන් මහලොකුවට කොෆි ඩෙට් එකට යන්න ඇදුමක් එහෙමත් ලැස්ති කරගත්ත.. තව ටිකෙන් ඒක ඇදන් ගෙදර යන්නයි වෙන්නෙ මට...

" ආ.. සොරි.. මට ඇත්තටම ඒක කියන්නත් අමතක උනා.. මන් එන්නම්.." මන් ඉතින් අමාරුවෙන් කියල දැම්මා..

" ඔකෙයි , හෙට උදේ 10 ය වෙද්දි ලැස්ති වෙලා ඉන්න.. " එයා ෆෝන් එක තිබ්බා...

## 31 කොටස

මන් ඉතින් පොඩි මෙකප් එකක් දාලා,කොන්ඩෙ කඩලා , දනහිසට ටිකක් උඩින් තියෙන අත් පටි ගවුමක් ඇදගත්තා.. ටිකක් විතර උස හීල් දෙකක් දාලා මන් හොටෙල් එකෙ පහලට ගියෙ මගේ වොලට් එකත් අරන්...

මන් පහලට යද්දිම කෝල් එකක් ආවා...

" කාර් පාර්ක් එකට යන්න .."

මන් හිමීට කාර් පාර්ක් එක පැත්තට ඇව්දන් යද්දි ඩ්‍රයිවර් යුනිෆෝම් එකක් ඇදගත්ත කෙනෙක් මගේ ලගට ආවා...

" මැඩම් , සර් කීවා මැඩම්ව එක්ක එන්න කියල .. මැඩම් නගින්න... "

මන් හිතුවෙ කාර් පාර්ක් එකෙ එයා ඉදී කියල.. මේ මනුස්සයා කීව පලියට එහෙම නගින්න පුලුවන්ද.. මන් ඒකට නගින්න අදි මදි කර කර ෆොන් එක අතර ගත්තේ නිහාන්ට කෝල් කරන්න ඒත් එක්කම මට එයාගෙන් කෝල් එකක් ආවා ...

" ඔය ඉන්නෙ මගෙ ඩ්‍රයිවර් එයා එක්ක එන්න.. " එයා මගේ හිත කියවල වගේ කීවා..

කාර් එක විනාඩි 20ක් වගේ ඇවිල්ලා නතරකරේ මාරම ලස්සන තැනක... ඒක tree house එකක හදපු කොෆි ශොප් එකක්... ලී වලින්ම හදපු පඩි පෙලකින් තමා ඒකට යන්න තියෙන්නෙ...

ගස් 6ක් හතක් වට කරගෙන ඒ මැද්දේ තමා වීදුරු වලිහදපු කොෆි ශොප් එක තිබ්බේ.. උදේ කියල නෑ ඒකෙ තිබ්බෙ ගස් වල දුඹුරු පාටටම හරියන කහ පාටට හුරු ලයිට්.. වචනයෙන් කියන්න බැරි තරම් ලස්සනයි... ඒක තිකන් මැජික් එකක් වගේ ...

මන් හිමිට උඩට නැගන් යද්දිම වෙටර් කෙනෙක් ඇවිල්ලා මට නිහාන් ඉන්න තැන පෙන්නුවා.. මන් එයා ලගට හිමිට යද්දි එයා ඇස් ලොකු කරන් මන් දිහා බලන් හිටියා...

" හායි.. " මට ලැජ්ජයිත් එක්ක.. මන් හිම්ට හායි කිවෙ එයා කන්න වගේ මගේ දිහා බලන් ඉන්න නිසාමයි...

එයා එක පාරටම පියව් සිහියට ඇවිත් හරිම ලස්සනට හිනා උනා.. දෙය්යනේ ඒ හිනාවෙ ලස්සන...

එයා එක පාරටම් ලස්සනම ලස්සන මල් පොකුරක් අරන් මට දිලා මාව හග් කරා... ඒ මල් පොකුර ලැවැන්ඩර් , එතකොට බේබි රෝස් , ලිලී , ඒ වගේ නම නොදන්න චුටි චූටි මල් ගොඩකින් හැඩ වෙලා තිබ්බෙ...

පස්සෙ එයා මගේ අතේ තිබ්බෙ කැට්බරි චොකලට් එකක්.. වාව් මෙයා නම් මාරම රොමැන්ටික් වගෙ..

මන් හිම්ට වාඩි උනා...

" ඔයා අද හරිම ලස්සනයි... " එයා එහෙම කියද්දි මට ලැජ්ජා හිතුනා.. එයා ගොඩක් වෙලාවට කතා කරන්නෙ ඉංගිලිශ් වලින්.. ඒ උනාට මේක සිංහලෙන්ම කිවෙ එයාගේ හිතටම වැදුන නිසා කියල එයා පස්සෙ කාලේක කීවා මට....

මන් අදත් ඔර්ඩර් කලේ කැපචිනො එකක්.. මන් එයාටත් කිවා අදට කැපචිනෝ එකක් බොමු කියල.. නැත්තනම් එයා කොෆී ඩේට් ඇවිල්ලත් ෆුට් ජූස් බොන්න හැදුවෙ...

කෝපි එක බොන්න ගන්න ගමන් එයාට කෝල් එකක් ආව.. එයා මගේ දිහා බැලුවේ ඒක ආන්සර් කරාට කමක් නැද්ද අහන්න වගේ.. මන් ඔලුව වැනුවා...

එය කෝල් එක ඉද්දිම මන් චොකලට් එක කැඩුවා... එයා කෝපි උගුරක් බීව ගමන් ම මන් චොකලට් පෙත්තක් දික් කලා..

එයා එහෙමම් ප්‍රශ්නාර්තයක් මූණේ රදවන් මගේ දිහා බලද්දි මන් ඇස් වලින් ඒක එයාට කන්න කිවා.. එයා මගේ අතින්ම චොකලට් එක කෑවා...

" Wow.. what a combination.. " එයා හිනාවෙලා කීවා..
" එහෙම රහයි නේද.. මන් ආසම එහෙම කැපච්නො බොන්න..."

ඔහොම ඔහොම වෙලාව ගෙවිලා යද්දි එයා මගෙන් ආස්ක් අවුට් කලා...

" නිහාන්... I have a feeling for you... but i need time to feel that " ( මට ඔයා ගැන හැඟීමක් තියෙනවා. ඒ උනාට මට ඒක දැනෙන්න කාලයක් ඔනේ)

පුදුමයි... එයා ඒකට කැමති උනා... ඉතින් ඔන්න..

එදා ඉඳල අවුරුදු 2ක් ම අපි හොඳම යාලුවො උනා.. ඇත්තටම ඒක යාලුකමට එහා ගිය බැඳීමක්.. කවින් ආදරේ නොකීවට කාලයත් එක්ක අපි ඇත්තටම ආදරේ කලා...

මගේ දුකේදී , සැපේදී හැම දේටම එයා මගේ ලගින් හිටියා.... අපි හොඳම යාලුවො කියන්න අපේ ලගින් ඉන්න ඔක්කොම වගේ දැනන් හිටියා... ඒ උනාට මන් මගේ කැමත්ත එයාට කියන්න හිතන් ඉන්න කාලෙම ... මහ එපා කරපු වැඩක් තමා උනෙ..

## 3 2 කොටස

ඒ වෙද්දී මන් ජුනියර් ලෙක්චරර් කෙනෙක්... ඒක නිසාම අතේ සල්ලි එහෙම තිබ්බා.... මට ඔනේ උනේ එයාගෙ යෝජනාවට "Yes " කියන්න..

හැබැයි ඒක එයාට වගේම මටත් මතක තියෙන විදිහට කරන්න මට ඔනේ උනා... ඉතින් හරියටම එයා මගෙන් කැමැත්ත අහලා අවුරුදු 2ක් වෙන දවසෙ , ඒ කොෆී ශොප් එකෙදිම ඒක කරන්න මන් හිතන් හිටියා.....

ඒකට දවස් 4 ක් වගේ තිබ්බා... ඒ වෙද්දිමත් ඔක්කොම ලැස්ති කරලා තිබ්බෙ.. එදා තිබ්බ විදිහටම....

කොහොම හරි දේශ්ගෙ වයිෆ්... ඒ කාලේ එයාගෙ ගර්ල්ෆෙන්ඩ් ඔයාලට මතකයි නෙ... අන්න එයාගෙ බර්ත්ඩෙ පාර්ටි එකට අපි දෙන්නටම එයාලා ඉන්වයිට් කරා...

තීම් එක ඩාර්ක් බ්ලූ කියල දේශ්ගෙ නංගි නිහාන්ට මැසෙජ් එකක් එවලා තිබ්බා කියල නිහාන් මට කිව්වා... ඒක නිසාම අපි දෙන්නා එක ලගින් යන ඩාර්ක් බ්ලූ ඇඳුම් දෙකක් ගත්තා...

මන් ඩාර්ක් බ්ලූ ජම්පින් සූට් එකක් ගද්දි නිහාන් ඩාර්ක් බ්ලූ ශර්ට් එකක් ගත්තා.. අපි දෙන්නට පාර්ටි එකට යන්න උනේ වෙන වෙනම...

දේශ් එයාගෙ වයිෆ්ට දෙන්න ගත්ත ගිෆ්ට් එක එන්න පරක්කු උන නිසා නිහාන් ගියා ඒක ගන්න.. මන් එතකොට ටැක්සි එකක් දාගෙන හොටෙල් එකට ගියා...

එතන මොකක් හරි පටලැවිල්ලක් වෙලා... ඒ හොටෙල් එකෙ අපි අඳුරන කවුරුත් හිටියේ නෑ... මට හොටෙල් එකෙ ඩිටෙල් එව්වෙ දේශ්ගෙ නංගි...

sinhalaebooks.com

මන් මුලින් දේශ්ට කෝල් ගත්තත් එයාගෙ ෆොන් එක ආන්සර් කලේ නෑ.. ඊට පස්සෙ නංගිට ගත්තා.. එයාගෙ නම්බර් එක බිසි කියල වැටුනා.. ටික වෙලාවක් ඉදලා මන් ආයෙ ගත්තත් බිසී කියලමයි වැටුනෙ...

දේශ්ගෙ වයිෆ්ව සප්‍රයිස් කරන්න කරපු පාර්ටි එකක් නිසා මන් එයාට කතා කලෙ නෑ... අවසානෙට මන් නිහාන්ට ගත්තත් එයාගෙත් නම්බර් බිසි කියල වැටුනා....

මේ මන් ආව හොටෙල් එක මහ අස්සක තියෙන්නෙ... කාටවත් කෝල් ගන්න බැරි උන නිසාම මන් ආයෙම ටැක්සි එකක් දගෙන ටවුන් එකට එන්න හැදුවෙ...

ඇප් එකෙන් ටැක්සි එකක් දගන්න හැදුවට කිසිම වාහනයක් තිබ්බෙ නෑ... මේ තැන එච්චර හොදත් නෑ වගෙ කියල මට හිතුනෙ, බොන මිනිස්සුන්ගෙ කටහඩවල් හයියෙන් ඇහුන නිසා...

මන් ඇත්තටම මාරම විදිහට අසරණ වෙලා හිටියේ... ආයෙම දෙතුන් පාරක් නිහාන්ට ගත්තට එයාගෙ ෆොන් එක දිගටම බිසි වෙලා තිබ්බෙ...

මගේ හිතට මහ අමුත්තක් දැනුනා.. මේ අවුරුදු 2ට ම මෙහෙම දෙයක් උනාමයි... මන් නිහාන්ව හොදට අදුරගෙන හිටියේ.. මේ කාලෙ ඇතුලත... එත් දැන්...

මට ඇඬෙන්න ඔන්න මෙන්න... මත් දැන් වගේ නෙවෙ ඒ කාලෙ ටිකක් ලද බොලදයි...

එක පාරටම මගෙ අනෙක් ෆොන් එකට නිහාන්ගෙන් කෝල් එකක් ආවා..

" හෙලෝ.." මට ඇඩිලා....

" නිහාන්.. අනෙ.. ඔයා කොහෙද ... ? "

එයාට මත් අඩ අඩම ඉන්න තැන කීවා.. එයා කෝල් එක අරන් තියෙන්නෙ මත් එන්න පරක්කු උන නිසා.. මගෙ අනෙක් නම්බර් එක ෆොන් එකෙ නැලු.. ඒ නිසාලු මගෙ ඔෆිස් නම්බර් එකට අරන් තියෙන්නෙ වගේ පැටලුම් සහගත එවා ටිකක් එයා කීවෙ...

හයියෙන් අඩන්නත් බෑ.. බීපු එවුන්ගේ කටහඩවල් දැන් අහලින් පහලින් ඇහෙනවා... විනාඩි 15 ක් විතර යද්දි නිහාන් ආවා.. එයා හොදටම කලබල වෙලා යට කරල තිබ්බ ශර්ට් එකත් උඩට ඇවිල්ල මූනේ දඩිය එකයි...

එතකොට මත් ඊට හපන් මේකප් ඔක්කොම දඩියට දිය වෙලා.. ඒ මදිවට මූනේ කදුලු එකයි....

එයාව දැක්ක ගමන් මත් ගිහින් බදගත්තා අඩාගෙනම... එයත් මාව බදගත්තෙ බයවෙලා.

# 33 කොටස

කොහොම හරි නිහාන් මාව වාහනෙන් ඉන්දවලා වතුර බොතලේකුත් දුන්නා.. මන් ඒකෙන් ටිකක් බීලා මූන ටිකකුත් පිහිදගත්තා....

" බබා... මොන මගුලකටද මෙහෙට ආවෙ.. මේකද ලොකේශන් එක... "

" නැතුව... දෙශ්ගෙ නංගි තමා මට ලොකෙශන් එක එව්වෙ.. මේ බලන්නකො... "

මන් පෙන්නද්දි නිහාන් මගේ ෆොන් එක අතට අරන් බැලුවා... මන් එයාට කෝල් හිස්ට්‍රි එකත් පෙන්නුවා.. නිහාන්ට කෝල් 20කට වඩා මන් අරගෙන...

ඒක දැකපු නිහාන් එයාගෙ ෆොන් එක අතට අරන් මට පෙන්නුවෙ මගෙන් එක කෝල් එකක්වත් ඇවිල්ල නැ කියල...

" ඔයාගෙ නම්බර් එක බිසි වැටුනනෙ.. නංගිගෙත් එහෙමයි.. දේශ් නම් ආන්සර් කලේ නැ "

මන් එහෙම කියද්දි නිහාන් ටිකක් කල්පනා කරලා එයාගෙ ෆොන් එකෙන් මොනවද හෙව්වා... අන්තිමට එයාගෙ ෆොන් එකෙන් මගෙ නම්බර් එක බ්ලොක් කරල , රිපොර්ට් කරල තිබ්බ නිසයි ඒක වෙලා තිබ්බෙ...

එයා තාමත් සීට් එකට ඔලුව ගහන් කල්පනාව... මාත් ජනේලෙන් එලිය බලන් කල්පනා කලේ ඒක ගැන... කොච්චර වෙලා කල්පනා කරාද කියල මතක නැ.. මන් පියවි සිහියට ආවෙ නිහාන්ගෙ කටහඩින්...

" යාරා... ඔයාට මාව විශ්වාසයි ද ?? "

ඇත්තටම නිහාන්ව මන් ගොඩක් විශ්වාස කරා.. මෙතනදි උනත් පැටලවිල්ලක් මිසක් එයා ගැන අවිශ්වාසයක් දැනුනෙ නැ... ඔයාලා හිතනවා ඇති අවුරුදු දෙකට එහෙම මනුස්සයෙක්ව විශ්වාස කරන්න පුලුවන්ද කියල... ඔව් පුලුවන්....

මන් ඔව් කියන්න ඔලුව වැනුවා....

එයා එහෙම්ම කාර් එක හරවගෙන පදවන්න ගත්තා... එක අතකින් මගේ අතක් අල්ලගෙන එයා හිටියෙ... මාව තාම ටිකක් ගැහෙනවා...

කොහොම හරි නිහාන් ආවෙ දේශ්ලගෙ දිහාට , පාර්ටිඑක ඉවර වෙලා දේශ්ලා ගෙදර ඇවිල්ලා.. දෙය්යනෙ..

එච්චර වෙලා මත් පාරෙ හිටියද... මන් වෙලාව බලද්දි පාන්දර 3 යි...

" බේබි.. බහින්න " එයා පරිස්සමෙන් මාව බැස්සුවා...මගේ අතකිනුත් අල්ලන් ඇතුලට ගියා.. ඒ යද්දිත් කට්ටිය නිදි නෑ..

එක පාරම මගේ අත අතෑරපු නිහාන් දේශ්ගෙ නංගි ලගට ගියා.. නංගිත් පුදුම වෙලා බලන් ඉද්දි එක පාරම අත දිඇරපු නිහාන් නංගිගෙ කන හරහා හයියෙන් පාරක් ගැහුවා...

" නිහාන්.." හැමෝම එක පාර කෑගැහුවා..
මන් අත් දෙකෙන් කටත් වහන් හිටියෙ බය උනු පාර...

නිහාන්ට මෙච්චර තරහ ගිහින් ඉන්නවා මන් දැක්කමයි...

කම්මුල් පාරේ සැරට නංගි බිම ඉන්දවිලා..

" දේශ්.. උබේ නංගි ... මෙකි තමා මේ ඔක්කොම කරල තියෙන්නෙ..."

" මන් මොනවද කලෙ... ඔයාගෙ මහලොකු යාරා පාර්ටියට එන්නෙ නැතුව මගුලේ ගියාම මමද පලි? " නංගි කෑගහලා ඇහුව... මන් ඒක අහල පුදුම උනා.. මොකද එයා කවදවත් මට එහෙම කතා කරල නෑ...

ඒක ඇහුන පාර නිහාන් ආයෙම යක්ශාවෙෂ වෙලා නංගි දිහාවට හැරුනා...

" මගුලේ ගියා??? තෝ.. නෙවෙද මගෙ කෙල්ලව මගුලෙ යැව්වෙ... තොට.. නංගි කෙනෙක් වගේ සලකපු නිසාද මෙහෙම කරේ "

නිහාන් දිහා බලන්නත් බයයි...

දේශ් නිහාන්ට විරුද්ධව වචනයක්වත් කිවෙ නැ..

වෙලා තියෙන්නෙ මේකයි..

නංගි හිතලම තමා අපි දෙන්නා එකට එන එක නවත්තලා තියෙන්නෙ.. මට වැරදි ලොකේශන් එකක් දුපු එයා.. දේශ් ඕරඩර් කරපු ගිෆ්ට් බොක්ස් එකත් පරක්කු කරවල .. කුරියර් එකට කියල තියෙන්නෙ එයාලා ඇවිත් ගන්නම් කියල..

ඒක ගැන දන්නෙ නැතුව දෙශ් ගිෆ්ට් එක පරක්කු මොකද බලන්න නිහාන්ව යවද්දි , නංගිත් බලෙන් ඒකට නැගලා.. එයාගෙ හිතේ තියෙන එවා නිහාන් දැන් ඉදලා නැතෙ...

නිහාන් කාර් එකෙන් බහිනකන් ඉදලා එයාගෙ ෆොන් එක ගත්ත නංගි මගෙ නම්බර් එක බ්ලොක් කරල...

නිහාන් ෆෝන් එකට පාස් වර්ඩ් දන කෙනෙක් නෙවෙ.. ඔහේ තියන් ඉන්නවා.. ඒක තමා නංගිට වාසියට හිටලා තියෙන්නෙ...

එන්න කලින් දේශ්ගේ ෆෝන් එකත් එයා , එයාගෙ බෑග් එකෙ සයිලන්ට් කරන් දගෙන ඇවිල්ලා..

ඇත්තටම නංගි නිහාන්ට කැමැත්තෙන් ඉදල තියන්නෙ, දේශ් එයාගෙ යාලුවා නිසාම නිතර නිතර නිහාන් එහෙ යන එන නිසාම නංගිගෙ හිතේ කැමැත්තක් ඇති වෙලා..

නිහාන් ඒක ගනන් අරගෙන නෑ.. නංගි පොඩි කෙල්ලෙක් නිසා නිකන් ආකර්ෂණයක් කියල නිකන් ඉදලා..

එයා ඕක මටත් කලින් කියල තිබ්බෙ.. මාත් ඒක වැඩිය හිතුවෙ නෑ..

කොහොම හරි මෙච්චර හරියක් කරල තියෙන්නෙ අපි වැඩිය ඒක ගැන හිතපු නැති නිස...

දේශ් මගෙන් සමාව ඉල්ලුවා එයාගෙ නංගි වෙනුවෙන්.. නංගි නම් බිම බලන් ඔරවන් හිටියෙ...

" දේශ් මට උබව නැති කරගන්න බෑ.. ඒ උනාට මෙහෙම උනාම මට උබ එක්ක කතා කරන්නවත් බෑ ය..කො.."

කොහොම හරි දේශ්ගෙනුත් පාරවල් දෙක තුනක් කෑවා නංගි..

මත් එහෙන් ආවෙ ඇත්තටම මාරම අවුලෙන්.. දෙශ් නිසයි මට නිහාන්ව හම්බුනෙ..

අපි වාහනේට ආවා..

" බේබි.. " නිහාන් මාව බදාගත්තා..

" I am so sorry , ඔයා ගැන මීට වඩා බලන්න තිබ්බා මට " එයා පසුතැවීමකින් කීවා..

" ඔයා මොනවා කරන්නද , එයා ඔහොම දෙයක් කරයි කියල කවුද හිතුවෙ.."

" හ්ම්.." නිහාන් මාරම අවුලෙන් ඉන්නෙ නැත්තනම් එයා මෙහෙම ඉන්නෙ නෑ..

# 34 කොටස

දේශ් ගේ නංගි ඉන්ටර්න් කලේ නිහාන්ගෙ කම්පැනි එකෙ.. නිහාන් තිබ්බතරහට නංගිව එකෙනුත් අයින් කලා...

කොහොමහරි දවස 2කින් ඔක්කොම සාමාන්‍ය තත්වයට හැරුනා...

හෙට තමා දවස...

හෙට නිහාන්ට කියන්න කාරණා දෙකක් තියෙනවා එකක්.. මන් එයාගෙ යෝජනාවට කැමති කියන එක... අනික මන් පොඩියට ඔන්ලයින් බිස්නස් එකක් පටන් ගන්නවා කියන එක...

ඔව් යාරා කොස්මැටික්ස් පටන් ගත්තේ ඔහොම.. මන් ඔන්ලයින් බිස්නස් කරන කාලෙ නම් කොස්මැටික්ස් විකුනුවෙ නෑ.. රත්‍රන් ආලේපිත ජුවලරි , වගේ දේවල් තමා මන් සේල් කලෙ...

" නිහාන්.. කොෆි ඩෙට් එකකට යන්.." මන්ම එයාට කෝල් කරල කීවා... එයා එක්කම ඉදලා මන් ටිකක් ෆෝවර්ඩ් වෙලා...

මන් එයාට තැනයි වෙලාවයි ටෙක්ස්ට් කලා...

මන් ඇන්දේ මීට අවුරුදු 2කට කලින් ඇන්ද වගේම මල් තියෙන කොට ගවුමක්...

මන් යද්දි නිහාන් ඇවිල්ලා හිටියේ.. වෙනදා වගේම මල් පොකුරකුයි , චොකලට් එකකකුයි අරන්...

" සේම් වයිබ්නෙ බබා.. " එයා මාව හග් කරන ගමන් කීවා...

" නිහාන්.. I wanna say " Yes" මන් එයාගෙ ඇස් දෙක දිහා බලන් කීවා.. එයාට එතකොටම ලස්සන හිනාවක් ගියා....

නැගිටලා මන් ලගට ආව එයා පලවෙනි වතාවට මට ප්‍රංශ හාදුවක් දුන්නා...

ඉතින් ඔහොමයි අපි දෙන්නා අෆෙයාර් එක පටන් ගත්තේ... එයාගෙ උදව් එක්කම මන් යාරා කොස්මැටික්ස් එක ගොඩනගාගත්තා..

රූපලාවන්‍ය හා විද්‍යාව ගැන මන් උපාධියක් කලා.. බිස්නස් මැන්ජ්මන්ට් පැත්ත නම් මුලදි බැලුවෙ නිහන් පස්සෙ ඒක ගැනත් මන් ඉගෙනගත්තා...

අවසානෙට නිහාන්ගෙ කම්පැනිඑකත් ඉක්මවා යන්න තරම් ලාභ ලැබුවා...

ඒ අතරෙම මන් රෙස්ටොරන්ට් චේන් එකත් පටන් ගත්තා...

ඒ අතරේ අපි දෙන්නා ට්‍රිප් ගියා , ලංකාවෙ ලස්සන තැන් වගේම පිටරට ලස්සන තැන් ගොඩක් බලන්න ගියා... අපි ගොඩක් වෙලාවට හිටියෙ Live in together ...

නිහාන්ට හරිම රහට උයන්න පුලුවන්... අපි එකට ඉන්න ගොඩක් දවස් වලට උයන්නෙ එයා තමා..

ඒ ජීවිතේ නම් පිස්සුවක්...

එයා මට හොඳටම ගැලපෙනවා කියල දැනුන නිසයි මට හිතුනේ එයාව මගෙ හස්බන්ඩ් කරගන්න ... මන් ඒක නිසා තමා ඒයාට අම්මලාව හම්බෙන්න එන්න කීවෙ...

හැබැයි මන් එයාට බඳින කතාවක් ඇගෙව්වෙ නම් නෑ මට ඔනේ උනේ outdoor වෙඩින් එකක්... හරියට Twilight ෆිල්ම් එකෙ බෙලායි එඩ්වඩුයි ගේ වෙඩින් එක වගෙ...

# 35 කොටස

" babe.. mom will meet you at our lounging party" නිහාන් එහෙම එවල තිබ්බා මට...

අපි දෙන්නා වෙන වෙනමනෙ බිස්නස් කරන් ගියේ අපි දෙන්නාම එකතු වෙලා තට්ටු 30ක අපාර්ට්මන්ට් එකක් හදන්න තමා යන්නෙ..

මේක නිවාස ව්‍යාපෘතියක්... ඉතින් එකෙ ප්ලෑන් එක එළිදක්වන්න අපි පාර්ටි එකක් ලෑස්ති කරා.. එකෙදි මාව එයාලගෙ අම්මට මුනගස්සවන්න තමා එයා ලෑස්ති උනෙ..

නිහාන්ගේ තාත්තා නම් මාව හොදට දන්නවා.. ඇත්තටම කීවොත් අම්මට මුනගස්සවනවට වඩා ආච්චිට මුනගස්සවන්න තමා නිහාන්ට ඔනෙ..

හම්බුනාම බලන්න්කො එයා මොන වගේද කියල...

ඉතින් මන් ඒ පාර්ටියට මන් වෙනුවෙන්ම හදවපු Gucci සන්නාමයේ පාර්ටි ෆ්‍රොක් එකක් තමා අදින්න ලෑස්ති කලේ.. ඒක ගොඩක් වෙස්ටර්න් පැත්තට බරයි...

සාමනෙ‍්‍යන් ලේලි පලවෙනි වතාවට නැන්දම්මව බලන්න යද්දි සාම්ප්‍රදයික විදිහට අදින්න ඔනේ උනත් මේකට නම් මට කරන්න දෙයක් නෑ..

ලංකාවෙ විතරක් නෙවෙ..ලොකේ ඉන්න ප්‍රධාන පෙලෙ බලවතුන් එන පාර්ටියකට මට ඔසරිය හරි සාරිය හරි ඇදන් යන්න උවමනාවක් ආවෙ නෑ.. මොකද මේක පාර්ටියක්.. වෙන අවස්තාවක් උනානම් මන් සාරියක් අදිනවා...

මගේ ඒ තිරණයට නිහාන් මුකුත් කීවෙ නෑ.. එයා තමා මගෙ ඇදුමට මැච් වෙන ජුවලරි මට තෑගි කලේ..

ඉතින් අලුයි කලුයි මිශ්‍ර උන ඒ දිග ගවුම දණහිසටත් ඉහලට පලලයි තිබ්බෙ..පාර්ටියටම ගැලපෙන්න ටිකක් විතර හෙවි මේකප් එකක් මන් දගත්තා..

අපේ ගෙදර අය නම් කලින්ම එතනට ගියා.. මාත් ඩයිවර් කෙනෙක් එක්ක එතනට ගියා...

මන් ගිහින් කාර් එකෙන් බහිද්දිම එතන සේවකයෙක් මට ලස්සනම ලස්සන මල් පොකුරක් ගෙන්නලා දුන්නා.. ඒක දැක්ක ගමන් මන් දැනගත්තා ඒක නිහාන්ගෙ වැඩක් කියලා..

අපි දෙන්නා පෙම්වතුන් කියල මිඩියාවලින් දැනන් හිටියේ නෑ. ඇත්තටම කීවොත් ඒ දන්නෙ අපෙ ලගම කීපදෙනෙක් විතරයි...

ලෝකෙට අපි බිස්නස් පාර්ට්නස්ලා විතරයි.. මේක අපි එහෙම තියාගත්තේ , මිඩීයා වලින් දැනගත්තම අපිට කිසිම ප්‍රයිවසි එකක් නැති නිසා..

මන් සෙටේජ් එක ලගට යද්දි , එකෙ උඩ ඉදගෙන හිටිය නිහාන් මන් ලගට ඇවිල්ලා මට පඩිපෙල නගින්න උදව් කලා...

" Babe.. I wanna kiss you right now.." එයා මගේ කනට කරල කීවා.. මන් හිනාවක් ආවා ඒකට...

තමන් ආදරේ කරන කෙනාට පෙන්න ලස්සනට ඉන්නවා තරම් දෙයක් තියෙනවද ඉතින්....

" ladies and gentlemen , You all are warmly welcome to launching party of new housing project " The athena" By Yara and Sinhawansha group.."
( නෝනාවරුනි මහත්වරුනි, යාරා සහ සිංහවංශ සමූහයේ නව නිවාස ව්‍යාපෘතිය වන "The Athena" සාදය ආරම්භ කිරීමට ඔබ සැම සාදරයෙන් පිළිගනිමු..")

The athena තමා අපේ නිවාස සංකීර්ණයේ නම... ඒක අති සුඛෝපභෝගී නිවාස 100කින් තමා සමන්විත වෙලා තිබ්බෙ..

30 වෙනි තට්ටුවෙ තියෙන්නෙ penthouse එක .. ඒක අපි දෙන්නගේ පාවිච්චිට තමා වෙන් වෙලා තිබ්බෙ..

15 වෙනි තට්ටුවෙ ඉදන් ඉහල මාලවල් ගොඩාක්ම මිල වැඩියි.. හේතුව තමා ඒවාගෙ තියෙන සුඛෝපභෝගී බව...

එහෙමයි කියල පහල තට්ටුවල ගනන් අඩුත් නෑ... රටේ ඉන්න ඉහලම පෙලෙ අයට තමා අපි මේක හදන්නෙ..දැනටමත් මෙකෙ සමහර නිවාස වෙන් වෙලා ඉවරයි...

අද තමා ඉතුරු ගෙවල් වලට අපි මිල ගණන් කියන්නෙ...

ඉතින් අපි අපේ හදුන්වාදීමේ වැඩසටහන ඉවර කරල පාර්ට් එක පටන් ගත්තේ ශැම්පේන් විදුරු ඔසවලා චියර් කරල....

# 36 කොටස

අපි ස්ටේජ් එකෙන් බැහැලා වෙන වෙනම කට්ටියට කතා කරන්න ගියා.. රටේ ඇමතිලාගෙ , මන්ත්‍රීලගෙ ඉඳන් ඔක්කොමලා ඇවිල්ල හිටිය නිසා ලොකු ආරක්ශාවකුත් දලා තිබ්බා..

අපි දෙන්නා හෝල් එකෙ දෙපැත්තකට වෙලා හිටියට මන් බලන හැම වෙලේම නිහාන්ගෙ ඇස් මගේ දිහාවට හැරිලයි තිබ්බෙ...

" Congratulation darling " එහෙම කියල මාව බදගත්තේ ජනාධිපති ආයාීව...
" මැඩම්... ඔයා ආව එක නම් ලොකු දෙයක්.. එද කරපු උදව්වට මැඩම්ට තැන්ක් කරන්නත් බැරි උනානෙ හරියට " එහෙම කියල මන් මගේ සේවකයෙකට එන්න කිවා..

"මැඩම්.. මගෙන් පොඩි තැග්ගක්... " සේවකයා අතේ තිබ්බ තෑග්ග මන් දුන්නා..

ඒක දියමන්ති 206ක් අල්ලලා තියෙන " Mrs Winston " කියන මාලය.. මුදලින් ගත්තොත් ඩොලර් මිලියන 5 ක් වගේ වෙනවා...

ඒක දැකලා මැඩම් පුදුම උනා..

" my god , දරුවෝ මේක " එයා ගොත ගහනවා ඒ අස්සෙ...

මන් ලොකේ ප්‍රකට ව්‍යාපාරිකයන් එක්ක කතා කරලා හැරිලා බැලුවෙ නිහාන් දිහා.. එතකොට එයා මගේ පැත්තට එනවා මන් දැක්කා...

" බේබි... එන්නකො එහෙනම්... " එයා ලගට ඇවිල්ලා කීවා..

" මන් ලස්සනට ඉන්නවද නිහාන්.." මන් ටිකක් කලබලවෙලා අහද්දි එයා ලස්සනට හිනා උනා...

" හ්ම්... no words babe " එයා එහෙම කීවා ..

මන් නිහාන්ගෙ පිටිපස්සෙන් ගියා.. එයාලගෙ අම්ම නම් ලස්සන හිනාවක් එක්ක මගේ දිහා බලන් හිටියා.

මහ උද්දච්ච පෙනුමක් තිබ්බ එයාලගේ ආච්චි මගේ උඩ ඉදන් පහල බලනවා මට පෙනුනා..

මන් ලගටම යද්දි එයාලගෙ අම්මා ඇවිත් මාව බදගත්තා...

" දේණි.. හරිම ලස්සනයිනේ පුතේ ඔයා.. "

මගේ කම්මුල් දෙක අල්ලගෙනම අම්මා කීවා...

" බේබි.. ඩඩාව නම් ඔයා දන්නවනෙ.. මේ ඉන්නෙ අපෙ අච්චා... " අම්මෙ නිහාන් එයාගෙ උද්දච්ච ආච්චිව හඳුන්වලා දුන්නා..

මන් ඉතින් එයාට වැන්ද.. එයා අහක බලන් හිටියා.. කියාරා... ආයේම ප්‍රශ්නයක් වගේ ...

" ඔහොමද වැදගත් ගෑනු ළමයි අඳින්නෙ පලඳින්නෙ.. " ඔන්න ඔන්න ඉතින් ආච්චි පටන්ගත්තා..

" අම්මෙ.. මේක පාර්ටි එකක් , අනික මේ තරුණ ළමයි මෙහෙම අඳින්නෙ නැතුව කොහොම අඳින්නද " නිහාන්ගෙ අම්මා ආච්චි ලගට ගිහින් කීවා..

" අනෙ මේ ශාලිකා.. උඹ මට කියල දෙන්න ඕනෙ නෑ.. අපෙ පවුල් වලට නම් මෙහෙම සක්කරවට්ටම් ඕනේ නෑ.. "

දැන් නම් මගෙ කට නලියනවා ... ඒ උනාට ඒ ගෙදරට යන්න කලින්ම කාඩ් කුඩු කරගන්න ඕනෙ නැනෙ...

" උ.බට මන් කිවා... අර රේණුකාගේ කෙල්ලව බඳින්න ලෑස්ති වෙයන් කියල.. උ.බ මේ කොහෙන්වත් සක්කරවට්ටමක් හොයන් ඇවිල්ල.. "

ආච්චි නිහාන් දිහාවට හැරිලා කිවා... නිහාන්ට තරහයාගෙන එන්නෙ කියල මට දැක්ක ගමන් තේරුනා...

" අච්චා.. මේ ඔයාගෙන් අවසර ගන්න නෙවෙ යාරාව මෙතනට එක්කන් ආවෙ මන්.. මේ ඉන්නෙ මගේ ෆියුචර් වයිෆ් .. ඒක මන් ඩිසයිඩ් කරල ඉවරයි..." නිහාන් බොහොම ඉවසීමෙන් ඒකකීවෙ...

ඇත්තටම මන් වෙනුවෙන් කතා කරන්න බැරි පිරිමියෙක්ගෙන් මට වැඩක් නෑ.. නිහාන් සාමන්‍යෙන් වැඩිහිටියන්ට ඔහොම කතා කරන්නෙ නෑ.. ඒ උනාට එයාගෙ ආච්චි මහ එක විදිහක්... එයාට ඔනේ හැමොවම පාලනය කරන්න...

" ශාලිකා.."

# 37 කොටස

" ශාලිකා... " නිහාන්ගෙ ආච්චි බෙරිහන් දෙන්න ගත්තා.. වටේ පිටේ අයගෙ අවධානය අපේ පැත්තට යොමු වෙන්න වැඩි වෙලාවක් ගත උනෙ නෑ...

" නිහාන්.. ඉවෙන්ට් එක රැයින් වෙන්න දෙන්න බෑ.. " මන් නිහාන්ගෙ කනට කරල කීවා...

නිහාන් තාත්තා ලගට ගිහින් හිමීට මොනවද කීවා... ඊට පස්සෙ තාත්තා ආච්චිව එළියට එක්කන් ගියා...

" බේබි.. සොරි මන් ආච්චා ගැන කියල තියෙනවනෙ" නිහාන් මන් ගාවට ඇවිත් කීවා...

" හ්ම්.. එයා ටිකක් අමාරුකාරියක්නේ.. " මන් හිනා වෙලා කිවා...

කොහොම හරි එදා පාර්ටි එක ඉවර උනා... නිහාන්ගෙ ගෙදරින් ආච්චි හැර අනෙක් අයගෙ අවුලක් නෑ කියල නිහාන් මට ටෙක්ස්ට් එකක් එවලා තිබ්බා...

ඉතින් දැන් තියෙන්නෙ වෙඩින් එකට ලෑස්ති වෙන්න තමා...

සතියක් විතර ගත උනා....
හෙට පාර්ටි එකක් තියෙනවා කියල නිහාන් මට කෝල් එකක් දීලා කිවා..

මන් ඒකට රතු පාට දිග ගවුමක් ඇන්දා.. ඒක නොර්මල් ගවුමක් උනාට හරිම එලිගන්ට් ලුක් එකක් තිබ්බා...

මන් හවස 7 ට වගෙ නිහාන් කියල තියෙන හොටෙල් එකට ආවා. එතකොට නිහාන්ගෙ යාලුවෙක් එලියේ හිටියා... මන් ඉතින් එයත් එක්ක කතා කර කරම ඇතුලට යද්දි හොටෙල් එකෙ එන්ට්‍රන්ස් එකෙදිම හෝල් එකෙ ලයිට් එක ඕෆ් උනා..

නිහාන්ගෙ යාලුවා එක පාරටම
" ඔ ශිට් ... මේ මොකද .. කියාරා වෙයිට් මන් බලල එන්නම් " කියල ඉස්සරහට දිව්වා...

මන් ඉතින් ඔහේ හිටන් හිටියා ඉස්සරහට යන්න පේන්නෙ නෑනෙ.. එක පාරටම හෝල් එකෙ පැත්තකින් පොඩි ලයිට් එකක් නම් පත්තු උනා...

එක පාරටම thousand years සෝන්ග් එක ප්ලෙ වෙන්න ගත්තා.... වාව් හරිම ලස්සන වයිබ් එකක් එතන තිබ්බෙ...

එක පාරටම...

" කියාරා... will you marry me?" කියල කියනවා ඇහුනා...

ඒ නිහාන් ... එයා ඒක අහද්දිම මන් ගාවත් ලයිට් එකක් පත්තු උනා....

මන් ඇත්තටම ඒකට මාරම විදිහට සප්‍රයිස් උනා...

මන් අත් දෙකෙන් කටත් වහගෙන හිටියා... නිහාන් මගේ පැත්තට එනවා මට පේනවා ..එයා අඩිය තියෙන තියෙන පාරට ලයිට් පත්තු වෙනවා...

එයා මගේ ලගටම ඇවිල්ලා...

" බේබි... " කියල කියද්දි මන් ඔලුව වැනුවෙ ඇස් දෙකට කඳුලු පිරෙද්දි...

මන් වෙනුවෙන් මෙච්චර දෙයක්...

" She said yes" නිහාන් හයියෙන් කියද්දි තමා මන් හෝල් එකෙ ඉන්න කට්ටියව දැක්කෙ... මගෙයි එයාගෙයි යාලුවෝ ගොඩක් ඇවිල්ලා හිටියා...

නිහාන් මාව බදාගත්ත්තෙ මගේ අතට රතු රෝස පොකුරක් දීලා.. මන් එහෙමම එයාව බදාගෙන ඇඩුවා....

"නිහාන්... I was so surprised" මන් එයාට හේත්තු වෙලාම කියද්දි එයා මට පුංචි ෆෙර්න්ච් කිස් එකක් දුන්නා.. හැමෝම ඉස්සරහ...

## 38 කොටස

" නිහාන්.. ඔයා ඔච්චර රොමැන්ටික් උනේ කොහොමද අප්පා.. " මන් එයාගෙන් ඇහුවෙ කීවෙනි පාරටද මන්දා...

එයා උත්තරයක් නොදී හිනා වෙවී ඉන්නවා..

ඒ පාර්ටි එක ලස්සනටම තිබ්බා.. ඒක ඉවර වෙන්න ගොඩාක් රෑ උන නිසාම අපි දෙන්නා නිහාන්ගෙ අපාර්ට්මන්ට් එකට ගියා...

මොකද පොඩ්ඩක් විතර ඩ්‍රින්ක්ස් අරන් හිටියේ දෙන්නම.....

ඇගපත හෝදගෙන දෙන්නට නින්ද යන්නෙත් නැති නිසා අපි කෝපි එකක් හදාගෙන් බැල්කනි එකට ගියා..

නිහාන්ගෙ අපාර්ට්මන්ට් එක කොලඹ ප්‍රදන් පෙලෙ හෝටලයකට අයිති නිවාස සංකීර්ණයකට අයිති එකක්.. මාරම ලස්සන වීව් එකක් තිබ්බෙ...

බැල්කනි එකෙන් එලියට පෙනුනෙ මුහුදත් එක්කම කොලඹ නගරය... රෑට ලස්සන නම් කියල වැඩක් නෑ.. ඉතින් මන් ජර්සි එකකුත් ඇදන් ඇවිත් නිහාන්ගෙ ඔඩොක්කුවෙන් වාඩි උනා...

එයාගෙ කරවටේ අත දාලා ඔහේ මුහුද දිහා බලන් හිටියා...

" බේබි.. ඔයාගේ ඩ්‍රීම් වෙඩින් එක කරමු අපි ... මාත් ඒකට කැමති..." නිහාන් මගේ කම්මුලකට කිස් එකක් දෙන ගමන් කිව්වා..

" හරි එහෙනම්.. අපි Engagement එක ඒ විදිහට කරල.. වෙඩින් එක ට්‍රැඩිශනල් විදිහට කරමු... "

" හ්ම්.. බේබි එවාට කලින් අපි මීඩියා වලට ස්ටේට්මන්ට් එකක් දෙන්නත් ඔනෙ.. "

" යා ට්විටර් වල දමු.. "

ඉතින් එදා රෑ ගොඩක් වෙලා අපි කතා කර හිටියා ..

මට කොහොමහරි එතනම නින්ද ගිහින් තිබ්බ නිසා නිහාන් මාව ඇදෙන් ගෙන්නල්ලා තියලා..

" Good morning babe " නිහාන් මට කිස් එකක් දීලා නැගිට්ටිව්වා..

" Good morning darling... අද මොනවද ඔයාගෙ ප්ලෑන්ස් " එයා ගෙනාව කොෆි මග් එකෙන් උගුරක් බොන ගමන් මන් ඇහුවා...

" මට අද බිස්නස් වැඩ වයක් තියෙනවා outbof colombo.. අයේ අර ස්ටෙට්මන්ට් එක පබ්ලිශ් කරන්නත් ඔනෙ.. මන් අපි දෙන්නටම එකක් හැදුවා.. ඔයා කියවලා බලලා මට කියන්නකො.."

" ඔකේ.. මම නම් අද ෆ්‍රී... ඔයා ගියාම ටිකක් නිදගෙන ගෙදර යන්නම් මන්.. "

" නෑ.. ඔයා යන් මාත් එක්ක අපේ ඔෆිස් එකට... අරක පබ්ලිශ් කරලා ඉවර වෙලා..."

ඉතින් අපි දෙන්නගෙ සම්බන්ධය වගේම විවාහ වෙන්න බලාප්‍රොත්තුවෙන් ඉන්න එක ගැන මන් මගෙ නිල ට්විටර් පිටුවෙ මෙහෙම පල කලා..

" හායි මන් කියාරා...

මන් අද මේ පොස්ට් එක දන්නෙ මගේ ජීවිතේ වැදගත් දෙයක් බෙදාගන්න... මගේ ජීවිතේ සාර්තකත්වයට ලොකු දායකත්වයක් දුන්න , මගේ දුකෙදි සැපේදි මගෙ ලගින් හිටිය මගේ හයියට මාත් එක්කම ඉන්න , මගේ දීර්ඝකාලීන පෙම්වතා සමග මන් විවාහ වීමට බලාපොරොත්තුවෙන් ඉන්නවා.. " He proposed and I said Yes " ඉතින් මන් හිතනවා මගේ ඉදිරි ජීවිතේට ඔයලා සුභ පතාවි කියල... "

එවාගෙම මන් එයා මට ඊයෙ දුන්න මුද්ද දාගෙන අපි අත් අල්ලන් ඉන්න , අත් විතරක් පේන ලස්සන ෆොටෝ එකකුත් අප්ලෝඩ් කරා.

ඊට පස්සෙ ඔෆිස් යන්න ගැලපෙන ඇඳුමකුත් ඇඳලා මන් නිහාන්ගෙ ඔෆිස් එකට යන්න මන් ලෑස්ති උනා..

උදේ 10ට විතර තමා අපි ගියේ.. උදේ කෑමත් නිහාන් හදලා තිබ්බා...

නිහාන්ගෙ ඔෆිස් එකෙ අය මන් එන විත්තියක් දන්නෙ නෑ.. මන් නිහාන් එක්කම කාර් එකෙන් බැස්සෙ එයා දොර ඇරියට පස්සෙ...

නිහාන් මගේ අතකිනුත් අල්ලන් තට්ටු 16ක් සමන්විත එයාගෙ ඔෆිස් බිල්ඩින් එක ඇතුලට ආවා..

Reception එක පහු කරන් අපි ආවෙ නිහාන් විතරක් පාවිච්චි කරන ලිෆ්ට් එකට.. ඒ එද්දි ගොඩක් අය අපි දිහා හොරෙන් බලනවා මන් දැක්කා..

නිහාන් ගොඩාක් ආදරණීයයි.. එ වගේම හරිම කෙයාරින්.. එ උනාට එයා ඔෆිස් එකෙ බොස් විදිහට ටිකක් ටෆ්.. එයා ඔෆිස් එකෙදි නම් හිනාවෙනවා ගොඩාක් අඩුයි...

ඉතින් 10 .30 ට මිටින් එකක් ලැස්ති කරල තිබ්බා.. ඒකට යන්න කලින් අපි එයාගෙ ඔෆිස් රූම් එකට ගියා..

ඔෆිස් රූම් එක ලක්සරි විදිහට හදලා තිබ්බෙ කලු , අලු කියන පාටවල් විතරක් පාවිච්චි කරලා..

"බේබි.. මන් ඔයාව introduce කරන්නයි මිටින් එක ලැස්ති කලේ.. " නිහාන් මන් ලගට ඇවිත් කීවා...

# 39 කොටස

" Good Morning ... අද මන් මිටින් එකක් කෝල් කලේ ඔයාලට පොඩි දෙයක් කියන්න... අද ඉදන් අපෙ ඩිරෙක්ට බෝඩ් එකට අලුතෙන් කෙනෙක් එකතු වෙනවා..."

Please welcome Miss Kiyara winaavi wijenakayaka ( මෙන්න පිලිගන්න කියාරා වීනාවි විජේනායක මෙනවිය)

ඒ වගේම මගේ ෆියොන්සෙ, සහ අනාගත බිරිද ... "

නිහාන් ලොකු විස්තරයක් කීවම මන් මීටින් රූම් එකට ආවා...

" Good morning ඔයාලා හැමොටම... නිහාන්.. I don not expect this much ... කොහොම උනත් මන් හිතනවා මට ෆයිනැන්ස් පැත්ත බලන්න මෙ හැමෝම උදව් කරයි කියල... ඉස්සරහට යාරා කම්පැනි එක සහ සිංහවංශ ගෘප් එකත් එකක කම්බයින් වෙලා ගොඩක් වැඩ කරන්න
බලාපොරොත්තු වෙනවා .. "

එතන හිටිය අය හැමෝම මට සුභ පැතුවා... ඊට පස්සෙ අපි ෆැක්ට්‍රි විසිට් එකක් ගියා ... එතකොට නම් කම්පැනි එකෙ කෙල්ලො මන් දිහා අමුතු විදිහට බලනවා මන් දැක්කා...

ඔක්කොම ඉවර වෙලා අපි ආයෙම නිහාන්ගෙ ඔෆිස් එකට ගියා...

" බේබි අපි ලන්ච් වලට එලියට යනවද නැත්නම් ඔර්ඩර් කරනවද " මන් විදුරුවෙන් එලිය බලන් ඉද්දි නොහාන් පිටිපස්සෙන් මාව බදාගෙන ඇහුවා...

" මෙ නිහාන්... අපෙ රෙස්ටොරන්ට් එකෙ අලුත් ඩිශ් එකක් දානවා අද , අපි ඒක ට්‍රයි කරමුද...?? "

මන් ඇහුවෙ නිහාන්ගෙ පැත්තට හැරිලා එයාගෙ කරවටේ මගෙ අත් දෙක දාගන්න ගමන්...

එයා ඒකට උත්තරයක් දුන්නෙ නම්.නෑ.. ඒ උනාට කිස් එකක් නම් දුන්නා..

අපි රෙස්ටොරන්ට් එකට යන්න පිටත් උනාට පස්සෙ මගෙ PA ගෙන් කෝල් එකක් ආවා...

මටයි නිහාන්ටයි ලංකාවෙ ප්‍රමුඛ පෙලෙ රූපවාහිනී නාලිකාවකින් වැඩසටහනකට ආරාධනා කරල ඒකට අපිට ලේසි දවසක් කියන්න කියල...

මමවත් නිහාන්වත් ටිවි එකට මූණ දෙන්න ලොකු කැමැත්තක් නැති නිසා විශේෂයෙන් ලංකාවෙ ටිවි චැනල් ගැන අපිට පැහැදීමකුත් නැති නිසා ඒ ආරාධනාව අපි ප්‍රතික්ෂේප කරා....

ඔහොම සතියක් විතර ගෙවිලා ගියා.... දැන් අපිට වෙඩින් එකට ලෑස්ති වෙන්නයි තිබ්බෙ.. වෙඩින් කිව්වට එන්ගෙජ්මන්ට් එකට...

මට ඔනෙ උනේ outdoor වෙඩින් එකක්... ඒකට සුදුසුම තැන විදිහට අපි තෝරගත්තෙ බෙල්වුඩ් කියන පැත්ත...

එන්ගේජ්මන්ට් එක පොඩියට ගන්න හිතුවත් අපේ බිස්නස් පාර්ට්නර්ස්ලා , පොලිටිට්ෂියන්ලා ඔක්කොටම කියන්න ඔනෙ නිසා අපි ලොකුවට ඒක කරන්න හිතුවා...

වෙඩින් එකක් නම් ඔනෙ නෑ කියන තැන මන් හිටියෙ එන්ගෙජ්මන්ට් එක ගත්තට පස්සෙ , ඒ උනාට නිහාන් කිව්වා අපිට උඩරට මුල් ඇඳුම ඇඳලත් ෆොටෝ එකක් ඔනෙ නිසා ගමු කියල.....

එන්ගේජ්මන්ට් එකට නම් ලෝකෙ ප්‍රසිද්දම සන්නාමයකින් මටම කියල හදපු ඇඳුමක් ඒ කියන්නෙ ඩිසයිනර් වෙයාර් එකක් අඳින්න මට ඔනෙ උනා...

ඇත්තටම කීවොත් මට ඔනේ උනේ බ්‍රෑන්ඩඩ් වෙඩින් එකක්....

## අවසාන කොටස

ඉතින් ඔක්කොම ප්‍රශ්න ඉවර වෙලා අපි එන්ගෙජ් වෙන දවස අද ....

මන් ඇන්දේ සුදු පාට දිග ගවුමක්... ඒකටම හරියන සුදු යි ඔෆ් වයිට් වගේ පාටක් තියෙන මල් පොකුරක් තමා මන් අල්ලන් හිටියෙ...

Outdoor වෙඩින් එකක් උනාට, ඒ ලගම තිබ්බ five star හොටෙල් එකක් අපි අපෙ අමුත්තන්ට ලෑස්ති කරල තිබ්බා...

මගේ ඇඳුම නිහාන් දැකල තිබ්බෙ නෑ.. ඒ උනාට ඒකට

ඔනෙ කරන ඔක්කොම ජුවලරි ටික එයා එවලා තිබ්බා... පොඩි දියමන්ති කරාබු දෙකක්.. ටියාරා එකක් වගේම වලල්ලකුත්...

එතකොට නිහාන්ගෙ ඇඳුමට මැච් වෙන රොලෙක්ස් අත් ඔරලෝසුව , ටයි පින් එක වගේ දේවල් එයාට ගිෆ්ට් කලේ මන්...

එයාගෙ ඇඳුමත් මන් දැකල තිබ්බෙ නැ.. එවා පාට මැච් කරල අපිට ගැලපෙන විදිහට හැදුවෙ ප්‍රසිද්ද ඇඳුම් නිර්මාණ ශිල්පියෙක්...

අමුත්තො 200කට වඩා හිටියා කොහොම හරි ...

මාව හැඩගන්නවන්න බියුටීශියන්ව ගෙන්නලා දුන්නෙ ජනාධිපති ආයීව.. එයා ලොකේම පිළිගත් සැලොන් චේන් එකක අයිතිකාරියක්.. මන් වෙනුවෙන්ම ලංකාවට ඇවිල්ලා හිටියේ...

මන් හිතුවටත් වඩා වටින කියන ගිෆ්ට් ගොඩක් වෙඩින් එකට කලින්ම හම්බෙලා තිබ්බා..

ප්‍රසිඩන්ට්ට වෙන රටක සමුලුවක් නිසා එයාගෙ තැග්ග උන ජගුවර් කාර් එක මට ඊයේ එවල තිබ්බා ලොකුම ලොකු විශ් එකක් එක්ක...

කොහොම හරි මන් ලැස්ති උනාට පස්සෙ කණ්නාඩිය ලගට ගියා..

" Wow.. " මාව දැකලා මටම කියවුනා.. මන් හිතුවටත් වැඩිය ලස්සනට මන් හිටියා...

අපේ ෆස්ට් ලුක් එක තිබ්බෙ ලස්සන වැවක් කිට්ටුව... එතන මාරම ලස්සනයි...

මාව දැකපු අපේ අම්මා නම් ඇඩුවා සැහෙන්න.. තාත්තාගෙත් ඇස් වල කඳුලු තිබ්බා.. මල්ලිත් හොරෙන් අඩනවා මන් දැක්කා..

මන් ලැස්ති වෙලා වැව ලගට යද්දි , මට පිටුපාලා නිහාන් ඉන්නවා මන් දැක්කා... මන් ලගට යන්න කලින් එයා හැරුනා.. මන් ඉතින් බිම බලන් එයා ලගට ගියා...

එයා ඇස් වල කඳුලු පුරවන් මන් දිහා බලන් හිටියෙ...

" babe " මන් කියල ඉවර කරන්නත් කලින් එයා මට කිස් එකක් දිලා මගෙ කම්මුල් වලින් අල්ලගත්තා... එයාගෙ ඇස් දිලිසෙනවා...

" ඔයා මාරම ලස්සනයි අද.. " එයා මාව බදාගෙනම කිව්වා..

එතකොට නිහාන්.. එයා වෙනදට වඩා වෙනස් .. හරිම ලස්සනයි , එ වගේම හැන්ඩ්සම්.. මගේ කටට වචන එන්නෙත් නැ ඒ තරම් එයා ලස්සනයි....

" ඔයා වගේ කෙනෙක් මගෙ වයිෆ් වෙන එක ගැන මට ආඩම්බරයි...එ වගේම සතුටුයි "

ඇත්තටම කෙල්ලෙක්ට ඊට වඩා දෙයක් තියෙනවද....

අපි දෙන්නගෙ අදහස් හොඳට ගැලපෙනවා කියල අපි තේරුම් අරන් හිටියෙ.. 100% ක්ම නෙවෙ.. හැබැයි.. අපි අතර නොගැලපීම් තිබ්බා.. ඒ උනාට එවාට අපිට හැඩගැහෙන්න පුලුවන් උනා...

කොහොම හරි අපි දෙන්නා මුදු මාරු කරා..

මට ඔනේ වෙලා තිබ්බෙම ඩයමන්ඩ් රින්ග් එකක් .. එක නිසාම නිහාන් මට පැලදුවෙ සුදු ඩයමන්ඩ් රින්ග් එකක්... ඒකෙ ඇතුල් පැත්තේ අපි දෙන්නගෙ නමේ මුල් අකුරු එක්ක , අද දිනෙත් ගහල තිබ්බා...

මගේ ඩ්‍රීම් එක විදිහටම වෙඩින් එක ගන්න මට පුලුවන් උනා...

නිහාන්ගෙ අම්මා මට තෑග්ගක් විදිහට එයාලගෙ පරම්පරාවෙන් එන රත්තරන් ආබරණ සෙට් එකක් දුන්නා.. එවා හරිම ලස්ස්නයි.. පරණයි කියල කියන්නවත් බෑ..

නිහාන් මට දුන්නෙ ස්විස්ටලන්ඩ් වල තියෙන ලස්සනම ලස්සන ගෙයක්.. ඒක ලක්සරි ගණයට අයිති ගෙයක් නෙවෙ.. හරිම නිස්කලංක , සුවපහසු ගෙයක්..

අපේ බිසී ලයිෆ් එකට විරාමයක් ඔනේ කියල හිතුනම හැම වෙලෙම යන්න හිතෙන තැනක් තමා ඒක...

කොහොම හරි ගිෆ්ට් විදිහට කාර් 8 කට වඩා අපිට හම්බුනා...

අපේ කම්පැනි දෙක එකතු වෙලා හදන බිල්ඩින් එකෙත් වැඩ ඒ වෙද්දි ඉවර වෙලා තිබ්බ නිසා අපි හිතුවෙ ඒක පදිංචියට යන්න.. එකෙ penthouse එකෙ වාහන 50ක වෙනම පාර්කින් එරියා එකක් තිබ්බ නිසා අවුලක් උනෙ නෑ..

ඉතින් අපි වෙඩින් එකෙ පාර්ට් එක ඉවර වෙලා ලෑස්ති උනේ හනිමූන් ට්‍රිප් එක යන්න.. ඒකට ට්‍රිප් එකක් කීවෙ සති 3ක් රටවල් 6 ක් වගේ ඇතුලත් වෙලා තිබ්බ නිසා..

මුලින්ම අපි යන්නෙ බාලි වලට ඒක නිසා අපි යන්නෙ අපෙ ජෙට් එකෙ... ඉතින් හනිමූන් එක ගැන නම් ඔයාලට ලියන්නෙ නෑ මන්...

*********************************************

කතාව ලියපු මන් , මගේ ඩයිරිය වහලා තිබ්බා...
ඔව් ඒක මගේ හිතේ ඇඳුන කතාවක්.. මේ කියාරා නිකන් සාමන්‍ය කෙල්ලෙක්.. කැම්පස් එකෙ ෆයිනල් ඉයර් එකෙ ඉන්න...

මගේ ජීවිතේ වෙන්න ඔනේ කියල හිතන දේවල් මන් ඉතින් පොතක ලීවා..

බලමු කියාරා.. දවසක ඔයා බ්‍රෑන්ඩ් එකක් වෙයි...

නිමි.....